# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## 10 වන ශ්‍රේණිය



ආගම්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඉස්ලාම්

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
10 ශ්‍රේණිය - 2007©

ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රථම මුද්‍රණය

ආගම්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය :
*මුද්‍රණාලය*
*ජාතික අධ්‍යාපන ආයතනයේ මුද්‍රණාලය*
*මහරගම*

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

# පටුන


පිටුව

අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය iii

හැඳින්වීම iv

පෙරවදන v

ලේඛක මණ්ඩලය vii

විෂය නිර්දේශය 01

10.1 හැඳින්වීම 03

10.2 විෂය අරමුණු 04

10.3 පන්තියට අදාළ නිපුණතා 05

නිපුණතා 06

නිපුණතා මට්ටම්

සන්ධාරය

10.4 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය 09

ක්‍රියාකාරකම් සන්තතිය 12

10.5 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය 13

10.6 ගුණාත්මක යෙදවුම් 16

10.7 ක්‍රියාකාරකම් සන්තතිය 17

10.8 තක්සේරු හා ඇගයීම් 130

6.12 තක්සේරු ඇගයීම් විස්තර 131

6.13 ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ 133


Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

නව සහශ්‍රයේදී සිදුකළ පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ පවතින යම් යම් ගැටලු නිරාකරණය කරගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකිය. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ හා, සමාජීය හා පුද්ගල දුර්වලතා මඟහරවා ගැනීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේදී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේය. නමුදු වර්තමානයේදී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියේ සිටියි. මෙම පසුබෑමට හේතුව කිසිදු නව දැක්මකින් තොරව පවතින දෙය මත පමණක්ම තීරණ ගනිමින් ඒ දේ පමණක්ම නැවත නැවත ඉදිරිපත් කිරීමේ හේතුවෙනි.

මෙම තත්ත්වය මඟහරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතුව විෂයමාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂයමාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනටම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණත් මගින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ කුසලතා හා නිපුණතා වැඩි වර්ධනය කර ගැනීමට හැකිවන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ගුරුවරයාගේ කාර්යභාරයේ පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතුවේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුනට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත්සේ උපකාරී වනු ඇතැයි යනු අපගේ පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මඟපෙන්වීම පිළිපැදීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමේදී මෙන්ම ශිෂ්‍යයන් ඇගයීමේදී ද උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙසම එය විදුහල්පතිවරුනට කාල සටහන් පිළියෙල කිරීමේදීත්, සීමිත සම්පත් වෙන්කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේදීත් මහත් ලෙස උපකාරී වනු නොඅනුමානය.

කෙසේ නමුදු අපගේ බලාපොරොත්තුව වන්නේ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් තම නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින්ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීමය. මක්නිසාදයත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයින්ට, ගුරු උපදේශකවරුනට, හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරී වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගී වූ සියලු දෙනාට ම මගේ කෘතඥතාවය පිළිගන්වමි.

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතු ය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ මෙම විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා අතින් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බවින් ඔබ්බට ගිය, ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශ භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

මෙහි හමුවන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය කොටසේ දී නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්තිකාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ තම යහළු යෙහෙලියන්ට තමා දන්නා දේ කියාදීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මකව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිත කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරැදි කොට සංවිධානාත්මකව හා අංග සම්පූර්ණව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වූවකු විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරන තත්ත්වයකට ය. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය සිසුන්ට බෙහෙවින් ආකර්ශනීය වනු ඇත.

මේ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මඟ පෙන්වීමක් බව සිතන්න. මේ ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස බොහෝ නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

මෙම නව පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විටම සිසුන් ක්‍රියාකාරී ය. එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තවද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිටම එම දුෂ්කරතා ඉවත්කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදව් කිරීමට යොමු කරන්න. මෙසේ පාඩමත් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් හොඳ ඉගෙනුමකට හේතු වේ.

තවද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තව දුරටත් ශක්තිමත් කිරීමට සමත්වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එය සිසුන් ඇගයීම කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරීම ගැනද සැලකිලිමත් වන්න.

මෙමඟින් නව ලොවට උචිත නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම, එයටම ගැළපෙන ගුරු භූමිකාවක් හා පන්තිකාමරයේ නව ඉගෙනුම් සංස්කෘතියක් බිහිවීම අපේක්ෂා කරමි.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(ආගම්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

# පෙරවදන

ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට පහත සඳහන් ප්‍රධාන කොටස් ඇතුළත් ය. ඒවා :

- විස්තරාත්මක විෂය නිර්දේශය
- ක්‍රියාකාරකම් සන්තතිය
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් විස්තීරණය කිරීමේ උපකරණ

ඉස්ලාම් ඉගෙනීමෙන් ලබා ගත යුතු යැයි බලාපොරොත්තු වන නිපුණතා ලඟා කරගනු වස් අල්ලාහ් කෙරේ විශ්වාසය තැබීම, ඉබාදතයන්හි යෙදීම, ආගමික විනය, නබිතුමන්ගේ ෂීරාව, හරයයන්, දර්ශන, ආගමික හා සමාජ චාරිත්‍රවාරිත්‍ර සාහිත්‍ය සංස්කෘතිය ක්‍රියාකාරී අත්දැකීම් ආදිය පදනමින් නිපුණතා හා නිපුණතා මට්ටම් ඇතුළත් විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

සිසුන් විසින් සංවර්ධනය කර ගත යුතු නිපුණතා මට්ටම් සම්බන්ධ විෂය සන්ධාරය මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් වීම මෙහි සුවිශේෂී ලක්ෂණය වන්නේය. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්වලට උදව්වන ද්‍රව්‍ය/ගුණාත්මක යෙදවීම් සඳහන් වන නිසා කල් ඇතිවම මේවා ලබාගෙන සූදානම් කර තබා ගැනීමට අවස්ථාව ලැබේ.

විෂය නිර්දේශය මගින් බලාපොරොත්තුවන ප්‍රතිඵල සහතික කර ගැනීම සඳහා වටිනා යෝජනා රැසක් තක්සේරුව හා ඇගයීම යන කොටසේ අන්තර්ගතය. පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් යන කොටස පාසල් අධ්‍යාපනයට සම්බන්ධ සියල්ලන්ම කියවා වටහා ගැනීම අවශ්‍යය. ගුරුවරුන්ට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් බාර දෙන විටත් ගුරු කාර්යයන් අධීක්ෂණය කරන විටත්, අවශ්‍ය පරිදි කාලය වෙන් කර ගැනීමටත් පාසල් කළමනාකරුවන්ට මෙය අවශ්‍ය පහදාදීම් ලබා දෙන්නේය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන කොටසේ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත ක්‍රියාකාරකම් සන්තතිය හඳුන්වා දී ඇත. මේවා සියල්ල ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ යුතු යැයි බලාපොරොත්තු නොවේ. සිය නිර්මාණාත්මක හැකියා හා විචාරාත්මක චින්තන හැකියා අනුව ක්‍රියාකාරකම් සුදුසු පරිදි සකස් කර ගනු ඇතැයි ගුරුවරයාගෙන් බලාපොරොත්තු වේ. උදාහරණයක් ලෙස කණ්ඩායම් හතරක් සකස් කරගන්නා ලෙස උපදෙස් දී තිබුණ ද පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව ගැන සලකා එය වෙනස් කර ගත හැකිය. කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට අවස්ථාව සලස්වන ආකාරයෙන් අවශ්‍ය තීරණ ගැනීමේ දී ගුරුවරයා අවස්ථානුකූලව ක්‍රියා කළ යුතුය. අදාළ නිපුණතා මට්ටම සපිරෙන සේ ක්‍රියාකාරකම්වලට අවශ්‍ය පමණ කාලය වෙන් කර ඇත. මිනිත්තු 40 ක කාල පරිච්ඡේද ඉක්මවා යාමට සිදුවිය හැකිය. එක් එක් නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පමණ කාලයක් ඒ ඒ ක්‍රියාකාරකම්වලට ලබා දී ඇත. ඒ සමග කාල සටහනේ ලබා දී ඇති තනි කාල පරිච්ඡේද, ද්විත්ව කාලපරිච්ඡේදවලට ගැළපෙන අයුරින් මෙම ක්‍රියාකාරකම් කොටස් කරගත යුතු යැයි ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වේ. පෙර දින ආරම්භ කළ ක්‍රියාකාරකමක් පසු දින දිගටම කර ගෙන යන්නේ නම් පළමු දින ඉගැන්වූ කරුණු නැවත මතක් කර ගත හැකි වේ. මෙය ඔබ ගෙන් බලාපොරොත්තු වන්නකි.

කිසියම් නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීම සඳහා වෙන් වෙන් වූ ක්‍රියාකාරකම් සකස් කර ගත යුතු වේ. එහෙයින් කිසියම් යෝජිත ක්‍රියාකාරකමක් ඒ අයුරින් ම ක්‍රියාත්මක කළ යුතු යැයි කිසි

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

විටෙකත් ඔබගෙන් බලාපොරොත්තු වන්නේ නැත. ඉතා හොඳ ප්‍රවේශ හැකියා ඇති ගවේෂණ සහිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විස්තීරණ කළ හැකි විවිධ උපකරණ යොදා ගෙන ඉතා හොඳ ඉගැන්වීමක් ඔබෙන් බලාපොරොත්තුවේ. අළුත් කරුණු හඳුන්වා දෙන විට ඔබගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය සංවර්ධනය කරන අයුරින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ තුන්වන කොටසේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය කිරීමට උදව් වන උපකරණ පද්ධති ඇතුළත් ය. ක්‍රියාකාරකම් පද්ධතියක් කේන්ද්‍ර කොට ලබාදෙන මෙම උපකරණ පන්ති කාමරයට පිටතින් ද සිසුන් අඛණ්ඩව ඉගෙන ගැනීමට උදව් වන්නේය. මෙම උපකරණ යොදා ගෙන සිසුන්ගේ ඉගෙනුම පරීක්ෂා කොට අදාළ ප්‍රතිපෝෂණ ලබාදීම ඔබගේ කාර්යභාරය වන්නේ ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වයට ඇගයීම් ක්‍රමවල ප්‍රබල වෙනස්කම් අවශ්‍ය වන්නේය. සිසුන්ගේ සිතීමේ හැකියා, සමාජ කුසලතා, පෞද්ගලික කුසලතා ආදිය සංවර්ධනය කරන අයුරින් ඉගැන්වීමේ යෙදෙනවා ඇතැයි යන්න අපගේ විශ්වාසයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| මෙහෙයවීම | : | මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| උපදේශනය හා මඟ පෙන්වීම | : | විමල් සියඹලාගොඩ<br>සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ආගම්, භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය.<br><br>යූ. නවරත්නම්<br>අධ්‍යක්ෂ ආගම්<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| ලේඛක මණ්ඩලය | : | එම්.එච්.එම්. නාලිර්<br>එස්.එම්.ආර්. සූදින්<br>මව්ලවි එම්.එල්.එම්. යූසුෆ්<br>අෂ්ෂේක් එම්. නවාස් සනූර්දීන්<br>අෂ්ෂේක් යූ.කේ. රමීස්<br>අෂ්ෂේක් එම්.ආර්.එම්. මිහ්ලාර්<br>අෂ්ෂේක් එම්.එච්.එම්. බුහාරි |
| සංස්කරණය | : | එම්.එච්.එම්. බුහාරි<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී (ඉස්ලාම්)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| පරිවර්තනය | : | එස්.ඒ.සී.එම්. කරාමත්<br>එම්.එච්.එම්.යාකූත්<br>එම්.එෆ්.නල්රී |
| පරිගණක | : | |

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 10. 8 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්‍ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (TRANSMISSION ROLE) හා පසු කාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANSACTION ROLE) වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත්, එය සිදුවිය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු - සිසු අන්තර් ක්‍රියා ද පසු ව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (RESOURCE PERSON) තත්ත්වයට ගුරුවරයා පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්‍ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (TRANSFORMATION ROLE) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමු වන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGEMENT STEP) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට පරිවර්තනය වි හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම/පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (FLASH CARDS) වැනි උත්තේජක යොදා ගැනීම/ ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය/දෙබස්, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන (DEMONSTRATIONS) සෘජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (EXPLORATION) සඳහා සිසුනට අවස්ථාව ලබා දීමටය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරතවීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර, සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුනු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ 3 වන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායකය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (EXPLANATION) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයාගැනීම වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වනසේත්, සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරැදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ 2 පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESSMENT) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (EVALUATION) ගුරුවරයාට ඉඩ තිබේ. තක්සේරුව හා ඇගයීම පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 10. 9 ගුණාත්මක යෙදවුම්

- රූප (මක්කම, මදීනාව)
- පෝස්ටර්
- කුර්ආන් පාඨ ලියූ කාඩ්පත්
- අත් පත්‍රිකා
- පුවත් පත් උපුටන
- කැසට් යන්ත්‍ර
- කැසට් පටි/හඬ පටි/හඬ තැටි
- කසීදා පටිගත කළ කැසට් පටි
- පෙල්ට් පෑන්
- ඩිමයි කඩදාසි
- බ්‍රිස්ටල් බෝඩ්
- සුදු ලියන කඩදාසි
- මුසල්ලා
- මුස්හෆ්
- තර්ජුමතුල් කුර්ආන්
- නාට්‍ය පිටපත්
- රියාලුස් සාලිහීන්

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1 : ඒකත්වය, වක්තෘත්වය, අවසාන දිනය යනාදිය විශ්වාස කර ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 1.1 : ඉස්ලාමීය අකීදා පිළිබඳ පැහැදිලි අවබෝධය ලබා ඒ අනුව කටයුතු කරයි.

ක්‍රියාකාරකම 1.1 : ඉස්ලාමීය අකීදා අවබෝධ කොට ක්‍රියා කරමු.

කාලය : විනාඩි 120

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.1.1 තොරතුරු පත්‍රිකාව
- ඇමුණුම 1.1.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.1 :
- ඇමුණුම 1.1.1 ඇති තොරතුරු පත්‍රිකාව සිසුන්ට අවබෝධ වන අයුරින් කීප වතාවක් කියවන්න.
- අහ්ලුස්සුන්නා වල් ජමාආ යනු කුමක්දැයි පවසන්න.
- වැරදි හෝ නිවැරදි ප්‍රතිපත්ති පිළිබඳ ශිෂ්‍ය අත්දැකීම් මතු කිරීමට අවස්ථාව දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ඊමාන් සම්බන්ධ කරුණුවල අන්තර්ගතය අකීදා වන බව.
> - ඉස්ලාමීය අකීදාවේ අංග පරිකල්පනයෙන් නොව වහී මගින් ලබාගත් කරුණු බව.
> - නිවැරදි අකීදාව පිළිපදින්නන් අහ්ලුස්සුන්නා වල් ජමාආ ලෙස අමතන බව.
> - වෙනත් සංස්කෘතික බලපෑමට ලක්වූ පුද්ගලයන් විසින් පසු කාලයේ දී වැරදි අකීදා කොටස් බිහිවූ බව.

පියවර 1.1.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ගවේෂණ පත්‍රිකාව පිටපත් කොට සෑම කණ්ඩායමකට ම සපයන්න.
- සෑම කණ්ඩායමකට ම අවශ්‍ය වන පෑන්, කොළ යනාදිය සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට මග පෙන්වන්න.

පියවර 1.1.3 :
- කණ්ඩායම් වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රථමයෙන් වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - අකීදා යනු ඊමානය හා සම්බන්ධ කරුණු විස්තර කරන කලාවක් බව.
> - අකීදාව ඉලාහියියාත්, නුබුව්වාත්, රූහානියියාත්, සම්ඉයියාත් යන කරුණු හතර අන්තර්ගත වූවක් බව.
> - ඉස්ලාමීය අකීදාවේ සියළු අංග පරිකල්පනයෙන් නොව වහී මගින් ලබාගත් බව.
> - පසු කාලයේ, විවිධ සංස්කෘතික හා චින්තනවල බලපෑමට ලක් වූ පුද්ගලයින් ඔවුන්ගේ දැනුම පදනම් කොට ගෙන අකීදාවේ කරුණු විස්තර කිරීමට පෙළඹුනු බව.
> - මේ යුගයේ සහාභාවරුන්, සලෆුස්සාලිහීන්වරුන් පිළිපැදි පිවිතුරු ඉස්ලාමීය අකීදාව වන අහ්ලුස්සුන්නා වල් ජමාආ මූලධර්මය ආරක්ෂා කොට අනෙකුත් චින්තන හා සංස්කෘතික බලපෑම්වලට එරෙහි වන විද්වතුන් බිහිවූ බව.
> - අහ්ලුස්සුන්නා වල් ජමාආ වේ ප්‍රතිපත්ති රැකගත් ඉස්ලාමීය වියතුන් ලෙස ඉමාම්වරුන් වන අහ්මද් ඉබ්නු හන්බල්, ඉබ්නු තෛමියියා, ඉබ්නුල් කයියුම්, අබුල්හසන් අෂ්අරි, අබූ ජඋෆර් අත්තහාවි යන අය සඳහන් කළ යුතු අය බව.
> - කද්රියා, ජබරියියා, මුර්ජිආ, මු'තසිලා යනාදිය වැරදි මග ගිය අකීදා කොටස් බව.
> - අප අහ්ලුස්සුන්නා වල් ජමා ආ වේ අකීදා පිළිපැදීම මගින් දෙලොවේ ම ජයග්‍රහණ ලබාගත හැකි බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක
:
- අහ්ලුස්සුන්නා වල් ජමා ආ වේ මූලධර්ම දැන පිළිගනියි.
- වැරදි අකීදාව හා නිවැරදි අකීදාව හඳුනා ගනියි.
- අහ්ලුස්සුන්නා වල් ජමාආ වේ අකීදාව පිළිපැදිය යුතුය යන ආකල්පය ලබා ගනියි.
- තම ක්‍රියාකාරකම් නිවැරදි අකීදාවට අනුකූල ව පවත්වා ගැනීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.

ඇමුණුම 1.1.1

තොරතුරු පත්‍රිකාව

ඉබ්‍රාහිම් (අලෛ) තුමාගේ උම්මත්වරු අල්ලාහ් පිළිබඳව අනවබෝධ ව වාද කළ අවස්ථාවේ

එතුමා සමඟ එතුමාගේ ජනයා වාද කළ අවස්ථාවේ දී එතුමා මෙසේ කීවේ ය: "ඔබ මා සමඟ වාද කරන්නේ අල්ලාහ් ගැන ද? ඔහු මට ඍජු මාර්ගය පෙන්වා දී ඇත." (6:80)

"එසේම අහසේ හා පොළොවේ (අපගේ) පාලනය ඉබ්‍රාහීම් (අලෛ) ට අපි පෙන්වූයෙමු. ඔහු අධිෂ්ඨානශීලී පුද්ගලයෙකු බවට පත්වීමට (මෙසේ අපි කළෙමු)" 6. 75

අල්ලාහ් පිළිබඳ පැහැදිලි අවබෝධය වහී මගින් නබිවරු ලබා ගත්හ. එම නබිවරුන් පිවිතුරු සිතින් පිළිපැදි පුද්ගලයන් තම ඊමානය ශක්තිමත් කර ගත්හ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස් :

- තමාට ලබාදී ඇති කණ්ඩායම් ගවේෂණයෙහි යෙදෙන්න.
- වාර්තාව සකස් කර පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.1.2.

කණ්ඩායම් 1 අකීදාවේ අන්තර්ගතය පිළිබඳ ව සාකච්ඡා කර මිනිත්තු දෙකක දේශනයක් සඳහා ලිපියක් සකස් කරන්න.

කණ්ඩායම් 2 පසු කාලයේ දී විදේශීය සිතුවිලි හා සංස්කෘතීන් ඉස්ලාමීය අකීදාව කෙරේ බලපෑ ආකාරය සාකච්ඡා කර වාර්තාවක් ලෙස සකස් කරන්න.

කණ්ඩායම් 3 අහ්ලුස්සුන්නා වල් ජමාආ ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීමට වෙර දැරූ ඉමාම්වරුන්ගේ නම් ලැයිස්තුගත කර දක්වන්න.

කණ්ඩායම් 4 අහ්ලුස්සුන්නා වල් ජමා ආ ප්‍රතිපත්තිවලට විරුද්ධ ප්‍රතිපත්ති කොටස් හඳුනාගෙන වාර්තාවක් සකස් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : ඒකත්වය, වක්තෘත්වය අවසාන දිනය යනාදිය විශ්වාස කර ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 1.2 : ඊමානයේ බලපෑම් හා ඊමානයට පටහැණි කරුණු මගින් ඇතිවන බලපෑම්හි හඳුනාගෙන කටයුතු කරයි.

ක්‍රියාකාරකම 1.2 : ජීවිතයට ඊමානයේ බලපෑම් වටහා ගනිමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 1.2.1.1 හි ඇති තොරතුරු පත්‍රිකාව
- ඇමුණුම 1.2.1.2 හි ඇති ගවේෂණ පත්‍රිකාව
- ලියන කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.2.1.1 :

- ඇමුණුම 1.2.1.1 හි ඇති තොරතුරු පත්‍රිකාව සිසුන්ට ඇසෙනසේ කියවන්න.
- එය ඊමානය හා සම්බන්ධ කොට සාකච්ඡා කරන්න.
- සිසුන්ගේ අත්දැකීම් මතු කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ඊමාන් ක්‍රියාකාරකම්වලින් නිරූපණය කෙරෙන බව.
> - සෑම මිනිසෙකු ම කුමක් හෝ විශ්වාසයක් මත ක්‍රියා කරන බව.
> - විශ්වාසය මත මුලාවීම වළක්වාලීම සඳහා අල්ලාහ් ඊමානයේ සීමා පැහැදිලි කොට ඇති බව.
> - කිසිවෙකුවත් අපගේ ඊමානීය ප්‍රතිපත්තියේ දුර්වලතා දැකිය නොහැකි බව.

පියවර 1.2.1.2 :

- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- ගවේෂණ පත්‍රිකා, ඩිමයි, කඩදාසි, ෆෙල්ට් පෑන් යනාදිය සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට මග පෙන්වන්න.

පියවර 1.2.1.3 :

- සෑම කණ්ඩායමකට ම තම වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- තම අදහස් ඉදිරිපත් කිරීමටත්, අඩුපාඩු සපුරා ගැනීමටත් අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල යෝජනාවලට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - ඊමාන් යනු සිතින් විශ්වාස කොට මුවින් පවසා ශරීරයෙන් ක්‍රියාත්මක වීම බව.
> - දෙවියන් ඒක බව විශ්වාස කොට ඔහු පිළිබඳ අවබෝධ කොට ඔහුගේ අපේක්ෂාවන් ඉටු කිරීම තව්හිද් වන බව.
> - මිනිසුන් ඍජු මාර්ගයේ යැවීම සඳහා අල්ලාහ් ආගම් හා දූතයන් යැවූ බව විශ්වාස කොට ක්‍රියා කළ යුතු බව.
> - පරලොව ජීවිතයේ සැබෑ බව හා ස්ථිර බව විශ්වාස කොට මෙලොව ජීවිතයේ අරමුණ විය යුත්තේ එය හිමි කර ගැනීම බව.
> - අල්ලාහ්ගේ පූර්ව සැලැස්ම ගැඹුරින් විශ්වාස කොට මෙලොව ඇතිවන දුක් කම්කටොළු ඉවසා දරාගත යුතු බව.
> - අල්ලාහ් හා ඔහුගේ රසූල් නොපැවසූ දෑ විශ්වාස කිරීමේදී භේදභින්නවීම් ඇතිවන බව.
> - එසේම එමගින් ඊමානයේ සැකයන් ඇති වී ඒ තුළින් විවිධ පාප ක්‍රියාවන්ට මං පැදෙන බව.
> - එබැවින් ඊමානයේ පදනම ආරක්ෂා කිරීමට අප අවධානය යොමුකළ යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ඊමානයේ සීමාවන් දැන පවසයි.
- වැරදි විශ්වාසයක් තුළින් ඇති වන අයහපත් දෑ හඳුනාගෙන පවසයි.
- යහපත් ක්‍රියාවන්ට හා බුද්ධිමත් ක්‍රියාවන්ට නිවැරදි ඊමානය හේතුවන බව පවසයි.
- තම සියළු ක්‍රියා පරලොව අරමුණු කොට ගෙන ක්‍රියාත්මක කරයි.
- දැඩි විශ්වාසය නිසා සමාජ ජීවිතය ආදර්ශමත් ලෙස පවත්වා ගනියි.

ඇමුණුම 1.2.1.1

තොරතුරු පත්‍රිකාව

"මා භාරයේ වූ මේ සියළු දෑ අදාළ පුද්ගලයන්ට භාරදී මදීනාවේදී මා හමුවන්න"යැයි නබි(සල්)තුමා පැවසූ ඒ වදන් මත අලි(රළි) තුමා තැබූ අචල විශ්වාසය එම බැරෑරුම් කාර්ය කිරීමට ඔහු පෙළඹවීය.

නබි(සල්)තුමාණන් ඝාතනය කිරීම සඳහා කුරෙයිෂි තරුණයින් එතුමාගේ නිවස වටකර ගත්හ. නබි (සල්)තුමාණෝ අල්ලාහ්ගේ උපකාරයෙන් බේරී ගියහ. මෙය නොදත් කාෆිවර්වරු නිවසට ඇතුළු වී නබි තුමා නිදන ඇඳ නෙක් පැමිණ, නබි(සල්)තුමා නිදන බව සිතා තම අරමුණ ඉටු වූ බවට ආඩම්බර වී එතුමා කැපීමට සූදානම් වූහ.

අහෝ පුදුමයකි. නබි(සල්)තුමාගේ පොරෝනය ඉවත් කරමින් එළියට පැමිණි අලි (රළි) තුමා ඔවුන් සමග සාකච්ඡා කළේය.

නබි(සල්)තුමාගේ වදන් මත තැබූ විශ්වාසය මත අලි (රළි) තුමා ඓතිහාසික යුග පුරුෂයකු ලෙස උසස් කරන ලදී.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබාගෙන එය කෙරෙහි අවධානය යොමු කරන්න.
- සාකච්ඡා කොට වාර්තා සකස් කර එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.2.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1 නොපෙනෙන නමුත් විශ්වාස කිරීමට සුදුසු කරුණු මොනවාදැයි සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 2 මිනිසා අල්ලාහ්ගේ මැවීමක් නොවේ යන වැරදි විශ්වාසය නිසා හටගත් විෂමාචාරයක් හඳුනාගෙන සටහන් කරන්න.

කණ්ඩායම් 3 ස්ථිර වූ ඊමානය සිතේ පිරී ඉතිරී ගිය හේතුවෙන් පරිත්‍යාග කළ සහාබාවරුන්ගෙන් කෙනෙකුගේ ඓතිහාසික සිද්ධියක් සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 4 "ඊමාන්ධාරීන් පරාජය පිළිබඳව පශ්චාත්තාපවීම අනවශ්‍යය" යන අර්ථය දෙන අල්කුර්ආන් වාක්‍ය සොයා සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | ඒකත්වය, වක්තෘත්වය අවසාන දිනය යනාදිය විශ්වාස කර ක්‍රියා කරයි. |
| නිපුණතා මට්ටම 1.2 | : | ඊමානයේ බලපෑම් හා ඊමානයට පටහැණි කරුණු මගින් ඇතිවන බලපෑම්වල හඳුනාගෙන කටයුතු කරයි. |
| ක්‍රියාකාරකම 1.2.1 | : | ඊමානයට පටහැණි අංගවලින් වැළැකී ජීවත් වෙමු |
| කාලය | : | විනාඩි 80 |

ගුණාත්මක යෙදවුම් :

- 1.2.2.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- 1.2.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.2.2.1 :

- ඇමුණුම 1.2.2.1 ට ඇතුළත් දෙබස සිසුන් දෙදෙනෙකු ලවා කියවීමට සලස්වන්න.
- ඊමානයට වින කරන කුෆ්ර්, ෂිර්ක්, රිද්දත් නිෆාක් යන අංග පිළිබඳව සිසුන් දැනගත් කරුණු එළිදැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් කරුණු තහවුරු වනසේ සාකච්ඡා කරන්න.

> - කුෆ්ර්, ෂිර්ක්, රිද්දත්, නිෆාක් යන කරුණු ඊමානයට වින කරන බව.
> - තව්හීදයට වින කරන සියල්ල කුෆ්ර් වන බව.
> - ෂිර්ක් යනු තෞහීදයේ විරුද්ධාර්ථ පදයක් බව.
> - රිද්දත් යනු ආගම් මාරුවක් බව .
> - සිත තුළ යමක් තබාගෙන පිටත අන් දෙයක් පෙන්වීම නිෆාක් වන බව

පියවර 1.2.2 .2 :

- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 1.2.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- ඩිමයි කඩදාසි, පෑන් සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට ෆෙල්ට් මග පෙන්වන්න.

පියවර 1.2.2.3 :

- සෑම කණ්ඩායමකට ම තම වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අඩුපාඩු, දුර්වලතා සකස්කර ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

|  |
|---|
| ● ෂිර්කුල් අක්බර්, ෂිර්කුල් අස්කර් වශයෙන් ෂිර්ක් වර්ග දෙකකට බෙදිය හැකි බව.<br>● නිශ්චය වශයෙන් ම අල්ලාහ් තමාට යමක් සම කිරීමට සමාව නොදෙන බවත්, ඒ හැර අන් සියළු කරුණුවලදී තමා කැමති අයට සමාව දෙන බව.<br>● කුඩා ෂිර්කය මහා ෂිර්කයට වඩා අඩු වූවත් කබාඉර් නම් මහා පාපයට වඩා විශාල වන බව.<br>● කුෆ්ර් සිදුවන මාර්ග තුනක් ඇති බව.<br>● මහා ශිර්ක් කුෆ්ර් ඇති කරන ක්‍රියාවක් කිරීමෙන් රිද්දත් ඇති වන බව.<br>● මුර්තද් මුස්ලිම් සමාජයෙන් නෙරපනු ලබන බව.<br>● සිතේ කුෆ්රය තබාගෙන පිටතින් ඊමාන් තිබෙන සේ රඟපෑම නිෆාක් වන බව.<br>● මුනාෆික්වරුන් නිරයේ පහළ ම තට්ටුවේ සිටින බව. |

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- රිද්දත් ඇතිවන මාර්ග හා එහි අයහපත් බලපෑම දැන පවසයි.
- කුෆ්ර්, ෂිර්ක්, රිද්දත්, නිෆාක් වලින් තමාම වැළකී තම ජීවිතය පවත්වාගෙන යයි.
- ඊමානයට වින කරන අංගවලින් ඉවත්වී කටයුතු කරයි.
- වත්මන් සමාජයේ පැතිරී ඇති ෂිර්කයක් හඳුනාගෙන එහි බලපෑමෙන් මිනිසුන් වළක්වයි.

ඇමුණුම 1.2.2.1

විස්තර පත්‍රිකාව

| | | |
|---|---|---|
| අම්මා | : | මෙච්චර පරක්කු ඇයි ? |
| පුතා | : | අද ජුම්ආ සලාතයෙන් පසුව විශාල රැස්වීමක් කැඳවලා විභාගයක් පැවැත්වූවා අම්මේ |
| අම්මා | : | මොන විභාගයක් ද කළේ ? |
| පුතා | : | අපේ ගමට අලුතින් පැමිණ තිබෙන කෆූර් නානා නැමැති පුද්ගලයා මුර්තද් වුනාලු. |
| අම්මා | : | මුර්තද් කියන්නේ මොකක් ද? ටිකක් විස්තරාත්මක ව කියන්න. |
| පුතා | : | පසුගිය සතියේ අර කෆූර්නානා වෙළඳපොළේ සිටගෙන මෙසේ පැවසුවාලු.<br>“මම සලාතය ඉටු නොකරමි. මට සලාතය අනිවාර්ය නැත.<br>මම සවුම් රකින්නේ නැත. එය මට අනිවාර්ය නොවේ.<br>මේ ලෝකය දෙවියන් මැව්වේ නැත. එය ස්වාභාවික ව ම බිහිවිය.”<br>මෙසේ කතා කරමින් සිටියාලු. එය තමයි විභාග කළේ. |
| අම්මා | : | පසුව කුමක් සිදුවුණා ද ? |

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

පුතා : කඵුර්නානාට කතා කර පරීක්ෂණය කළා. පසුව හස්රත් මෙසේ පැවසුවාය. මේ අයුරින් ඊමානයේ කරුණු ප්‍රතික්ෂේප කොට කතා කිරීමෙන් රිද්දත් ඇතිවේ. ඒනිසා ඔබ මුර්තද් කෙනෙකු බවට පත්වුණා. ඔබ නැවතත් කලිමාව පවසා ඊමාන්ධාරී වී තව්බා කළ යුතුය. නොඑසේ නම් ඔබේ පවුලෙන් ඔබ වෙන්විය යුතුයි. ඔබ මළ පසු ඔබගේ දේහය අපේ මක්බරාවේ භූමිදානය කරන්නේ නැ යනුවෙන් ප්‍රකාශ කළා.

අම්මා : පසුව කුමක් සිදුවුණා ද?
පුතා : ඔහු කලිමාව පවසා තව්බා කළා.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- ක්‍රියාකාරකමට සියළු දෙනාම දායක වන්න.
- සාකච්ඡාවෙන් සොයාගත් කරුණු පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානමින් සිටින්න.

ඇමුණුම 1.2.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. රිද්දත් ඇතිවන ආකාරයන් හා උදාහරණ සාකච්ඡා කොට සොයා ගන්න.

කණ්ඩායම් 2 කුෆ්ර්, ෂිර්ක් යනාදියේ බලපෑම කුර්ආන්, සුන්නා පදනම් කොට සොයා ගන්න.

කණ්ඩායම් 3 අද මුස්ලිම් සමාජය තුළ අදෘශ්‍යමාන ව මුල් බැස ගෙන ඇති ෂිර්ක් වූ කරුණු සොයා බලන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : ජීවිතයම ඉබාදතයකි යන දර්ශනය දැන කටයුතු කරන අතරම මූලික ඉබාදත ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.1 : ඉබාදත් නිවැරදි පිළිවෙලට ඉටු කිරීමේ දැනුම ලබා ගනියි.

ක්‍රියාකාරකම 2.1.1 : අපගේ දෛනික ජීවිතය නැමදුමක් බවට පත්කර ගනිමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 2.1.1.1 හි ඇති පැන විසඳුම්
- ඇමුණුම 2.1.1.2 හි ඇති ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පැන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 2.1.1.1 :

- ඇමුණුම 2.1.1.1 හි ඇති ප්‍රශ්න එක් සිසුවෙකුටත් විසඳුම් තවත් සිසුවෙකුටත් කියවීමට දෙන්න.
- ජීවිතයේ සියළු ක්‍රියාකාරකම් නැමදුම් බවට පත් කරගත හැකිය යන අදහස ශිෂ්‍ය මනසේ තහවුරු කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • ඉබාදත් යනු අල්ලාහ් නැමදීම බව.<br>• අප මවා ඇත්තේ අල්ලාහ් නැමදීමට බව.<br>• එබැවින් අපගේ සියළු කාර්යයන් නැමදුමක් බවට පත්කළ යුතු බව.<br>• සලාතය හා සව්ම් යන අනිවාර්ය වගකීම් එයට අදාළ පුහුණුව ලබා දෙන බව. |

පියවර 2.1.1.2 :

- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම් 2.1.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- අවශ්‍ය ෆෙල්ට් පැන්, ඩිමයි කඩදාසි ආදිය සපයන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 2.1.1.3 :

- කණ්ඩායම්වලට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අඩුපාඩු සකස් කර ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

|   |
|---|
| • ඉබාදත් යන්නෙහි වචනාර්ථය වහල් භාවය බව<br>• ඉබාදත් පිළිබඳ ෂරීආවේ නිර්වචනයක් දී ඇති බව<br>• ඉබාදතයේ අනිවාර්ය හා අනිවාර්ය නොවන වශයෙන් වර්ග දෙකක් ඇති බව<br>• අනිවාර්ය ඉබාදතයන්හි ෆර්ලු අයින් හා ෆර්ලු කිෆායා ලෙස වර්ග ඇති බව<br>• අනිවාර්ය ඉබාදතයන් අතර සලාතය සවුම් යනාදිය ප්‍රධාන වන බව<br>• ඒවා අල්ලාහ් හා රසූල් පැවසූ ආකාරයට ම කළ යුතු බව.<br>• අපගේ දෛනික ක්‍රියාකාරකම් ඉබාදතයන් බවට පත්කරගත යුතු බව.<br>• ඒ සඳහා ෂරීආව මගින් පිරිනැමූ කොන්දේසි පිළිපැදිය යුතු බව.<br>• ඉබාදත් නිසා හිමිවන අල්ලාහ්ගේ උදව් උපකාර පවතින බව.<br>• අල්ලාහ්ට පමණක් නැමඳුම් කළ යුතුයි යන ප්‍රචාරය සඳහා නබිවරුන් එවනු ලැබූ බව. |

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක
:
- ඉබාදත් යන්නෙහි නිවැරදි විස්තර සොයා බලා ප්‍රකාශ කරයි.
- ඉබාදතයන් ඒවායේ ස්වභාවයට අනුව වර්ගකර ප්‍රකාශ කරයි.
- තම දෛනික කටයුතු ඉබාදත් බවට පත්කළ යුතු බව පිළිගෙන ක්‍රියා කරයි.
- ජීවිතයම නැමඳුමක් බවට පත් කරන කොන්දේසි අනුගමනය කරයි.
- සමාජය හා සම්බන්ධ ෆර්ල් කිෆායා වූ වගකීම් ඉටුකිරීම සඳහා ඉදිරිපත් වෙයි.

විස්තර පත්‍රිකාව

ඇමුණුම 2.1.1.1

ප්‍රශ්නය : මිනිසුනි, ඔබේ හිමියාට ඉබාදත් කරන්න.
යනුවෙන් අල්කුර්ආනය පවසයි.
ඉබාදත් යනු කුමක්ද?

පිළිතුර : 'විශ්වයේ රක්ෂිතයාණන්ට ම සියළු ප්‍රශංසා'

ඉබාදත් යන පදයේ අල්ලාහ් තෘප්තිමත් කරන රහසිගත හා රහසිගත නොවන වචන හා ක්‍රියා සියල්ල අන්තර්ගත වේ. මේ අයුරින් සලාතය, සකාත්, සවුම්, හජ්, අවංකත්වය, සත්‍ය බව, පවුල් සබඳතාව රැකීම, පොරොන්දු ඉටු කිරීම, යහපත පනවා අයහපත වැළැක්වීම, අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කිරීම; අසල්වැසියන්, අනාථයන්, දුගී දුප්පතුන්, මගීන්, කම්කරුවන් යනාදීන්ට යහපත ඉටු කිරීම, ජීවීන්ට කරුණාව දැක්වීම, ප්‍රාර්ථනා (දුආ) කිරීම, දේව චින්තනය (දික්ර්), කුර්ආන් පාරායනය යනාදී මෙවන් සියල්ල ඉබාදත් වේ.

(මෙය ඉබ්නු තෛමියාගෙන් විමසූ ප්‍රශ්නයට ඔහු දුන් පිළිතුරෙන් එක් කොටසකි.)

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.1.1.2

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- සෑම කණ්ඩායමක් ම ගවේෂණ පත්‍රිකාව ලබා එයට මුළු අවධානය යොමු කිරීම.
- වාර්තාවක් සකසා එය පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් වන්න.

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. ඉබාදත් යන්නෙහි නිර්වචනය පවසා දෛනික ක්‍රියාකාරකම් ඉබාදත් බවට පත්කර ගැනීමේ කොන්දේසි සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 2. ෆර්ල් අයින්, ෆර්ල් කිෆායා යනාදිය විස්තර කොට ඒ එකිනෙකට උදාහරණ 5 ක් සොයා ලියන්න.

කණ්ඩායම් 3. ෆර්ල් වූ ඉබාදත් හා නෆීල් වූ ඉබාදත් හඳුනාගෙන ඒවා චාට් සටහන් මගින් වර්ග කොට දක්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ජීවිතයම ඉබාදතයකි යන දර්ශනය දැන කටයුතු කරන අතරම මූලික ඉබාදත ඉටු කරයි. |
| නිපුණතා මට්ටම 2.1 | : | ඉබාදත් නිවැරදි පිළිවෙලට ඉටු කිරීමේ දැනුම ලබා ගනියි. |
| ක්‍රියාකාරකම 2.1.2 | : | අභ්‍යන්තර හා බාහිර පිරිසිදුකම රැකා ගනිමින් ජීවත් වෙමු. |
| කාලය | : | විනාඩි 80 |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇමුණුම 2.1.2.1 ඇතුළත් තොරතුරු පත්‍රිකාව<br>● ඇමුණුම 2.1.2.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව<br>● ලිවීම සඳහා ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.2.1 :

- ඇමුණුම 2.1.2.1 හි ඇතුළත් කථාව හොඳින් කියවිය හැකි ශිෂ්‍යයෙක් ලවා කියවීමට සලස්වන්න.
- ඒ සම්බන්ධව සිසුන්ගේ අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - පිරිසිදුකම සම්බන්ධ ෂරීඅත් දැනුම සැමට අවශ්‍ය බව.
> - ඉස්ලාම් පිරිසිදුකම අභ්‍යන්තර හා බාහිර වශයෙන් වෙන් කොට දක්වන බව.
> - නජීස් ද ඉස්ලාම් වර්ගකොට දක්වන බව
> - පිරිසිදු කරන ක්‍රමය ඉස්ලාම් පැහැදිලි ව විස්තර කර ඇති බව.

පියවර 2.1.2 .2 :

- සිසුන්ට කණ්ඩායම්වලට බෙදන්න.
- සැම කණ්ඩායමකට ම ගවේෂණ පත්‍රිකාව බැගින් ලබා දෙන්න.
- අවශ්‍ය ප්‍රමාණයට ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් සපයන්න.
- ඔවුන්ගේ කණ්ඩායම් ක්‍රියාවන් නිරීක්ෂණය කොට මග පෙන්වන්න.

පියවර 2.1.2.3 :

- සැම කණ්ඩායමකට ම තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ අදහස්වල අඩුපාඩු සකස්කර ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- නිර්මාණාත්මක අදහස් අනෙකුත් කණ්ඩායම්වලින් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සාකච්ඡා මගින් පහත සඳහන් කරුණු සමාලෝචනයේ යෙදෙන්න.

- පිරිසිදුකම පිළිබඳ ඉස්ලාමීය දැනුම නොමැතිවීම නිසා අනවශ්‍ය අපහසුතා ඇතිවන බව.
- "ඉබාදතයන්" පිළිගන්වා ගැනීම සඳහා ඉස්ලාම් පවසන අයුරු පිරිසිදුකම රැකිය යුතු බව.
- පිරිසිදුකම සම්බන්ධ ඉස්ලාමීය නීතීන් බුද්ධිමත් මෙන් ම පහසු වූ ඒවා බව.
- ඉස්ලාම් අපිරිසිදුකම (නජීස්) තුන් ආකාරයට වර්ග කොට දක්වන බව.
- මෙම නජීසයන් පිරිසිදු කරන අයුරු එකිනෙකට වෙනස්වන බව.
- පිරිසිදුකම රැකීමේ ක්‍රම ඉස්ලාම් සියුම් ව දක්වා ඇති බව.
  - නජීස් පිරිසිදු කිරීම.
  - මහ කිල්ලෙන් මිදීම.
  - සුළු කිල්ලෙන් මිදීම.

- පිරිසිදු කිරීමේ කටයුතු සඳහා ජලය අනවශ්‍ය අයුරින් නාස්ති කිරීම ඉස්ලාම් හෙළා දකින බව.
- අපිරිසිදුකම සම්බන්ධ අනවශ්‍ය සැක මතුකර ගැනීම ෂරීඅතය අනුමත නොකරන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :
- නජීස් වර්ග හා ඒවායෙන් පිරිසිදු වන ආකාරය දැන පවසයි.
- නජීස් වූ ද්‍රව්‍ය හඳුනාගෙන වර්ග කරයි.
- සෑම විටම පිරිසිදුව සිටිය යුතුයි යන්න පිළිගෙන ඊට අදාළ ක්‍රම සහ විධි අනුගමනය කරයි.
- පිරිසිදු හදවතින් අන් අයට සමීප වන අතර අන් අය සමීප වන අයුරින් තමා ද පිරිසිදුව සිටී.

ඇමුණුම 2.1.2.1

විස්තර පත්‍රිකාව

පිරිසිදුකම ඉතාමත් අගය කරන ශිෂ්‍යයෙකි, සෙයිද්. වයස දෙකක් වත් සම්පූර්ණ නොවූ කිරි පමණක් බොන මල්ලී තම ඇඳුමේ මූත්‍රා කළ විටත් කිහිප වතාවක් වුවත් ස්නානය කරයි. ඒ අවස්ථාවල ඇඳුමේ සබන් දමා සෝදයි. ඔහු වැසිකිළි ගිය විට එහි වැඩි වේලාවක් ගත කරයි. ජලය වැඩියෙන් පාවිච්චි කරයි. හූනෙක් වැටුනු නිසා ඔහුගේ මව රැස්කර තිබූ ජල බැරලය හලා දමන ලදී.

එපමණක් නොව මොහු අන් අය භාවිත කළ භාජන පාවිච්චි නොකරයි. මිදුලේ තිබූ බාල්දියට බල්ලා කට දමන්න ඇතැයි සිතා බාල්දිය විසි කර දැම්මේ ය.



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

එසේම මොහු තමා මෙන් අන් අය නැති බැවින් ඔවුන්ට දොස් පවරයි. තමා මෙන් ම අන් අයත් පිරිසිදුකම නොරකින බැවින් පේළියේ සිට සළාත් නොකරයි. තමා පමණක් පිරිසිදුය යන මමත්වය ඔහු තුළ පවතී. කවරෙකු හෝ නිවසට පැමිණ නික්ම ගිය විට නිවස සෝදයි. තව කෙනෙකු භාවිත කළ පුටුව ඔහු පාවිච්චි නොකරයි. අන් අය පහත් කොට සළකන මොහු අනෙකුත් පුද්ගලයන් පහත් කොට බලයි. සෙයිද් ගැන ඔබ කුමක් සිතන්නේ ද?

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- සෑම කණ්ඩායමක් ම තමන්ට ලබා දී ඇති ගවේෂණය පිළිබඳ හොඳින් සාකච්ඡා කොට සටහන් ලියා ගන්න.
- කණ්ඩායමේ අදහස් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 2.1.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. සෙයිද්ගේ කටයුතුවල ඔබ දුර්වලතා දකින්නේ ද? පිළිතුර ඔව් නම් එම දුර්වලතා ලැයිස්තුගත කරන්න.

කණ්ඩායම් 2. නජීසය ඉස්ලාම් කෙසේ වර්ග කරන්නේදැයි චාට් සටහනකින් දක්වන්න.

කණ්ඩායම් 3. තුන් ආකාර නජීස් වලින් කෙසේ පිරිසිදු වන්නේ දැයි විස්තර ලියන්න.

කණ්ඩායම් 4. අභ්‍යන්තර පිරිසිදුකම යනු කුමක්ද? බාහිර පිරිසිදුකම යනු කුමක්ද? අභ්‍යන්තරය අපවිත්‍ර කරන කරුණු හඳුනාගෙන සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : ජීවිතයම ඉබාදතයකි යන දර්ශනය දැන කටයුතු කරන අතරම මූලික ඉබාදත ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.1 : ඉබාදත් නිවැරදි පිළිවෙලට ඉටු කිරීමේ දැනුම ලබාගනියි.

ක්‍රියාකාරකම 2.1.2 : ශරීඅතයට අනුකූලව ජලය භාවිතා කරමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.1.2.1 ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 2.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව (ප්‍රමාණවත් තරම් පිටපත්)
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.2.1 :
- ඇමුණුම 2.1.2.1 හි ඇතුළත් ප්‍රාර්ථනාව කියවීමට සලස්වන්න.
- එහි අර්ථය පැවසීම තුළින් පිරිසිදුව සිටීමේ අවශ්‍යතාව අවබෝධ කරවන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ඉස්ලාම් පිරිසිදුකමට වැඩි වැදගත්කමක් දක්වන බව.
> - නැමදුම් පිළිගනු ලැබීම සඳහා මහා කිල්ල සහ සුළු කිල්ල ඉවත්කළ යුතු බව.
> - පිරිසිදු ජලය පවා නජීස් මිශ්‍ර වීමෙන් අපවිත්‍ර වන බව.

පියවර 2.1.2 .2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 2.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව කණ්ඩායම්වලට සපයන්න.
- වර්ණ පෑන් සහ සුදු කඩදාසි අවශ්‍ය ප්‍රමාණයට සපයන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 2.1.2.3 :
- තම සාකච්ඡා මගින් ලබාගත් තොරතුරු ඉදිරිපත් කිරීමට කණ්ඩායම් වලට අවස්ථාව ලබා දෙන්න.
- අඩුපාඩු සකස් කර ගැනීම සඳහා එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

● පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- ඉස්ලාමීය ෂරීආතය ජලය වර්ග කොට පෙන්වන බව.
  තහූර්
  මුත්ලක්
  මුස්ත උමල්
  තාහිර්
  නජීස්
- කුල්ලතයිනයට වැඩි හා කුල්ලතයිනයට අඩු වශයෙන් වෙනස්කම් පවතින බව.
- නජීස් මිශ්‍ර ජලයට අමතර වශයෙන් වැඩි ජල ප්‍රමාණයක් එකතු කිරීමෙන් එම ජලය පිරිසිදු කළ හැකි බව.
- රෙදි සෝදන යන්ත්‍රය භාවිතා කරන්නන් ඇඳුමේ ඇති නජීසයන් ඉවත් කිරීමෙන් අනතුරුව එය යන්ත්‍රය තුළට දැමිය යුතු බව.
- ගෙන්දගම් මිශ්‍ර ජලය, පාසි/දිය සෙවල තැවරුණු ජලය, මඩවතුර යනාදියෙන් පිරිසිදු කළ හැකි බව.
- තැඹිලි වතුර, තේ වතුර යනාදිය පිරිසිදු ජලය වන නමුත් ඒ මගින් අන් ද්‍රව්‍ය පිරිසිදු කළ නොහැකි බව.
- වුළූ කිරීම මගින් සුළු කිල්ලත් ස්නානය කිරීම මගින් මහ කිල්ලත් ඉවත් වන බව.
- සුළු කිල්ල ඇතිකරන ක්‍රියාවන් සහ මහ කිල්ල ඇති කරන ක්‍රියාවන් කුමක් දැයි ෂරීආතය පැහැදිලිව විස්තර කර ඇති බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක
:
- ඉස්ලාමීය ෂරීආතයේ ජලය වර්ග කොට ඇති අයුරු අධ්‍යයනය කොට පවසයි.
- සියළු ආකාර ද්‍රව වස්තූන් ෂරීආතයට අනුව වර්ග කිරීමට දැනගනියි.
- ජලය සම්බන්ධ ෂරීආතයේ මග පෙන්වීම පිළිබඳ තෘප්තිමත් වෙයි.
- ජලය භාවිත කිරීමේ දී ෂරීආතයේ මග පෙන්වීම් අනුගමනය කරයි.
- ජලය භාවිත කිරීමේ දී අන් අයගේ අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කරයි.

ඇමුණුම 2.1.2.1

විස්තර පත්‍රිකාව

اَللّٰهُمَّ إغْسِلْنِي بِالْمَاءِ وَالثَّلْجِ وَالْبَرْدِ وَنَقِّنِي مِنَ
الخَطَايَا كَمَا يُنَقِي الثَّوْبُ الأَبْيَضُ مِنَ الدَّنَسِ

අල්ලාහ්, ජලයෙනුත්, පිනිකැටවලිනුත් හිම වරුෂාවෙනුත් සෝදනු මැන, කිලිටි වලින් ඇඳුම් පිරිසිදු කරන්නා සේ මා ද මාගේ වැරදි වලින් පිරිසිදු කරනු මැන.

(රවාහුල් ජමාආ)

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ගවේෂණ පත්‍රිකාව ලබාගෙන ඒ කෙරෙහි අවධානය යොමු කරන්න.
- වාර්තාව සූදානම් කර එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 2.1.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. ෂරීඅතයේ පවසා ඇති අයුරු ජලයේ වර්ග හැඳිනගෙන ඒවා වර්ග කොට විස්තර කරන්න.

කණ්ඩායම් 2. ෂරීඅතයේ පවසා ඇති කරුණු අනුව පහත සඳහන් දෑ වර්ග කොට දක්වන්න.

1. ලේ මිශ්‍රවීම නිසා වර්ණය වෙනස් වූ ජලය
2. පිනිදිය
3. සීනි දියවූ ජලය
4. වැසි ජලය
5. මුහුදු ජලය
6. ගෙන්දගම් සුවඳ මුසු වී ඇති ළිං ජලය
7. මූත්‍රා බිඳුවක් වැටුණු අධික ජලය
8. සිවුපාවුන් බීමෙන් පසු බාල්දියේ ඉතිරිවී ඇති ජලය
9. සුනඛයෙක් ජලය පානය කළ භාජනයක ඉතිරිවී ඇති ජලය

කණ්ඩායම් 3. කුල්ලතයින් යනු කුමක්දැයි සොයා බලා සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ජීවිතයම ඉබාදතයකි යන දර්ශනය දැන කටයුතු කරන අ තරම මූලික ඉබාදත ඉටු කරයි. |
| නිපුණතා මට්ටම 2.1 | : | ඉබාදත නිවැරදි පිළිවෙලට ඉටු කිරීමේ දැනුම ලබා ගනී. |
| ක්‍රියාකාරකම 2.1.2 | : | තයම්මුම් පිළිබඳ දැන ක්‍රියා කරමු. |
| කාලය | : | විනාඩි 80 |
| ගුණාත්මක යෙදවුම් | : | • ඇමුණුම 2.1.2.1 ඇතුළත් විස්තර පත්‍රිකාව<br>• ඇමුණුම 2.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව<br>• ඩිමයි කඩදාසි<br>• ෆෙල්ට් පෑන්<br>• තයම්මුම් කිරීමට අවශ්‍ය වන පස් |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.2.1 :

- ඇමුණුම 2.1.2.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව කියවා පෙන්වන්න.
- ජලය භාවිත කළ නොහැකි අවස්ථා පිළිබඳ සාකච්ඡා කරන්න.
- එවැනි අවස්ථාවලදී ඉස්ලාම් පෙන්වා ඇති සහනයක් හඳුන්වා දෙන්න.
- පහත සඳහන් කරුණු පදනම් කොටගෙන සාකච්ඡා කරන්න.

> - නැමදුම් කටයුතුවල දී විවිධ අවස්ථානුකූලව ඉස්ලාම් සහන සලසා ඇති බව.
> - තයම්මුම්, ජබීරත් යනාදිය එවැනි සහන බව.
> - මෙවැනි සහන නොසලකා හැරීම නුසුදුසු බව.
> - සාධාරණ හේතු තිබුණත් සහන උපයෝගී නොකිරීම වැරැද්දක් බව.

පියවර 2.1.2.2 :

- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම ඇමුණුම් 2.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- අවශ්‍යවන ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් සපයන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කර මග පෙන්වන්න.

පියවර 2.1.2.3 :

- සාකච්ඡා මගින් ලබාගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායමේ සිටින කෙනෙකුට, තයම්මුම් කර පෙන්වන මෙන් ඉල්ලීම් කරන්න.
- දුර්වලතා සකස්කර ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - මොනම හේතුවක් නිසාවත් සලාතය අත්හැරිය නොහැකි බව.
> - කිල්ලෙන් නිදහස් නොවී සලාතය ඉටු කළ නොහැකි බව.
> - සුළු කිල්ල හෝ මහ කිල්ල ඉවත් කිරීමට ජලය නොමැති අවස්ථාවක හෝ නැතහොත් ජලය භාවිත කළ නොහැකි අවස්ථාවක තයම්මුම් කළ යුතු බව.
> - බලපෑ හේතුව ඉවත්වූ පසුව තයම්මුමය අක්‍රිය වන බව.
> - ජලයෙන් තෙමිය නොහැකි තුවාලයක් ශරීරයේ ඇති විට එය මත ප්ලාස්ටරයක් හෝ පටියක් (ජබීරත්) දැමිය යුතු බව.
> - අවශ්‍යතාවට වැඩි ප්‍රදේශ එම පටි වලින් ආවරණය නොවිය යුතු බව.
> - ස්නානය කිරීමේදීත් වුළු කිරීමේදීත් එම ආවරණය මත ජලයෙන් මස්හු කළ යුතු බව.
> - ආවරණය ඉවත් කළ පසු මෙම සහනය භාවිත කළ නොහැකි බව.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ජලය නොමැති අවස්ථාවකදී හා භාවිත කළ නොහැකි අවස්ථාවක දී නජීස් ඉවත් කිරීමට ෂරීඅතය පවසන විකල්ප මාර්ග මොනවා දැ යි දැක පවසයි.
- ශාරීරික තුවාල වලට භාජනය වූ කෙනෙකු නජීස්වලින් මිදීමට කුමක් කළ යුතු දැයි පවසයි.
- නිවැරදි අයුරින් තයම්මුම් කර දක්වයි.
- ජල භාවිතයේ ගැටලු මතුවන අවස්ථාවලදී තයම්මුම් හා ජබීරත් යන විකල්ප මාර්ග භාවිතයෙන් තම ආගමික වගකීම් ඉටු කිරීමේ තෘප්තිය ලබයි.
- මෙම සහන ප්‍රතික්ෂේප කිරීමෙන් හා භාවිත නොකිරීමෙන් වැළකී කටයුතු කරයි

ඇමුණුම 2.1.2.1

විස්තර පත්‍රිකාව

ආයිෂා (රළි) තුමිය, අස්මා (රළි) තුමියගෙන් මුතුවලින් නිමවුණු මාලයක් අත මාරුවට ලබා ගත්තාය. ගමනක දී එම මාලය අතුරුදහන් විය. එය සොයාගෙන ඒම සඳහා නබි(සල්)තුමා විසින් සහාබිවරු කීප දෙනෙක් යවන ලදී. ඔවුන් ගිය ස්ථානයේ ජලය නොතිබුණි. එම අවස්ථාවේ සලාතයට වේලා පැමිණි විට වුළු නොමැතිව සලාතය ඉටු කළහ. ඉන්පසුව එම සිදුවීම නබි(සල්)තුමාට පැවසූ විට, තයම්මුම් පිළිබඳව පවසන අල්කුර්ආන් වැකිය පහළ විය."

මෙය ඉමාම් මුස්ලිම් ගේ රිවායතයකි. වුළු හෝ තයම්මුම් හෝ නොමැතිව සහභාවරු ඉටු කළ සලාත නැවත ඉටු කරන ලෙස නබි(සල්)තුමාණන් පැවසුවේ නැත යන අදහසට ඉමාම් නවවි තුමා" මෙය ඉතාමත් විශ්වාසදායී කරුණක් " ලෙස දක්වයි.

(රවාහුල් ජමාආ)

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
- වාර්තාව සකස්කර එය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 2.1.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. තයම්මුම් සම්බන්ධ අල්කුර්ආන් වාක්‍ය සොයා එහි අර්ථය ලියන්න.

කණ්ඩායම් 2. තයම්මුම් කළ යුතු අවස්ථා සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 3. කණ්ඩායමකින් කෙනෙකු බැගින් පැමිණ තයම්මුම් කරන අයුරු විස්තර කරමින් ආදර්ශණය කරන්න.

කණ්ඩායම් 4. කෙනෙකුට ස්නානය අනිවාර්ය වී තිබේ. නමුත් ඔහුගේ සිරුරේ තුවාල ඇති බැවින් ඔහුට ස්නානය කළ නොහැක. ඔහුගේ ආගමික වගකීම වන සලාතය ඉටුකිරීමට ඔබ ලබාදෙන යෝජනා සාකච්ඡා කොට සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : ජීවිතයම ඉබාදතයකි යන දර්ශනය දැන කටයුතු කරන අතරම මූලික ඉබාදත ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.2 : ඉබාදතයෙහි වැදගත්කම වටහාගෙන ඉටුකිරීමේ පන්නරය හා පුහුණුව ලැබ එය ඉටු කරයි.

ක්‍රියාකාරකම 2.2.1 : සලාතය ඉටු කරන අයුරු දැන ක්‍රියා කරමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.2.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 2.2.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.2.1.1 :
- විස්තර පත්‍රිකාවේ සඳහන් හදීසය කළු ලෑල්ලේ සටහන් කර ප්‍රදර්ශනය කරන්න.
- ඒ හා සම්බන්ධ සිසුන්ගේ අත්දැකීම් හා අදහස් මතු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න.

> - මුස්ලිමෙකු දිනකට පස් වතාවක් නොකඩවා සලාතය ඉටු කළ යුතු බව.
> - සලාතය ඉටු කරන අයුරු ජිබ්රිල් (අලෛ) මගින් නබි (සල්) තුමාට ඉගැන්වූ බව.
> - සලාතයේ සියළු අවස්ථා හා පාරායනය නබි (සල්) තුමා පෙන් වූ ආකාරයට ඉටු කළ යුතු බව.
> - සලාතයත් සමඟ පාරායනය කළ යුතු සමහර සුන්නත් වූ පාරායනාවන් ඇති බව.

පියවර 2.2.1.2 :
- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම් 2.2.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- ඩිමයි කඩදාසි හා පෑන් සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට මග පෙන්වන්න.
- පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස පවසන්න.

පියවර 2.2.1.3 :
- කණ්ඩායම්වල වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ප්‍රථමයෙන් එම කණ්ඩායමට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - සලායතයේ ෂර්ත්, ෆර්ල්, සුන්නත් පිළිපැද ඉටුකිරීමෙන් පමණක් පිං ලබාගත හැකිබව.
> - සලාතයට නැගී සිටීම. නියියත් තැබීම රුකූඋ කිරීම, ඉඋතිදාල් අවස්ථාවට පැමිණීම සුජූද් කිරීම, මැද ඉඳුම, අත්තහියියාත් ඉඳුම යනාදිය පිළිවෙලට ඉටු කළ යුතු බව.
> - එම අවස්ථාවල පාරායනය කිරීමට විවිධ පාරායනාවන් ඇති බව.
> - සලාතය තක්බීරයෙන් ආරම්භ කොට පළමුවන සලාමයෙන් අවසන් වන සලාතය බව.
> - සලාතය ඉටු කිරීමෙන් අනතුරු ව කියවිය යුතු සුන්නත් වූ පාරායනාවන් ඇති බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- සලාතයේ ෂර්ත්, ෆර්ල්, සුන්නත් යනාදිය පිළිපැද ඉටු කිරීමේ හැකියාව ලබයි.
- සලාතය අංග සම්පූර්ණව ඉටු කරයි.
- සලාතයේ පාරායනාවන් දැන පවසයි.
- සලාතයේ සෑම අංගයක් ම පිළිපැද ඉටු කළ යුතු බව පිළිගනියි.

ඇමුණුම 2.2.1.1

විස්තර පත්‍රිකාව

> صَلُّو كَمَا رَأَيْتُمُوْنِيْ أُصَلِّي

මා කෙසේ සලාතය ඉටු කරනු ඔබ දුටුවේද, ඔබත් එසේම කරන්න.

(බුහාරි)

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- සෑම කණ්ඩායමක් ම තම ගවේෂණය කෙරෙහි මුළු අවධානය යොමු කරන්න.
- සොයාගත් කරුණු සෑම කණ්ඩායමක් ම සටහන් කරන්න.
- පන්තිය ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීමට සූදානම් කර ගන්න.

ගවේෂණ පත්‍රිකාව

ඇමුණුම 2.2.1.1

කණ්ඩායම් 1. සලාතයේ ආරම්භක තක්බීරයේ සිට පළමු වනසලාමය දක්වා ඇති ෆර්ල් හා සුන්නත් වූ පරායනයන් පිළිවෙලින් සටහන් කරන්න.

කණ්ඩායම් 2. සුජූද්, රුකූඋ, අත්තහියියාත්, ඉඋතිදාල් යන අවස්ථාවල ශරීර අවයව කෙසේ තබා ගත යුතු දැයි සොයා වාර්තා කර ගන්න.

කණ්ඩායම් 3. සලාතය නිම වූ විගස කළ යුතු පාරායනය සටහන් කරන්න.

කණ්ඩායම් 4. අංගපූර්ණ වූ සලාතයක කුමන වර්ගයේ ගුණාංග අන්තර්ගත වී ඇත්දැයි සොයා සටහන් කරන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : ජීවිතයම ඉබාදතයකි යන දර්ශනය දැන කටයුතු කරන අතරම මූලික ඉබාදත ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.2 : ඉබාදතයෙහි වැදගත්කම වටහාගෙන ඉටු කිරීමේ පන්නරය හා පුහුණුව ලැබ එය ඉටු කරයි.

ක්‍රියාකාරකම 2.2.2 : සවුමයේ පිළිවෙල හා ප්‍රයෝජන දැන සවුම් රකිමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.2.2.1 හි අන්තර්ගත කවිය
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.2.2.1 :
- ඇමුණුම 2.2.2.1 හි ඇති කවි 4 සිසුන් හතර දෙනෙකුට දී පන්තිය ඉදිරියේ කියවීමට සළස්වන්න.
- සවුමය සම්බන්ධ සිසුන්ගේ සිතුවිලි මතුකොට අත්දැකීම් පැවසීමට අවස්ථාව දෙන්න.

- පහත සඳහන් කරුණු අවධාරණය වන අයුරින් සාකච්ඡා කරන්න.

| |
|---|
| • සවුමය ඉස්ලාමයේ මූලික වගකීම්වලින් එකක් බව.<br>• සවුමයේ වර්ග දෙකක් ඇති බව.<br>• සවුමය ඉටුවීමට පිළිපැදිය යුතු අංග ඇති බව.<br>• සමහරුන්ට සවුම් නොරැකී සිටීමට සහන නිදහස ලබා දී ඇති බව. |

පියවර 2.2.2.2 :
- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට මග පෙන්වන්න.

පියවර 2.2.2.3 :
- කණ්ඩායම්වලට තම වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කණ්ඩායමට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල අදහස් ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

පහත සඳහන් කරුණු පදනම් කොට ගෙන සාකච්ඡා කරන්න.

- ඉස්ලාමයේ පංච මහා වගකීම් වලින් එකක් වන සවුම් හිජ්රි 2 වසරේ අනිවාර්ය වූ බව.
- ෆර්ල් හා සුන්නත් වශයෙන් සවුම් ඇත. රමලාන්, හාරයන්, කෆ්ෆාරා යනාදිය ෆර්ල් වූ සවිම් වන අතර, මාස්පතා අවුරුදු පතා ඇති සවුමයන් සුන්නත් වූ සවිම බව.
- සවුමය ඉටුවීමට ෂර්තයන් සහ ෆර්ලයන් ඇති බව.
- සවුමය අලංකාර කිරීම උදෙසා සුන්නතයන් ඇති බව හා මුබ්තිලාත් නමැති කරුණු සවුමය කඩවන බව.
- රෝගීන්, මගීන්, කිරිදෙන මවුවරු, ගර්භනී යන අයට සවුම් කලා වශයෙන් කිරීමට හෝ ෆිදියා දීමට සහන දී ඇති බව.
- සවුම් රැකීමෙන් දේව භක්තිකයෙකු (මුත්තකීන්) ලෙස පත්විය හැකි බව.
- සවුමය මගින් විවිධ ප්‍රායෝගික ප්‍රයෝජන අපට ලැබෙන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- සවුමයේ අවශ්‍යතාවය හා එහි ෆර්ල් ෂර්ත් මුබ්තිලාතයෙන් දැන පවසයි.
- ෆර්ල් වූ හෝ සුන්නත් වූ හෝ සවුමයක් ඒවායේ නීතිරීති පිළිපදිමින් රකියි.
- සවුමයේ උසස් බව අගයයි.
- සවුම් රකිමින් තක්වා ලබාගැනීමට උත්සාහ කරයි.

ගවේෂණ උපදෙස් පත්‍රිකාව :

- ගවේෂණ පත්‍රිකාව ලබාගන්න.
- කණ්ඩායම්වලට ලබාදී ඇති කවි කෙරෙහි හොඳින් අවධානය යොමු කරන්න.
- කවියේ අන්තර්ගත සවුමයේ නීති රීති පිළිබඳ සාකච්ඡා කරන්න.
- සාකච්ඡා කළ කරුණු සටහන් කර ගන්න.
- පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ගවේෂණ පත්‍රිකාව

කවියේ අන්තර්ගත සවුමයේ නීතිරීති සොයා සටහන් කරන්න.

කණ්ඩායම් අංක - 1
සවුමයේ ෂර්ත්

| | | |
|---|---|---|
| සවුමයේ ෂර්තයන් පහක්ම වෙයි | - | සවන් යොමන්න දරුවනේ |
| ගරුතර මුස්ලිමෙකු විය යුතුයි | - | සැලකුම් ලබන නිසි වයසක් තිබිය යුතුයි |
| සිහි බුද්ධිය පිහිටා තිබිය යුතුයි | - | බලය හා ශක්තිය තිබිය යුතුයි |
| ඇතිවන හයිල් නිෆාස්වලින් තොර | - | පිරිසිදු කෙනෙකු ලෙස සිටිය යුතුයි. |

කණ්ඩායම් අංක 2
සවුමයේ ෆර්ල්

| | | |
|---|---|---|
| අසන්න සවුමයේ ෆර්ල් දෙකකි | - | අනිවාර්ය නියියත් තැබිය යුතුයි |
| අළුයම සිට සූර්ය රාජ | - | අවරින් බැස යන |
| කිසිඳු අහරෙන් බීමෙන් වැළකී | - | රැකගත් සවුමය නොබිඳා |
| යහතින් සිටීම වග කීමකි | - | ඇරඹි සවුමය සුරැකීමට |

කණ්ඩායම් අංක 3
සවුමය කඩ කරන ක්‍රියා

| | | |
|---|---|---|
| සවුමය බිඳින කාරණාවන් | - | හොඳින් අසනු මැන දරුවනේ |
| විවර වූ ශරීර ද්වාර ඔස්සේ | - | යම් කිසි ද්‍රව්‍යයක් ඇතුළුවීමයි |
| දීර්ඝ දිවා කළ සිහිසුන් වීමයි | - | ඕනෑ කමින් වමනය දැමීමයි |
| ස්ත්‍රී පුරුෂ සංසර්ගයේ යෙදීමයි | - | පිස්සු භාවයට ලක්වීමයි |
| උවමනාවෙන් ශුක්‍රා පිට කිරීමයි | - | කිලිහයිල් නිෆාස් ඇතිවීමයි |
| පිවිතුරු ඉස්ලාමයෙන් ඉවත් වී | - | දහම් මාරුවෙන් මුර්තද් වීමයි |
| නොකර සවුමයට හානිකරදෑ | - | ගරුත්වයෙන් යුතුව සවුමය රැක |
| කුසලයන් අධික ලෙස ලබා | - | භක්තිවන්තයෙකු ලෙස බැබලමු. |

කණ්ඩායම් අංක 4
සවුමයේ සුන්නත්

| | | |
|---|---|---|
| රාත්‍රියේ අපර භාගය එළැඹිනා | - | ආහාර යමක් අනුභව කරනා |
| නියමිත වේලාවෙ ඉන් මිදෙනා | - | අනතුරුව දුආ ප්‍රාර්ථනා කරනා |
| යහතින් සවුම්දාරීන් කැඳවා | - | සවුමෙන් මිදෙන්න උදව් කරවා |
| දාන දික්ර් සමග කුර්ආන් කියවා | - | නොමනා කතා ක්‍රියා ඉවත් කරවා |
| රාත්‍රි නැමදුමෙහි නිරත වෙමින් | - | ඊඋතිකාෆ් නැමැති නැමදුම රකිමින් |
| ෆර්ල් වූ නෑමට නිසි තැන දෙමින් | - | ස්නානයක් රාත්‍රියේ ඉටු කරමින් |
| පහත් දර්ශන සියල්ලන්ගෙන් | - | තහනම් වූ සියළු ගීත සං ගීතයන්ගෙන් |
| ඉවත්වීමත් සවුමයේ සුන්නත් වන්නේ | - | යහපත්ව පිළිපදිනු දරුවන්නේ. |

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : යහගුණ හා යහ ක්‍රියා ඇත්තකු සේ වැජඹෙයි.

නිපුණතා මට්ටම 3.1 : දේව තෘප්තිය පතා ජීවිතයේ යහගුණ යහක්‍රියා නොකඩවා පිළිපදියි.

ක්‍රියාකාරකම 3.1 : "චිත්ත පාරිශුද්ධත්වයෙන් කටයුතු කරමු"

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 3.1.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 3.1.1.2 හි ඇති ගවේෂණ පත්‍රිකාව
- රියාලුස් සාලිහීන් පරිවර්තනය
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.1.1 :
- ඇමුණුම 3.1.1.1 හි ඇති දෑ O.H.P මගින් දර්ශනය කරන්න. නැතහොත් කළුලෑල්ලේ ඇඳ සටහන් කරන්න.
- එහි ඊමාන්, ඉබාදත්, ඉඛ්ලාස් යන කරුණු අතර ඇති සබඳතාව කෙටියෙන් විස්තර කරන්න.

- පහත කරුණු පදනම් කර සාකච්ඡා කරන්න.

| |
|---|
| ● ඊමාන් යනු අල්ලාහ් රසූල් පැවසූ දේ විශ්වාස කිරීම බව.<br>● ඒ විශ්වාසය සමගින් ඉස්ලාමීය වගකීම් ඉටු කළ යුතු බව.<br>● එම වගකීම් ඉටු කිරීම අප විශ්වාස කරන අල්ලාහ්ට පමණක් විය යුතු බව.<br>● ඉඛ්ලාස් නැමැති චිත්ත පාරිශුද්ධි එය බව. |

පියවර 3.1.1.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ගවේෂණ පත්‍රිකා පිටපත් ලබා දෙන්න.
- සෑම කණ්ඩායමකට ම අවශ්‍ය පෑන් හා කොළ සපයන්න.
- සෑම කණ්ඩායමක් ම සාකච්ඡාවට යොමු කරන්න.
- එය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 3.1.1.3 :
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසා දුර්වලතා සකස් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.


- පහත සඳහන් කරුණු සමාලෝචනය කරන්න.

> - අදෘශ්‍යමාන මහා සත්‍ය විශ්වාස කිරීම ඊමාන් බව.
> - මුස්ලිමෙකුගේ ක්‍රියාදාම සියල්ල ඊමානීය පදනමින් සිදු විය යුතු බව.
> - මුස්ලිම්වරයෙකුගේ පරිත්‍යාගය, සේවය, දානය, නැමදුම යන සියල්ල අල්ලාහ් වෙනුවෙන් ම පැවතිය යුතු බව.
> - අන් අයගේ තෘප්තියට, ප්‍රචාරයට, ප්‍රසිද්ධියට කටයුතු කිරීම මූනිච්ජාව වන බව.
> - මූනිච්ජාව මුසු වූ නැමදුම යහපත වෙනුවට අයහපත ඇතිකරන බව.
> - පිරිසිදු ක්‍රියාවන් මගින් ඊමානය ශක්තිමත් කළ යුතු බව.
> - ස්ථිර ඊමානය මගින් අප ක්‍රියා පිවිතුරු කළ යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ඊමාන් සහ ඉස්ලාම් එකිනෙකට සම්බන්ධ වූ කරුණු වන බව දැන ප්‍රකාශ කරයි.
- ඊමාන්, අමල්, ඉක්ලාස් යනාදිය අතර ඇති සබඳතාව විස්තර කරයි.
- අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා කටයුතු කර තමා ද එමගින් තෘප්තිමත් වෙයි.
- තම කටයුතුවල දී ඉහ්ලාස්ව කටයුතු කරයි.
- අන් අය සම්බන්ධ කටයුතුවල දී ද අල්ලාහ්ගේ තෘප්තිය පතා කටයුතු කරයි.

ඇමුණුම 3.1.1.1




- ඊමාන් නමැති චක්‍රය තුළ අමල් තිබිය යුතුය. මන්දයත් අමල් නොමැතිව ඊමාන් නොමැත.
- සියළු අමල්වල අල්ලාහ් වෙනුවෙන් ය, යන පිරිසිදු චේතනාව තිබිය යුතුය. මන්දයත් පිවිතුරු චේතනාවෙන් තොර ක්‍රියා අල්ලාහ් අනුමත නොකරයි.
- අමල් + ඉහ්ලාස් +ඊමාන් = පිළිගනු ලැබීම.
- එබැවින් අමල් සමග ඉහ්ලාස් නොමැතිවිට ඊමාන් ද නොමැත.



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- කණ්ඩායම් ගවේෂණය කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කරන්න.
- වාර්තාව සකස් කොට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- තුන්වන කණ්ඩායම රියාලුස්භාලිහීන් නැමැති ග්‍රන්ථය ලබා ගන්න.

ඇමුණුම 3.1.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. චිත්ත පාරිශුද්ධිය (ඉහ්ලාස්) සමග ක්‍රියාත්මක වීම හා මූනිච්ජාවට ක්‍රියාත්මකවීම යනාදියේ ස්වභාව සොයා බලා සටහන් කරන්න.

කණ්ඩායම් 2. ඉහ්ලාස් නොමැති යහ ක්‍රියා ෂිර්කයට අදාළය යන ප්‍රකාශය තහවුරු කිරීමට අල්කුර්ආන් වාක්‍යයක් ද හදීසයක් ද සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 3. හිජ්රතයේදී නබි(සල්)තුමා පැවසූ ඉහ්ලාසය හා සම්බන්ධ ප්‍රසිද්ධ හදීසය සම්පූර්ණයෙන් ලියා එමගින් ගත හැකි පාඩම් සොයා සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : යහගුණ හා යහ ක්‍රියා ඇත්තෙකු සේ වැජඹෙයි

නිපුණතා මට්ටම 3.1 : දේව තෘප්තිය පතා ජීවිතයේ යහගුණ හා යහක්‍රියා නොකඩවා පිළිපදියි.

ක්‍රියාකාරකම 3.1.3 : දිව මැනවින් භාවිතා කරමින් ජීවත් වෙමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 3.1.3.1 ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 3.1.3.2 ඇති ගවේෂණ පත්‍රිකා
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්
- ආධාරක ග්‍රන්ථ (මුස්ලිම් ආදර්ශය)

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.3.1 :
- ඇමුණුම 3.1.3.1 හි ඇති සටහන O.H.P කොළයේ ඇඳ ප්‍රදර්ශනය කරන්න.
- නැතහොත් වර්ණ හුණු මගින් කළුලෑල්ලේ ඇඳ පෙන්වන්න.
- එහි ඇති විස්තර සටහන ලබා දී ඇති හදීසයට සම්බන්ධ කොට කෙටියෙන් විස්තර කරන්න.

- පහත සඳහන් කරුණු මතු වන සේ සාකච්ඡා කරන්න.

> - ගැටුම් ඇති කිරීම සම්බන්ධයෙන් දිව ප්‍රධාන බව.
> - දිවෙන් යහපත් ආනිශංස ලබා ගත හැකි බව.
> - අනවශ්‍ය දේ පැවසීමට වඩා මුනිවත රැකීම උතුම් බව.
> - දිව මැනවින් භාවිත කිරීම නිසා යහඵල අත් වන බව.

පියවර 3.1.3.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- කණ්ඩායම්වලට ගවේෂණ පත්‍රිකා සපයන්න.
- කණ්ඩායම්වලට අවශ්‍ය ෆෙල්ට් පෑන් හා කඩදාසි සපයන්න.
- ගවේෂණ පත්‍රිකාව ක්‍රියාවට නැගීම සඳහා සාකච්ඡා කිරීමට ඉඩ දෙන්න.
- එය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 3.1.3.3 :
- තම ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න.
- නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට එම කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු සමාලෝචනය කරන්න.


> - අස්ථි නොමැති ශරීරාංගයක් වන දිව ගැටළු ඇති කරන බව.
> - බොරුව, කේලම, අවලාද යනාදිය දිවෙන් කරන පාපයක් බව.
> - වැඩිය කතා කරන්නන්ට වඩා සිතන්නා මුනිවත රකින බව.
> - දිවෙන් පින් ලබාගත හැකි මාර්ග රැසක් ඇති බව.
>   සත්‍ය කතා කිරීම
>   සුබ පැතුම් පැවසීම
>   ස්තුති කිරීම
>   (තවත් බොහෝ ඇත)
> - දිව සීරකිරීම යනු කිසිවක් කතා නොකර සිටීම නොවන බව.
> - අනෙකුත් ආගම්වල ද දිව මැනවින් පාලනය කිරීමේ වැදගත්කම පවසා ඇති බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- තම වදන් මැනවින් හසුරුවා ගැනීමෙන් ඇති යහඵල දැන පවසයි.
- අන් අය ආකර්ෂණය වන අයුරින්, දක්ෂ ලෙස දිව මැනවින් පාලනය කරයි.
- දිව මැනවින් පාලනය කිරීමෙන් බොහෝ ආනිශංස ලබා ගත හැකිය යන්න පිළිගනියි.
- යහ කටයුතු සඳහාම දිව භාවිත කරයි.
- තම වදන් වලින් අන් අය සතුටට පත් කරයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.1.3.1




කුමන දෙවියා හැර වෙනත් දෙවි කෙනෙක් නොමැති වන්නේ ද ඒ දෙවියාගේ නාමයෙන් දිවුරා ප්‍රකාශ කරමි. ලෝකයේ දීර්ඝ කාලයක් සිරකර තැබිය යුතු අවයවය දිව හැර අන් කිසිවක් නොමැත. (තබරානි)

ඇමුණුම 3.1.3.2

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- කණ්ඩායමේ ගවේෂණ පත්‍රය ලබා කණ්ඩායමේ සියළුදෙනා එයට මූලිකත්වය දී කටයුතු කරන්න. නැමැති ග්‍රන්ථය ලබා ගන්න.
- පත්‍රිකාවේ සඳහන් අයුරු කණ්ඩායම් තම ගවේෂණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් 1. සත්‍ය භාවය ජය ගනී යන සත්‍යය විස්තර කෙරෙන ඓතිහාසික සිද්ධියක් සොයා ලියන්න.

කණ්ඩායම් 2. ඉස්ලාමීය කටයුතුවල අන්තර්ගතය සුබ පැතුම් ක්‍රමයන්හි වැදගත්කම අවබෝධ වන අයුරින් කෙටි දෙබසක් සකස් කර එය කියවීමෙන් රඟ දක්වන්න.

කණ්ඩායම් 3. විශේෂ උත්සවයක කියවීමට සුදුසු ස්තුති කතාවක් සකස් කරන්න.

කණ්ඩායම් 4. ඉස්ලාම් ලෙස සිටිම් යන මාතෘකාව යටතේ යහ චින්තනයෙන් සොයා ලියන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : යහගුණ හා යහ ක්‍රියාවන් ඇත්තකුසේ වැජඹෙයි.

නිපුණතා මට්ටම 3.1 : දේව තෘප්තිය පතා ජීවිතයේ හා යහ ක්‍රියා ඒවා නොකඩවා පිළිපදී.

ක්‍රියාකාරකම 3.1.4 : යුක්ති ගරුක බව. සාධාරණත්වය, යටහත් භාවය යනාදිය පිළිපදියි.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 3.1.1 ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 3.1.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- තර්ජුමතුල් කුර්ආන්
- මුස්ලිම් ආදර්ශය - ආචාර්ය හිෂාම් අල් තාලිබ්
- පෙළපොත් 10 ශ්‍රේණිය (මුද්‍රණය 2000)
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.4.1 :
- ඇමුණුම් 3.1.4.1 හි ඇතුළත් ඓතිහාසික සිද්ධිය කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කොට ගෙන සාකච්ඡා කරන්න:

> - යුක්තිය, සාධාරණත්වය හා යටහත් භාවය පැසසිය යුතු යහ ගුණාංගයක් බව.
> - නබි (සල්) තුමාණන් මෙම යහගුණයන්ට ආදර්ශයක් ලෙස වැජඹුනු බව.
> - නබි (සල්) තුමාණන් අනුගමනය කරන්නන් වශයෙන් මෙම ගුණාංගයන් අප තුළ වර්ධනය කළ යුතු බව.
> - මෙවන් යහ ගුණාංගයන් සහිත පුද්ගලයන්ට අල්ලාහ් වෙත උසස් තත්ත්වයක් ලැබෙන බව.

පියවර 3.1.4.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ගවේෂණ පත්‍රිකාව පිටපත් කර එකිනෙක කණ්ඩායම් වලට සපයන්න.
- එකිනෙක කණ්ඩායම්වලට අවශ්‍ය පෑන්, කඩදාසි යනාදිය සපයන්න.
- කණ්ඩායම් සාකච්ඡාවට පොළඹවන්න.
- එය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 3.1.4.3 :
- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න.
- ඉදිරිපත් කළ නිර්මාණ පිළිබඳ ගුණාත්මක විවේචන කිරීමට අනෙකුත් කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතුවන අයුරින් සමාලෝචනය කරන්න.

- සාධාරණ ව හා යුක්තිගරුක ව ක්‍රියාකළ යුතු බවට අප අල්ලාහ් වෙතින් අණ ලබා ඇත්තෙමු. (16.90)
- යුක්තිගරුක හා සාධාරණ බව පිළිපැදීම දේව භක්තිය හෙවත් තක්වාව ට ඉතා සමීප ගුණාංගයක් බව අල්කුර්ආනය පවසන බව. (5.8)
- සතුරන්, නෑදෑයන් යන පදනමින් පක්ෂපාතී නොවී සාධාරණව කටයුතු කළ යුතු බවට අල්ලාහ් අපට අණ කරන බව.
- යටහත්භාවය අ ල්ලාහ් ප්‍රිය කරන ක්‍රියාවලින් එකකි. යටහත් භාවයෙන් කටයුතු කිරීම මුස්ලිම්වරයෙකුට පූර්ණත්වය ලබා දෙන බව.
- මෙලොව යටහත් භාවයෙන් කටයුතු කරන මුස්ලිම්වරු අල්ලාහ් පරලොව දී උසස් කරන බව.
- යටහත් භාවයෙන් තොර ව ජීවත්වන පුද්ලයන්ට මිනිසුන් පිළිකුල් කරන බව. එලෙසින් ම අල්ලාහ් ද තදින් ඔහුව පිළිකුල් කරන බව, මන්දයත් ආඩම්බරකම අල්ලාහ්ට පමණක් අයත් ගුණාංගයක් වන බව.
- යුක්තිය, සාධාරණත්වය හා යටහත් භාවය පිළිපදින මුස්ලිම්වරුන්ට ස්වර්ගය තෑග්ගක් ලෙස ලැබෙන බව.
- අයුක්තියෙන් කටයුතු කරනන්, උඩඟුබවින් කටයුතු කරන්නන්හට නිරය නිවහනක් ලෙස ලැබෙන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- යුක්තිගරුක බව, සාධාරණත්වය, යටහත්භාවය යනාදියේ අර්ථය වටහාගෙන පවසයි.
- යුක්තිය හා සාධාරණත්වයෙන්, යටහත්භාවයෙන් කටයුතු කළයුතු අවස්ථාවක් හඳුනාගෙන පවසයි.
- මෙම ගුණාංගයන් පිළිපැදීම තුළින් උසස් බව හිමිවීම නිවැරදි බවට දකියි.
- යුක්තිගරුක ව, සාධාරණ ව හා යටහත්භාවයෙන් කටයුතු කර පෙන්වයි.
- මෙවන් ගුණාංගයන් අනුගමනය කිරීම නිසා අන් අයගේ ගරුත්වය ලබාගනී.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.1.4.1

## නබි (සල්) තුමාගේ යුක්තිගරුක භාවය

නබි (සල්) තුමාණන් ළමා කාලයේ සිට යුක්තිගරුක භාවයෙන් වැජඹුනේ ය. මේ නිසා එතුමාට අල් අමීන්, අස්සාදික් යන ගෞරව නාමයන්ගෙන් පිදුම් ලැබුවේය.

ඉස්ලාම් ප්‍රචාරක කටයුතු ආරම්භ කළ අවස්ථාවේ කුරෙයිෂි කාෆිර්වරු එතුමාට තදින් විරුද්ධ විය. එනමුත් නබි (සල්) තුමාණන් භාරයේ තම භාණ්ඩ විශ්වාසය මත භාරකොට තබන ලදී. කුරෙයිෂිවරු නබි (සල්) තුමාණන් ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කළ අවස්ථාවේ, තම සතුරන් තමන් වෙත විශ්වාසය මත භාරකොට තැබූ භාණ්ඩ නිසි අයුරින් නැවත භාරදීමට අලි (රළි) තුමාව පත්කොට රාත්‍රියේ මක්කාවෙන් නික්ම ගියේ ය.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- තමන්ට ලබා දී ඇති ගවේෂණයේ සම්පූර්ණයෙන් යෙදෙන්න.
- වාර්තාවක් සූදානම් කර පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම් 3.1.4.2

## ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. සාධාරණ ව කටයුතු කළයුතු අවස්ථාවක් කණ්ඩායමේ සාමාජිකයන්ගෙන් අසා සටහන් කරගන්න.

කණ්ඩායම් 2. යටහත් භාවයේ වැදගත්කම පිළිබඳව අදහස් සොයාබලා එක්රැස්කොට යහ සිතුවිල්ලක් සකස් කරන්න.

කණ්ඩායම් 3. ජාති, ආගම් භේදයෙන් තොරව අපගේ ආදර්ශමත් පෙර උතුමන් සාධාරණත්ව ඉටුකළ බවට උදාහරණ වශයෙන් ඓතිහාසික තොරතුරු සොයාබලා සටහන් කරන්න.

කණ්ඩායම් 4. අප සතුරන් සමඟත් සාධාරණත්වයෙන් කටයුතු කළයුතු බවට කුර්ආන් ආයතනයක් හා හදීසයක් සොයා සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : යහගුණ හා යහ ක්‍රියාවන් ඇත්තකු සේ වැජඹෙයි.

නිපුණතා මට්ටම 3.1 : දේව තෘප්තිය පතා ජීවිතයේ යහගුණ හා යහක්‍රියා නොකඩවා පිළිපදී.

ක්‍රියාකාරකම 3.1 : යහගුණ ඇත්තන් ලෙස ජීවත්වෙමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 3.1.5.1 ඇතුළත් සටහන
- ඇමුණුම 3.1.5.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව (අවශ්‍ය ප්‍රමාණ පිටපත්)
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්
- තර්ජුමතුල් කුර්ආන් - අල් කුර්ආන් පරිවර්තනය
- රියාලුස් සා ලිහීන් (පරිවර්තනය)

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.5.1 :

- ඇමුණුම් 3.1.5.1 හි ඇතුළත් දෑ O.H.P කොළයක සටහන් කොට ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති කොටස් 3 අතර පවතින අන්තර් සම්බන්ධතාවය කෙටියෙන් විස්තර කරන්න.

- පහත කරුණු මතුවන අයුරින් සාකච්ඡා කරන්න.

> - අල්කුර්ආනය යහගුණයන් දේශනා කරන බව.
> - යහගුණයන්ට උසස් ආදර්ශයක් ලෙස නබි (සල්) තුමාණන් වැජඹෙන බව.
> - යහගුණ ඇත්තන් ස්වර්ගයට ඇතුළත් වන බව.
> - ඉවසීම, වීරත්වය, සමාවදීම යනාදිය යහගුණයන් වන බව.

පියවර 3.1.5.2 :

- සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ගවේෂණ පත්‍රිකා පිටපත් කොට සපයන්න.
- නිදහස් ව සාකච්ඡා කිරීමට අවකාශය ලබා දෙන්න.
- එය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 3.1.5.3 :

- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගුණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට කණ්ඩායමකට අවස්ථාව සලසන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතුවන අයුරින් සාකච්ඡා කරන්න.

> - ඉස්ලාම් යහ ගුණයන් දේශනා කිරීමට පහළ වූ ධර්මයක් වන බව.
> - නබි (සල්) තුමා උසස් ගුණාංගයන්ගේ සංකේතයක් බව අල්කුර්ආනය පවසන බව.
> - නබි (සල්) තුමාගේ යහ ගුණය අල්කුර්ආනය වේ, යනුවෙන් ආයිෂා (රළි) පැවසූ බව.
> - යහගුණ ඇත්තන්ට ස්වර්ගයේ උසස් ස්ථාන හිමිවන බවට හදීසයේ සඳහන් වන බව.
> - සත්‍ය කතා කිරීම, පොරොන්දු ඉටු කිරීම, ඉවසීම, වීරත්වය යනාදිය ඉස්ලාම් දේශනාවේ සමහර යහ ගුණාංගයන් බව.
> - යහගුණ මගින් ජීවිතයේ අලංකාර වන බව. මේ නිසා අල්ලාගේ ද මිනිසාගේ ද ආදරයට සමීප ව පවතින බව.
> - යහගුණ නොමැත්තන් තිරිසන් තත්ත්වයට පත්වන බව.
>   මේ නිසා අල්ලාහ්ගේ හා මිනිසාගේ පිළිකුලට පාත්‍රවන බව.
> - විශ්වාසය හා යහගුණය වෙන්කළ නොහැකි එකිනෙක බැඳී පවතින සාධක දෙකක් බව. එකක ඇතිවන දුර්වලතා අනෙකටත් බලපාන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- යහගුණයන් හා වැදගත්කම දැන පවසයි.
- යහගුණයන් හඳුනාගෙන පවසයි.
- යහගුණයන් පිළිපදිමින් ජීවත්වී තෘප්තිය ලබයි.
- යහගුණ ඇත්තන් හා එක්ව ජීවත් වෙයි
- තම යහගුණයන් අන් අයටත් ප්‍රදර්ශනය කරයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.1.5.1

| අප | මන්දයත් එය | කුර්ආනය හා හදීසය පවසයි |
|---|---|---|
| සැම විටම ඉවසීමෙන් කටයුතු කරමු | • ජීවන යථාර්ථය අවබෝධ කොට ජීවත්වීමට මග පාදයි.<br>• තැන්පත්ව සිතා නිවැරදි තීරණ ගැනීමට මග පෙන්වයි.<br>• අල්ලාහ්ගේ උපකාර ලබාදෙයි.<br>• අපව හික්මවයි. | • නිශ්චය වශයෙන්ම දුෂ්කරතාවෙන් පසු සහනය ඇත. (අල්කුර්ආන්)<br>• ඉවසන්නන් සමග අල්ලාහ් සිටී. (අල්කුර්ආන්)<br>• ඉවසීම යනු ප්‍රභාවකි, එළියකි). (අල්හදීස්) |
| බියගුළු භාවයෙන් මිදී වීරත්වයෙන් කටයුතු කරමු. | • අල්ලාහ්ට පමණක් ගැති විය යුතුය යන මානසිකත්වය ලබාදෙයි.<br>• අධිෂ්ඨානයෙන් නොකඩවා ඉදිරියට යාමට මග පෙන්වයි.<br>• අප ඉදිරියේ ඇති බාධක සැහැල්ලු කරයි. | • අපරාධ කරන්නන්ට ඔබ අවනත නොවන්න. (අල්කුර්ආන්)<br>• බෙලහීන වූ මු:මින් කෙනෙකුට වඩා බලවත් වූ මු:මින් ශ්‍රේෂ්ඨ වේ . (අල්හදීස්)<br>• අල්ලාහ් දෙවියනි. බියගුළු භාවයෙන් ආරක්ෂාව පතමි (හදිස්) |
| අන් අයගේ වැරදි සමා කරමු. | • අපගේ ක්‍රියාවන් අලංකාර කරයි.<br>• අපගේ වැරදිවලට සමාවදීමට අන් අයව පොළඹවයි.<br>• අපව හික්මීමෙන් කටයුතු කරවයි. | • කවරෙකු හෝ තවකෙක් කළ වරදක්ම පවසා සමාව දුන්නේද එය ඉතාමත් වීර ක්‍රියාවකි. (අල්කුර්ආන්)<br>• ඔවුන් කෝපය ගිලදමයි. මිනිසුන්ගේ වැරදි සමාකරයි. අල්ලාහ් මෙවැනි යහ ගැත්තන්ට දක්වයි. (අල්කුර්ආන්)<br>• ඔබව ඇත් කරන්නන් සමග එක්ව කටයුතු කරන්න. ඔබට නොදී සිටින්න. ඔබ දෙමින් සිටින්න. ඔබට අයුක්තිය ඉටුකළ අයට සමාව දෙන්න. (අල්හදීස්) |

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියළු දෙනා ඒ වෙත අවධානය යොමු කරන්න.
- සාකච්ඡාවෙන් සකස් කළ වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 3.1.5.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. යහගුණයන්ගේ වැදගත්කම පවසන අල්කුර්ආන් වැකි දෙකක් හා හදීස් දෙකක් සොයා ලියන්න.

කණ්ඩායම් 2. යහගුණයක් ලැයිස්තු ගත කරන්න. ඒවා ජීවිතයේ පිළිපැදීමෙන් ලැබෙන ආනිශංස ද සාකච්ඡා කොට සටහන් කරන්න.

කණ්ඩායම් 3. අප පාසලේ යහගුණ වර්ධනය කිරීම සඳහා කවරාකාර සැලසුම් ක්‍රියාත්මක කළ හැකිදැයි සාකච්ඡා කොට යෝජනා කරන්න.

කණ්ඩායම් 4. පන්ති කාමරයේ දැකිය හැකි අයහපත් ගුණාංග සොයා බලා ඒවා ඉවත් කිරීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : යහගුණ හා යහ ක්‍රියාවන් ඇත්තකු සේ වැජඹෙයි.

නිපුණතා මට්ටම 3.1 : දේව තෘප්තිය පතා ජීවිතයේ ඒවා නොකඩවා පිළිපදියි.

ක්‍රියාකාරකම 3.1 : කාල කළමනාකරණයෙන් ඵල ලබමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 3.1.6.1 ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 3.1.6.2 ගවේෂණ පත්‍රිකාව (අවශ්‍ය පිටපත්)
- ඕමයි කොළ, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.6.1 :
- ඇමුණුම 3.1.6.1 ඇතුළත් උපදෙස් ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන සිසුවකුට කියවීමට අවස්ථාව දෙන්න.
- සිසුන්ට එය හොඳින් සවන්දීමට සලස්වන්න.
- කාලය අල්ලාහ්ගේ දායාදයන්ගෙන් එකකි. එය නාස්ති නොකළ යුතු බව විස්තර කරන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

| |
|---|
| • කාලය යනු අල්ලාහ්ගේ දායාදයන් බව. |
| • කාලය සැලසුම් කොට භාවිතා කිරීම ඉබාදත් වන බව. |
| • යහ කටයුතුවලට කාලය වෙන්කළ යුතු බව. |

පියවර 3.1.6.2 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම් 3.1.6.2 ඇති ගවේෂණ පත්‍රිකා සියළු කණ්ඩායම්වලට ලබාදෙන්න.
- ස්වාධීනව සාකච්ඡා කිරීමට යොමු කරන්න.
- වර්ණ පෑන් හා භාෂීට් සපයන්න.
- ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 3.1.6.3 :
- කණ්ඩායම්වල නිමැවුම සියල්ලන් හමුවේ ඉදිරිපත් කිරීම සඳහා කැඳවන්න.
- දුර්වලතා සකස්කර ගැනීම සඳහා ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු අවධාරණය කරමින් සමාලෝචනය කරන්න.

> - අප යහ කටයුතුවල යෙදෙන්නේ දැයි පරීක්ෂා කිරීමට අල්ලාහ් කාලය දී ඇති බව.
> - කාලය සැලසුම් කොට ක්‍රියා කිරීම උදෙසා ආගමික වගකීම් නියමකොට ඇති බව.
> - කාලය කළමනාකරණය නොකිරීමෙන් එය නාස්ති විය හැකි බව.
> - කාලය නාස්ති කිරීම වරදක් බව.
> - අපගේ කටයුතු සැලසුම් කිරීම මගින් කාලය ඉතිරි කළ හැකි බව.
> - සෑම විනාඩියකම අප මරණයට ළඟාවන බව.
> - කාලය පිළිබඳවත්, එහි අප තුළ කාර්යයන් පිළිබඳවත් පරලොවදී අල්ලාහ් විමසනු ලබන බව.
> - හිමිදිරි උදෑසන ආරම්භ කරන කාර්යවල අල්ලාහ්ගේ බරකත් පවතින බව.
> - අප විසින් අපම ස්වයං විමසුමට ලක්කොට අපගේ ක්‍රියාවන් සකසාගත යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :
- කාලයේ ස්වභාවයන් කුමක්ද යන්න දැන පවසයි.
- කාලය මනා අයුරින් සැලසුම් කර පෙන්වයි.
- කාලය නාස්තිකරන පුරුදු හඳුනාගෙන ඉන් මිදීමට උත්සාහ කරයි.
- ලැබී ඇති කාලයේ අධික ලෙස කටයුතු කරයි.
- අන් අයගේ කාලයට ගරු කරයි.

ඇමුණුම 3.1.6.1

විස්තර පත්‍රිකාව

ඔබේ කාලය වෙන් කරන්න.

- සිතීමට කාලය වෙන් කරන්න. එය හැකියාවේ මූලය වේ.
- ක්‍රීඩාවට කාලය වෙන් කරන්න. එය යොවුන් හඩ රැකගැනීමේ සංකේතයකි.
- කියවීමට කාලය වෙන් කරන්න. එය දැනුමේ උල්පත වේ.
- සලාතයට කාලය වෙන් කරන්න. එය මෙලොව ඇති ඉහළ ම ශක්තිය වේ.
- ආදරය දැක්වීමටත්, දක්වනු ලැබීමටත් කාලය වෙන් කරන්න.
- මිතුරුකමට කාලය වෙන් කරන්න. එය සතුටේ මාර්ගය වේ.
- සිනහවට කාලය වෙන් කරන්න. එය උසස් දානය වේ.
- දීමට කාලය වෙන් කරන්න. මන්දයත් ආත්මාර්ථකාමී වීමට තරම් මෙලොව ජීවිතය දීර්ඝ නැත.
- වැඩ කිරීමට කාලය වෙන් කරන්න. එය ජයග්‍රහණයේ මිලකි.
- එනමුත් කිසිම විටක නාස්ති කිරීමට කාලය වෙන් නොකරන්න. නබි (සල්) තුමා පැවසූ දේ සිතට ගන්න.

  කවරෙකුගේ දින දෙකක් (ඔහු ඉටුකළ කාර්යයන් අනුව) එක සමාන වන්නේ ද, නිශ්වය වශයෙන් ඔහු හානියේ සිටී.

(මුස්ලිම් තරුණයන් සඳහා නායකත්ව පුහුණු මාර්ග කෘතියෙන්)

ඇමුණුම 3.1.6.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- කණ්ඩායම් ගවේෂණයේ සියළු දෙනා යොදන්න.
- වාර්තාව ඉදිරිපත් කිරීමට කෙනකු සූදානම් වන්න.

කණ්ඩායම් 1. කාලයේ වැදගත්කම පිළිබඳව ඉස්ලාමීය දෘෂ්ඨිකෝණයෙන් වාක්‍ය 10 ක් ලියන්න.

කණ්ඩායම් 2. මුස්ලිම් ශිෂ්‍යයෙකු ලෙස සතියේ දිනක් සඳහා කාල සටහනක් සකස් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 4.0 : ඉස්ලාමීය පවුල් ජීවිතයට අදාළ මග පෙන්වීම් ලබා ඒ අනුව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 4.1 : පවුලේ වගකීම් හඳුනාගෙන හැහීම්බර ව හා නිවැරදිව ඉටු කරයි.

ක්‍රියාකාරකම 4.1.1 : පවුලේ පරිපාලනය දැන පිළිපදියි.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 4.1.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- බ්‍රිස්ටල් බෝඩ්
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.1 .1 :
- ඇමුණුම 4.1.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව කියවන්න.
- පවුලක් යහපත් වීමට දෙමාපියන්ගේ සොයා බැලීම අවශ්‍ය ද යන්න විමසා සිසුන්ගේ අත්දැකීම් මතුකිරීමට අවස්ථාව දෙන්න.
- කාලය අල්ලාහ්ගේ දායාදයන්ගෙන් එකකි. එය නාස්ති නොකළ යුතු බව විස්තර කරන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - එක් පවුලක ප්‍රධාන හා මූලික සාමාජිකයන් සැමියා හා බිරිඳ බව.
> - පවුල් දිවිය සාර්ථක වීමට සැමියා හා බිරිඳ ගේ අන්‍යෝන්‍ය සහයෝගය අවශ්‍ය වන බව.
> - එකිනෙකා තම වගකීම් දැන කටයුතු කළ යුතු බව.
> - පවුලේ අනාගතය වෙනුවෙන් සැලසුම්ගත උත්සාහයක යෙදිය යුතු බව.
> - දෙමාපියන් ආදර්ශවත් විය යුතු බව.
> - සියලු දරුවන්ට සමාන ව සැළකිය යුතු බව.

පියවර 4.1.1.2 :
- පන්තිය කණ්ඩායම් කරන්න.
- ගවේෂණ පත්‍රිකාව, ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 4.1.1.3 :
- කණ්ඩායම්වලට තම වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඉදිරිපත් කළ වාර්තාවේ දුර්වලතා සකස් කර ගැනීමට සංවර්ධනාත්මක අදහස් එම කණ්ඩායමෙන් ම විමසන්න.
- අනෙකුත් කණ්ඩායම්වල අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු පදනම් කොටගෙන සාකච්ඡා කරන්න.

| |
|---|
| • සැමියා හා බිරිඳගෙන් බිහිවන පවුලේ ඔවුන්ගේ ගුණාංගයන් පිහිටන බව.<br>• නිසි ගැළපීම් මත සැමියා හා බිරිඳ එක් වීමෙන් සහජීවනය ඇතිවී යහපත් පරිසරයක් ගොඩ නැගෙන බව.<br>• සැමියාට සමහර වගකීම ද බිරිඳට සමහර යුතුකම් ද ඇති බව.<br>• ඒවා වගකීමෙන් යුතුව ඉටුකළ යුතු බව.<br>• අනාගතය පිළිබඳ සලකා බලා පවුල් කළමනාකරණයත් දරුවන් හදාවඩා ගැනීමත් ඔවුන්ගේ සාරධර්ම අනුව අධ්‍යාපනයත් සකස් විය යුතු බව.<br>• දෙමාපියන් සලාතය ඉටුකරමින්, සාරධර්ම පිළිපදිමින් ආදර්ශවත්ව කටයුතු කරමින් මහපෙන්විය යුතු බව.<br>• දරුවන්ට පිරිමි ගැහැණු, බාලයා, වැඩිමලා යන වෙනස්කම් වලින් තොරව සමාන අයුරින් සැළකිය යුතු බව.<br>• පවුලේ කටයුතු පවුලේ සාමාජිකයන් අතර මෂුරා නැමැති සාකච්ඡා මගින් ක්‍රියාවට නැඟිය යුතුය. |

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- පවුලක් යනු කුමක්දැයි පවසයි. පවුල් දිවිය යහපත් වීමට පිළිපැදිය යුතු කරුණු දැන පවසයි.
- පවුල් යහපත් කරන සාධක හා අවුල් කරන සාධක හඳුනාගෙන, අයහපත් සාධක ඉවත් කිරීමට ඉදිරිපත් වෙයි.
- පවුල් ජීවිතය යහපත් වූ විට ජීවන දියුණුව ඇතිවන බව අවබෝධ කර ක්‍රියා කරයි.
- පවුලේ සහයෝගයෙන් කටයුතු කර එහි අභිවෘද්ධියට කටයුතු කරයි.

ඇමුණුම 4.1.1.1

විස්තර පත්‍රිකාව

එය ඉතා ලස්සන ගම්මානයකි. එහි මාධ්‍යයේ ගාම්භීරත්වය විදහා දක්වන මස්ජිදයක් විය. ගම්වැසියන් හා පිටතින් එන පිරිස් එම මස්ජිදයට ඇතුළු වී සලාතය ඉටු කරයි, නික්ම යයි. එමෙන්ම ගම්වැසියන් ගේ දරුවන් ද මස්ජිදයට පැමිණේ. සමහර ළමුන් දෙමාපියන් සමග පැමිණෙන අතර තවත් සමහර ළමෝ තනි ව පැමිණෙති.

තනිව පැමිණෙන ළමයින් සලාතය ඉටුකරන විට විවිධාකාර කරදර ඇති කරයි. වුළු කරන විටත් ජලය ඉසිමින් සෙල්ලම් කරයි. සමූහ සලාතය සඳහා තක්බීර් බැඳීමෙන් අනතුරුව මොවුන් මස්ජිදය පුරා දුව පැන සෙල්ලම් කරමින් වැඩිහිටියන්ගේ සලාතයට බාධා පමුණුවයි. නමුත් සලාම් දීමට පෙර ජමාඅතය හා එක් වේ.

දිනක් එම පල්ලියේ ප්‍රධාන ඉමාම් මෙම දරුවන් කැඳවා මින්පසු ඔබ පියා සමග පමණක් සලාතයට පැමිණිය යුතු යැයි තදින් ප්‍රකාශ කළේය. ළමුන් නිවසට ගොස් මවට මේ බව ප්‍රකාශ කළේය. මව මේ බව පියාට පවසා ඔහු සමග දරුවන් මස්ජිදයට යවන ලදී. එදින සිට ළමුන් මස්ජිදයේ කරදර නොකර සාවධානව සලාතයේ යෙදෙනු දක්නට හැකි විය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- ඔබ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව වෙත අවධානය යොමු කරන්න.
- වාර්තාවක් සකස් කර පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 4.1.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. දෙමාපියන් දරුවන්ට කළයුතු යුතුකම් පිළිබඳ සාකච්ඡා කර බිත්ති පුවත්පතකට සුදුසු නිර්මාණයක් සකස් කරන්න.

කණ්ඩායම් 2. "යහපත් පවුලකට සැමියාගේ දායකත්වය" පිළිබඳ සාකච්ඡා කොට බිත්ති පුවත්පතකට නිර්මාණයක් සකස් කරන්න.

කණ්ඩායම් 3. "යහපත් පවුලකට බිරිඳගේ දායකත්වය" පිළියෙල සාකච්ඡා කොට බිත්ති පුවත්පතකට නිර්මාණයක් සකස් කරන්න.

කණ්ඩායම් 4. සාකච්ඡා කර තීරණ ගෙන කටයුතු කිරීම පවුලකට යහ පැවැත්මට කෙතරම් ප්‍රබල දායකත්වයක් දක්වන්නේ ද යන්න සාකච්ඡා කර බිත්ති පුවත්පතකට නිර්මාණයක් සකසන්න.

කණ්ඩායම් 5. මනා පවුල් දිවියක් අවධාරණය කරන අල්කුර්ආන් වාක්‍ය හා හදීස් අධ්‍යයනය කර බිත්ති පුවත්පතට නිර්මාණයක් සකස් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 4.0 : ඉස්ලාමීය පවුල් ජීවිතයේ මඟ පෙන්වීම් ලබා ඒ අනුව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 4.1 : පවුලට අදාළ යුතුකම් හැඟීම් බරව හා නිවැරදිව ඉටු කරයි.

ක්‍රියාකාරකම 4.1.2 : ඉස්ලාමයේ කාන්තා අයිතිවාසිකම් දැන ක්‍රියා කරමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.2.1 විස්තර පත්‍රිකාව
- ඇමුණුම 4.1.2.2 ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.2.1 :
- විස්තර පත්‍රිකාවේ ඇතුළත් ප්‍රවෘත්තිය හඬනඟා කියවන්න.
- ඒ සම්බන්ධයෙන් සිසුන් හා සාකච්ඡා කර ඔවුන්ගේ අත්දැකීම් හා අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- පහත කරුණු පදනම් කර ගෙන සාකච්ඡා කරන්න.

> - ඉස්ලාමයට පෙර ඉතිහාසයේ කාන්තාවක් ඉතාමත් පහත් තත්ත්වයේ සැළකූ බව.
> - යුරෝපයේ කාර්මික විප්ලවය ඇති වූ සමයේ මිනිස් ඉතිහාසයේ කාන්තාවන් අත් දුටු දැඩි දුෂ්කරතා රාශියක් ඔවුන් මත පටවන ලද බව.
> - නූතන ලෝකයේ කාන්තාවන් සටන් කොට ලබා ගැනීමට පෙරම ඉස්ලාම් සියළු අයිතිවාසිකම් ඔවුන්ට පිරිනමා ඇති බව.

පියවර 4.1.2.2 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකටම 4.1.2.2 ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- අවශ්‍ය වන විට ෆෙල්ට් පෑන් හා ඩිමයි කඩදාසි සපයන්න.
- සිසුන්ට ස්වාධීනව සාකච්ඡා කිරීම සඳහා යොමු කරන්න.
- ඔවුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර අදාළ මඟ පෙන්වීම් කරන්න.

පියවර 4.1.2.3 :
- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට එම කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු තහවුරු වන සේ සාකච්ඡා මෙහෙයවන්න.

- ඉස්ලාමයේ කාන්තාවගේ තත්ත්වය පිළිබඳ පැහැදිලි විස්තර කුර්ආනය මගින් සපයා ඇති බව.
- කාන්තාව පිරිමින්ට වඩා පහත් නොවන බව, එමෙන්ම ඔවුන් පහත් කොටසක් ද නොවන බව.
- කිසිදු සමාජ ක්‍රමයක හෝ මොනම නීති ක්‍රමයක හෝ නැති තරමට ඉස්ලාම් කාන්තාවන්ට අයිතිවාසිකම් ලබා දී ඇති බව.
- පිරිමින්ට හා කාන්තාවන්ට අල්ලාහ් ඉදිරියේ කුලිය සමාන වන බව.
- ඉපයීමේ හා අධ්‍යාපන ලැබීමේ අයිතිය කාන්තාව සතුවන බව.
- මිනිස් සමාජය වර්ධනය කිරීමේ අයිතිවාසිකම පිරිමින්ට මෙන්ම කාන්තාවන්ටත් හිමි බව.
- පිරිමින්ට මෙන් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ඔවුන් සතු වන බව.
- ගිවිසුම් ඇතිකර ගැනීමට හා ආයෝජන කිරීමටත් ඔවුන්ට අයිතිවාසිකම් හිමිවන බව.
- ජීවිතයේ පොදු කටයුතුවල යෙදීමටත්, තමාගේ ජීවන සහකරු සොයා ගැනීමටත් අකැමැති ජීවන සහකරුගෙන් වෙන්වීමටත් දික්කසාද වීමටත් ඇයට අයිතිවාසිකම් ඇති බව.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ඉස්ලාම් කාන්තාවන්ට ප්‍රදානය කොට ඇති අයිතිවාසිකම් දැන ගනියි.
- ඉස්ලාම් කාන්තාවට ප්‍රදානය කොට ඇති අයිතිවාසිකම්වල ශ්‍රේෂ්ඨ බව පිළිගනී.
- කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් තම ජීවිතයේ සියලු අවස්ථාවල ලබා දෙයි.
- කාන්තාවන්ට තම අයිතිවාසිකම් ලබා ගැනීමට ඇති බාධක හඳුනාගෙන ඒවා ඉවත් කරයි.

ඇමුණුම : 4.1.2.1

විස්තර පත්‍රිකාව

ඉස්ලාමයේ කාන්තාවන් ලබාගෙන ඇති අයිතිවාසිකම් සටන් කිරීමෙන් හෝ පරිත්‍යාග කිරීමෙන් ලබාගත් ඒවා නොවේ. වත්මන් කාන්තාවන් උද්ඝෝෂණයක් කර හදිසි තත්ත්වයක් මත පවරනු ලැබූ අයිතිවාසිකම් භුක්ති විඳියි.

නමුත් මුස්ලිම් කාන්තාවන් ලබා ඇති අයිතිවාසිකම් දේව අණෙහි ප්‍රතිඵලයකි. කාන්තාවන්ගේ සුවිශේෂ තත්ත්වය හා ස්වභාවයට අනුකූලව ඇයට අයිතිවාසිකම් ලබා දී ඇත.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- ක්‍රියාකාරකම කෙරෙහි අවධානය යොමු කරන්න.
- වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 4.1.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. ඉස්ලාම් කාන්තාවන්ට ලබාදී ඇති අයිතිවාසිකම් අදාළ මූලාශ්‍ර සමග ඉදිරිපත් කරන්න.

කණ්ඩායම් 2. ඉස්ලාම් කාන්තාවන්ට දී ඇති අයිතිවාසිකම් හා බටහිර ලෝකය කාන්තාවට ලබා දී ඇති අයිතිවාසිකම් සසඳා බලා විමර්ශනයක් කරන්න.

කණ්ඩායම් 3. කාන්තාවන්ට තම අයිතිවාසිකම් මුළුමනින් ම භුක්ති විඳීමට හැකිවන පරිදි අප කළ යුත්තේ කුමක් ද?

නිපුණතාව 4.0 : ඉස්ලාමීය පවුල් දිවියේ මහ පෙන්වීම් ලබා ඒ අනුව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 4.1 : පවුලේ වගකීම් හඳුනාගෙන හැගීම් බරව හා නිවැරදිව ඉටු කරයි.

ක්‍රියාකාරකම 4.1.3 : හලාල් වූ දේම අනුභව කිරීමෙන් අල්ලාහ් ගේ තෘප්තිය ලබමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.3.1 ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 4.1.3.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාවේ පිටපත්
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පැන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.3.1 :
- ඇමුණුම් 4.1.3.1 හි ඇතුළත් සටහන් තුන සිසුන් තිදෙනෙක් මගින් කියවීමට සලස්වන්න.
- පහත කරුණු පදනම් කර ගෙන සාකච්ඡා කරන්න.

> - මිනිසාගේ අවනත භාවය පිරික්සීම සඳහා අල්ලාහ් සමහර දෑ හරාම් කොට ඇති බව.
> - අල්ලාහ් හලාල් කළ ඇති දෑ හි සීමාව ඉතා විශාල බව.
> - මිනිසාගේ ශරීරයට හා ආත්මයට හානිකර දෑ අල්ලාහ් හරාම් කොට ඇති බව.
> - ප්‍රාර්ථනාවන් පිළිගනු ලැබීමට හලාල් වූ දෑ පමණක් අනුභව කළ යුතු බව.

පියවර 4.1.3.2 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකටම 4.1.3.2 හි ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- එකිනෙක කණ්ඩායම්වලට අවශ්‍ය පෑන් හා ඩිමයි කඩදාසි සපයන්න.
- කණ්ඩායම් ගවේෂණයේ යොදවා නිරීක්ෂණය කර මග පෙන්වන්න.

පියවර 4.1.3.3 :
- කණ්ඩායම්වල වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දුර්වලතා සකස්කර ගැනීම සඳහා ප්‍රථමයෙන් එම කණ්ඩායම්වලට ම අවස්ථා ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පහත කරුණු තහවුරු වන සේ සාකච්ඡා මෙහෙයවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ආදම් (අලෛ) තුමාට එක්තරා ආහාරයක් තහනම් කොට ඊට අවනත වන්නේ දැයි පරීක්ෂා කළා සේ අපටත් සමහරක් තහනම් කොට එයට අප අවනත වන්නේ දැයි පරීක්ෂා කරන බව.
- අල්ලාහ් වැඩි කොටසක් අපට හලාල් කර සුළු කොටසක් හරාම් කර ඇති බව.
- අල්ලාහ් හරාම් කළ ආහාරවල යහපතට වඩා අයහපත වැඩි බව.
- හලාල් වූ ආහාරය පවා එය සකස් කළ අරමුණ අනුව හරාම් වන බව.
- හලාල් වූ ආහාරය ලබා ගැනීමට දරන උත්සාහය නැමදුමක් බව.
- අනුභවයට අනුමත කළ සතුන් නිසි අයුරින් දබ්හ් කිරීමෙන් පමණක් හලාල් වන බව.
- සතුන් දඩයම් කොට අනුභව කිරීමේ දී සමහර කොන්දේසි පිළිපැදිය යුතු බව.
- හරාම් වූ ඉපයීමෙන් ලබාගත් සියල්ල හරාම් වන බව.
- ප්‍රාර්ථනාවම පිළිගනු ලැබීමට අපගේ ආහාර හා ඇඳුම් හලාල්ටම විය යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ඉස්ලාම් සමහර ආහාර හරාම් කොට ඇත්තේ මන්දැයි දැන පවසයි.
- හරාම් වූ ආහාර වර්ග හඳුනාගෙන ඒවා ලැයිස්තු ගත කරයි.
- සමහර ආහාර අල්ලාහ් තහනම් කිරීම සාධාරණ බව පිළිගනියි.
- තමන් අනුභව කරන ආහාරයත් එය ලබාගත් මාර්ගයත් හලාල් බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව එය අනුභව කරයි.
- අන් අය සමඟ සාමූහික ව අනුභව කිරීමේදීත් මේ පිළිවෙත අනුගමනය කරයි.

ඇමුණුම 4.1.3.1

විස්තර පත්‍රිකාව

ආදම් (අලෛ) තුමා තමාට කෙතරම් ස්ථිර වශයෙන් අවනත වන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා අල්ලාහ් එක් ගසක් පෙන්වා එයට ළං නොවන ලෙස අණ කළේය. එනමුත් ෂෙයිතාන්ගේ පෙළඹවීම නිසා ඔහු එතුමා අල්ලාහ්ට පිටුපෑවේය. මෙමගින් එතුමා ස්වර්ගයෙන් පිටමං කරනු ලැබූහ. මෙය කුර්ආන් පවසන ඉතිහාසයයි.

අප අවනත වන්නේ ද යන්න පිරික්සීම උදෙසා අල්ලාහ් මෙලොවෙහි සමහරක් දෑ තහනම් - හරාම් කොට ඇත්තේ ය.

රුධිරය ආහාර වශයෙන් අනුභව කිරීම ඉස්ලාම් හරාම් කොට ඇත. රුධිරයේ අධික ප්‍රමාණයක් යූරික් අම්ලය ඇත. මෙය ආහාර වශයෙන් ගත්විට මිනිස් ශරීරයට අහිතකර බලපෑම් ඇති කරන බව නූතන පර්යේෂණ සනාථ කරයි. ඉස්ලාම් පවසන අයුරු සතුන් 'දබ්හ්' කිරීමේදී මුළු ලේ ප්‍රමාණයම පිටවීම නිසා යූරික් අම්ලය මස හා මුසුවීමට අවකාශ නොලැබේ. මේ නිසා මස්වලට විෂ මිශ්‍ර වීමෙන් වැළකේ.

ඉස්ලාම් පවසන අයුරු අනුභව කිරීමෙන් ඇතිවන යහපත් ප්‍රතිඵල රාශියකි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

සියළුම සතුන් වැඩි වශයෙන් යූරික් අම්ලය මූත්‍ර සමඟ පිටකරයි. එනමුත් ඌරා තම මූත්‍ර සමග 2% ක් හෝ යූරික් අම්ලය පිට නොකරයි. අම්ලය සම්පූර්ණ වශයෙන් ඌගේ මස්වලට උරා ගනී. එනිසා ඌරාට අධික වශයෙන් හන්දිපත් රිදීම් ඇති වන බවත්, මෙම සතාගේ මාංශ අනුභව කරන අයටත් 'රූමැටිසම්' වැනි හන්දිපත් රෝග හට ගැනීමේ ඉඩප්‍රස්ථා වැඩි බව නූතන පර්යේෂණ මගින් හෙළි වී ඇත.

ඉස්ලාම් අපට හරාම් කළ ආහාර අනුභව කිරීමෙන් ලැබෙන යහපතට වඩා අයහපත වැඩි ය. (වහිදුදීන්කාන් රචිත ඉස්ලාමීය ග්‍රන්ථයෙනි)

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- ගවේෂණයට අදාළ කරුණු හොඳින් කියවා සාකච්ඡා කර සටහන් කරන්න.
- එය ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

ඇමුණුම : 4.1.3.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. සමහර ආහාර අල්ලාහ් අපට හරාම් කිරීමට හේතු සොයන්න. සාකච්ඡා කර කරුණු සටහන් කරගන්න.

කණ්ඩායම් 2. පහත කරුණු හරාම් හළාල් වශයෙන් වර්ගකොට ලැයිස්තුගත කරන්න.
කුකුළාගේ තෙල්, ඌරු අක්මාව, ස්වභාවිකව මැරුණු මාළුවා, නොකැපූ පළාගිරවා මළවුන්ගේ නාමයෙන් කපන ලද එළුවාගේ මස්, මුස්ලිම් නොවන්නෙක් නිසි අයුරින් කපන ලද ගව මස්, අක්මාව, ඝණ වූ ලේ කැටිය, පණ ඇති ගවයෙකුගෙන් කපාගත් වලිගය, කොටි මස්, අශ්ව මස්, බූරු මස්.

කණ්ඩායම් 3. ආයුධ මගින් හෝ දඩයම් බල්ලකු මගින් දඩයම් කළ කෙනෙක් එම මාංශ අනුභව කිරීමට පෙර සලකා බැලිය යුතු කරුණු සොයා ලියන්න.

කණ්ඩායම් 4. ආහාර අනුභවයේ දී පිළිපැදිය යුතු පිළිවෙත් සොයා සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 4.0 : ඉස්ලාමීය පවුල් ජීවිතයට අදාළ මගපෙන්වීම් ලබා ඒ අනුව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 4.1 : පවුලේ වගකීම් හඳුනාගෙන හැඟීම් බරව හා නිවැරදිව ඉටු කරයි.

ක්‍රියාකාරකම 4.1 : ඉස්ලාමීය සීමා පිළිපැද ඇඳුම් අඳිමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.4.1 හි ඇතුළත් දෙබස
- ඇමුණුම 4.1.4.2 හි දී ඇති ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්
- තර්ජමතුල්කුර්ආන් (පරිවර්තනය)

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.4.1 :
- ඇමුණුම 4.1.4.1 හි ඇති දෙබස දෙදෙනෙකු මගින් රඟ දැක්වීමට සලස්වන්න.
- ඇඳුම් පිළිබඳ ඉස්ලාමීය සීමා විස්තර කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - මිනිසා තිරිසනාගෙන් වෙන්කොට දක්වන වැදගත් අංගයක් ලෙස ඇඳුම් හැඳින්විය හැකි බව.
> - අව්රත් ආවරණය ඇඳුම්වල ප්‍රධාන අරමුණ බව.
> - ගැහැණු හා පිරිමි වශයෙන් වෙන් වෙන් ව අව්රත් ඇති බව.
> - ඇඳුම් ඇඳීමේදී පිළිපැදිය යුතු පිළිවෙත් ඇති බව.

පියවර 4.1.4.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- කණ්ඩායම්වලට ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයේ යොදවා මහපෙන්වීමක් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 4.1.4.3 : 

- කණ්ඩායම්වල නිර්මාණ පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායමට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් විමසන්න.
- පහත කරුණු තහවුරු වන සේ සමාලෝචනය කරන්න.

- මිනිසා තිරිසනුන්ගෙන් වෙන්කොට දැක්වීමට අල්ලාහ් පිරිනැමූ දායාදයක් වන්නේ ඇඳුම් බව.
- ස්වභාවයෙන්ම පවතින ලැජ්ජාශීලී භාවය නිසා සිරුර ආවරණය කිරීමට මිනිසා ඇඳුම් අඳින බව.
  එබැවින් ඇඳුම් නොමැති මිනිසා අර්ධ මිනිසෙක් ලෙස සැලකෙන බව.
- "ඔබේ විලිවසා අලංකාර කර ගැනීමට ඇඳුම් පිරිනැමීමු" යනුවෙන් අල්ලාහ් අල්කුර්ආනයේ පැවසූ බව.
- ගැහැණු, පිරිමි දෙපක්ෂයේ ශරීර සැකැස්මට අනුකූලව ආවරණය කළ යුතු අවරත්, ඇඳිය යුතු ඇඳුම් හා ක්‍රම වෙන්කොට දක්වා ඇති බව.
- පිරිමින් කාන්තාවන් ලෙස හෝ කාන්තාවන් පිරිමින් ලෙස ඇඳීම තහනම් බව.
- කාන්තාවන්ට අනුමත වූ රන්තරන්, පටරෙදි පිරිමින්ට හරාම් වන බව.
- දෙපාර්ශවයම ඇඳුම් අඳින විට ඉස්ලාම් වෙන්කොට දැක්වූ නීතිරීති හා පිළිවෙල පිළිපැදිය යුතු බව.
- පුහු මාන්නය දැක්වීමට පිරිමින් වළලුකරෙන් පහළට ඇඳුම් ඇඳීමෙන් වැළකිය යුතු බව.
- අනවශ්‍ය ලෙස හෝ අශෝභන ලෙසින් නොව ඇඳුම් ඇඳීමේ දී දේව භක්තිය ගොඩ නගා ගත යුතු බව.
- මන්දයත් තක්වා නැමැති ඇඳුම ම උසස් වේ යනුවෙන් අල්කුර්ආනය පවසන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක
 : 

- ස්ත්‍රීන්ට හා පිරිමින්ට අදාළ අවුරත් කුමක්දැයි දැන පවසයි.
- කාන්තාවන් හා පිරිමින්ගේ ඇඳුම් හා ආභරණ වෙන්කොට හඳුනා ගනියි.
- ඇඳුම් ඇඳීමේදී ඉස්ලාමීය සීමා තුළ කටයුතු කර තෘප්තියක් ලබයි.
- ඉස්ලාම් පවසන සීමා පිළිපැද ඇඳුම් අඳියි.
- තමාගේ ඇඳුමේ අලංකාරය හේතුකොට ගෙන අන් අය සමග ආඩම්බර නොවී කටයුතු කරයි.

ඇමුණුම 4.1.4.1

විස්තර පත්‍රිකාව

බටහිර සංස්කෘතියට නැකම් කියන ප්‍රංශයේ වසර ගණනාවක් නස්හත් ජීවත් වන්නීය. නිවාඩු කාලයේ මව් රටට පැමිණි ඇ තම මිතුරිය වූ හනීනා හමුවීමට ගියාය. එවිට නස්හත් ෆර්දා ඇඳ සිටියා. කාන්තා විමුක්තිය පිළිබඳ හඬන හනීනාට එය ආශ්චර්යවත් දෙයක් වුනි. ඔවුන් අතර සිදු වූ දෙබස මෙසේ ය.

හනීනා : බටහිර රටක් වන ප්‍රංශයේ ජීවත්වන ඔබත් හිජාබ් අඳිනවානේ ද? මෙය කාන්තා නිදහසට බාධාවක් නොවන්නේ ද?

නස්හත් : මා ස්ව කැමැත්තෙන් පිළිගත් ඉස්ලාම් පවසන ක්‍රමයට ජීවත්වීම නිදහසට බාධාවක් ද? අන් අයගේ හැඟීම් ඇවිස්සෙන අයුරින් ඇඳුම් ඇඳීම ද කාන්තා නිදහස වන්නේ ?



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

හනීනා: එසේ නම් ඉස්ලාමීය ක්‍රමයට ඇඳුම් ඇඳීමෙන් ලැබෙන ඵලය කුමක් ද?

නස්හත් : තිරිසනුන්ගෙන් මිනිසුන් වෙන්කොට දක්වන විශේෂ අංගයකි ඇඳුම්. මෙසේ ඉස්ලාම් පවසන ආකාරයට අවුරනය පූර්ණ වශයෙන් වැසීමෙන් අංග සම්පූර්ණ මිනිසෙකු විය හැකිය. ඇඳුම් නොමැති මිනිසා අර්ධ මිනිසෙකි යන්න ඔබ අසා නැත්ද?

හනීනා: තවත් ප්‍රයෝජන තිබේ ද නස්හත්?

නස්හත් : ඔව් හනීනා ඉස්ලාමීය ඇඳුම් ක්‍රමය අලංකාර මෙන්ම විශේෂයෙන් කාන්තාවන්ට අන් අයගේ හැඟීම් ඇවිස්සීමෙන් ආරක්ෂාව ලබා දෙයි.

හනීත් : ඔව් මයි, බටහිර කාන්තාවන් මෙන් අඩ නිරුවත් ඇඳුම් ඇඳීමෙන් බොහෝ කාන්තාවන්ගෙන් කාම අපරාධවලට ලක් වන බව මමත් පිළිගන්නවා. සත්‍ය වශයෙන් ඉස්ලාම් පවසන ඇඳුම් ක්‍රමය ඉහළින් පිළිගත හැකිය එහෙම නේද නස්හත් ?

නස්හත් : හනීනා ඉස්ලාමයේ වගේම ක්‍රිස්තු යුදෙව් ආගමේ පවා ස්ත්‍රීන් " මොක්කාඩු "දැමිය යුතුයි. ඔවුන් පිරිමින් වගේ ඇඳුම් නොඇඳිය යුතුය යනුවෙන් පවසා තිබෙනවා.

හනීනා : එහෙමද? මමත් මීට පස්සෙ ඉස්ලාමීය ක්‍රමයට ඇඳුම් අඳින්නම්.

නස්හත් : බොහොම හොඳයි, එහෙනම් මම ගිහින් එන්න ද?

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ඔබේ කණ්ඩායමට අදාළ ක්‍රියාකාරකමේ යෙදෙන්න.
- වාර්තාවක් සකස්කර පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම : 4.1.4.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. සූරා අ:රාෆ් 19 - 21 වන වාක්‍ය දක්වා කොටස් කතාවක් ලෙස ලියන්න.

කණ්ඩායම් 2. සූරා අ:රාෆ් හි 26, 27 වන වාක්‍ය කියවා එම වාක්‍ය මගින් ලබාගත හැකි ඉගැන්වීම් සාකච්ඡා කොට ලියන්න.

කණ්ඩායම් 3. ඇඳුම් සම්බන්ධයෙන් කාන්තාවන්ට හා පිරිමින්ට ඉස්ලාම් පනවා ඇති සීමා තුළ කටයුතු කර ලබාගත හැකි ප්‍රයෝජන ලැයිස්තුගත කරන්න.

කණ්ඩායම් 4. කාන්තාවන් හිජාබ් පැළඳීම සාධාරණීකරණය කර වාර්තාවක් සකස් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 4.0 : ඉස්ලාමීය පවුල් ජීවිතයට අදාළ මගපෙන්වීම් ලබා ඒ අනුව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 4.1 : පවුලේ වගකීම් හඳුනාගෙන හැඟීම්බරව හා නිවැරදිව ඉටුකරයි.

ක්‍රියාකාරකම 4.1.5 : දෙමාපියන්ට ගරුකරමින් ජීවත්වෙමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.5.1 හි ඇති විස්තර පත්‍රිකාව
- ඇමුණුම 4.1.5.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.5.1 :
- විස්තර පත්‍රිකාවේ ඇතුළත් දෑ හොඳින් කියවිය හැකි ශිෂ්‍යයෙකු ලවා පන්තියේ කියවීමට සලස්වන්න.
- ඒ පිළිබඳව සිසුන්ගෙන් විමසා ඔවුන්ගේ අදහස් හා අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - දෙමාපියන්ගේ පරිත්‍යාග අන් සැමගේ පරිත්‍යාග වලට වඩා උසස් වන බව.
> - "දෙමාපියන්ට කෙළෙහි ගුණ දැක්වීම සම්බන්ධයෙන් අප මිනිසුන්ට යහපත් උපදෙස් දුන්නෙමු" යනුවෙන් කුර්ආනය පවසන බව.
> - මැවුම් කරුවාණන්ට පසුව කෙළෙහි ගුණ දැක්වීමටත්, අවනත වීමටත් සුදුස්සන් වන්නේ දෙමාපියන් වන බව.
> - දෙමාපියන්ට (නින්දාවන අයුරු) 'චී' යනුවෙන් හෝ නොපවසන ලෙස අල්ලාහ් පවසා ඇති බව.

පියවර 4.1.5.2 :
- පන්තිය කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 4.1.5.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව, ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් යනාදිය සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට මඟ පෙන්වන්න.

පියවර 4.1.5.3 :
- සිසුන්ගේ වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අඩුපාඩු සකස්කර ගැනීමට එම කණ්ඩායමට ප්‍රථමයෙන් අවස්ථාව ලබාදෙන්න.
- අනිකුත් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනය කරන්න.

> - දෙමාපියන්ට උපකාර කරන්න. එය අල්ලාහ්ගෙන් හිජ්රත් මෙන්ම ජිහාද් හි ආනිශංස ලබාදෙයි යනුවෙන් නබි (සල්) තුමා පැවසූ බව.
> - අල්ලාහ්ගේ සතුට පියාගේ සතුටෙහිත් අල්ලාහ්ගේ කෝපය පියාගේ කෝපයෙහිත් ඇතැයි නබි (සල්) තුමා පැවසූ බව
> - යහ කටයුතු වලදී පමණක් දෙමාපියන්ට අවනත විය යුතු බව.
> - වයසක දෙමාපියන් භාණ්ඩමය උපකාරවලට වඩා මානුෂික උපකාර නිතරම දරුවන්ගෙන් අපේක්ෂා කරන බව.
> - දෙමව්පියන් වෙනුවෙන් පස්වේල් සලාතයෙන් පසුව අප ඉල්ලන දුආව ඔවුන්ට කරනු ලබන අවම උපකාරය වන බව.
> - දෙමාපියන්ගේ අවශ්‍යතා ඉටුකිරීම දරුවන්ගේ වගකීමක් බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- දෙමාපියන්ට ගරු කිරීමේ අවශ්‍යතාවය කුර්ආන් සුන්නා මගින් දැනගෙන පවසයි.
- දෙමාපියන්ට දරුවන් කළයුතු යුතුකම් දැන අවබෝධයෙන් යුතුව ඉටුකරයි.
- දෙමාපියන් සතුටු කරවන අතරම ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා ද කරයි.
- දෙමාපිය දරු සබඳතාව මනා අයුරින් රකිමින් කටයුතු කරයි.

ඇමුණුම 4.1.5.1

විස්තර පත්‍රිකාව

දෙමාපියන් ඉදිරියේ හඬ නඟා කතාකිරීම, ඔවුන් සිටගෙන සිටින විට අප වාඩිවීම. ඔවුන් අසුන් ගැනීමට ප්‍රථම අප අසුන් ගැනීම, එකට ගමන් කරන විට ඔවුන් ඉදිරියෙන් ගමන් කිරීම. ඔවුන්ගේ නම් කියා ඇමතීම ඔවුන්ට ආහාර සැපයීමට ප්‍රථම තමන්ට හෝ තමාගේ දරුවන්ට ආහාර ප්‍රදානය කිරීම, ඔවුන්ගේ කාමරයට අවසර නොමැතිව ඇතුළුවීම යනාදිය නබි (සල්) තුමාගේ අදහස අනුව ගරුත්වය අඩුකරන ක්‍රියා වේ.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියළු දෙනා සාකච්ඡා කරන්න.
- වාර්තාව සකස් කර පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 4.1.5.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. දෙමාපියන් සමග ගෞරවාන්විතව කටයුතු කිරීමට පොළඹවන කුර්ආන් වැකි 2 ක් හා හදීස් 2ක් සොයා ලියන්න.

කණ්ඩායම් 2. දරුවන් දෙමාපියන්ට කළයුතු යුතුකම් ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම් 3. දෙමාපියන් හා මනා සබඳතාව වර්ධනය කරන ක්‍රියා කුමක්දැයි සොයා සටහන් කරන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 4.0 : ඉස්ලාමීය පවුල් ජීවිතයට අදාළ මගපෙන්වීම් ලබා ඒ අනුව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 4.1 : පවුලේ වගකීම් හඳුනාගෙන හැඟීම්බරව හා නිවැරදිව ඉටුකරයි.

ක්‍රියාකාරකම 4.1.6 : හුකූකුල් ඉබාදතය ගෞරවයෙන් ඉටු කරමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.6.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 4.1.6.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා
- ඩිමයි කඩදාසි
- වර්ණ පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.6.1 :
- ඇමුණුම 4.1.6.1 ඇති විස්තර පත්‍රිකාව හඬ නගා කියවන්න.
- මැවීම් වලට කළ යුතු වගකීම් පිළිබඳ සිසුන්ගේ අත්දැකීම් මතුකිරීමට අවස්ථාව දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

| |
|---|
| • මැවීම් වලට කළයුතු සමහර වගකීම් ඇති බව.<br>• සියළු මැවීම් අල්ලාහ්ගේ පවුල වන බව.<br>• අනුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමේ දී පිං කපාහැරෙන බවත්<br>• අනෙකුත් ජීවීන්ගේ අයිතිවාසිකම් වලටත් ගරු කළ යුතු බව.<br>• පීඩනයට පත් පුද්ගලයා සමාව දෙනතුරු අල්ලාහ් සමාව නොදෙන බව. |

පියවර 4.1.6.2 :
- පන්තිය කණ්ඩායම් වලට බෙදන්න.
- ගවේෂණ පත්‍රිකාව, ඩිමයි කඩදාසි, වර්ණ පෑන් සපයන්න.
- කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 4.1.6.3 :
- එකිනෙක කණ්ඩායම් වලට තම වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අඩුපාඩු සකස්කර ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම් වල ගුණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - තමාටත්, අනෙකුත් මිනිස්සුන්ටත් ජීවීන්ටත් අදාළ වගකීම් ඉටුකළ යුතු බව.
>   උදාහරණ : තම ශරීරයට අවශ්‍ය ආහාර ඇඳුම් විවේකය නින්ද යනාදිය
> - අසල්වැසියන්ට සැනසීමෙන් ජීවත්වීමට ඉඩදීම, හදාවඩා ගන්නා ප්‍රාණීන්ට හොඳින් ආහාර සපයා රැකගත යුතු බව.
> - ඕනෑම ජීවියෙක් අනවශ්‍ය අයුරින් හිංසාවන්ට ලක් නොවිය යුතුබව.
> - ඒ මැවීම් වලට කරන ලද අපරාධ වලට අල්ලාහ්ගෙන් සමාව ලැබීමට ප්‍රථම මැවීම් වලින් සමාව ගතයුතු බව.
> - පර්වතයක් තරම් පින් කළ පුද්ගලයන් මැවීම් වලට කළ අයිතිවාසිකම් කඩකිරීම් හේතුවෙන් සියල්ල හිමිවන බව.
> - බොහෝ හුකුකුල් ඉබාදා ෆර්ල් කිෆායා ලෙස සලකන බව.
> - හුකුකුල් ඉබාදා මනුෂ්‍යත්වය පදනම් කොට සැකසී ඇති බව.
> - හුකුකුල් ඉබාද් සම්බන්ධ ක්‍රියාවන් කිරීම හේතුවෙන් මිනිසා කලිෆා ලෙස සළකනු ලබන බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :
- මැවීම් වල අයිතිවාසිකම් දැන ඒවාට ගරු කළ යුතු අයුරු පවසයි.
- එකිනෙක මැවීම් කෙරෙහි ඉටුකළ යුතු වගකීම් හඳුනාගෙන ක්‍රියා කරයි.
- මැවුම් කෙරෙහි කරුණාවෙන් හා දයාවෙන් කටයුතු කිරීමට පෙළඹෙයි.
- අනුන්ට උපද්‍රව නොකර යහපත් දෑ හා උපකාරයන් කරයි.

ඇමුණුම 4.1.6.1

නබි වැකියක්

"මුස්ලිම් නොවන වැසියෙකුට මුස්ලිම් වරයෙක් අයුක්තියක් කළ විට හෝ ඔහුගේ අයිතිවාසිකම් උදුරාගත් විට හෝ ඔහුට දරාගත නොහැකි බර ඔහුමත පැටවීමෙන් හෝ ඔහුගේ භාණ්ඩ කිසිවක් බලෙන් ලබාගත් විට හෝ පරලොවදී අල්ලාහ්ගේ අධිකරණයේ මෙම නඩුව විභාගයට ගන්නා අවස්ථාවේ මා මුස්ලිම් නොවන වැසියාගේ නීතීඥයා ලෙස පෙනී සිටීමි. තර්ක කරමි." යන නබි (සල්) තුමාගේ ප්‍රකාශය අබූදාවුද් නැමැති හදීස් සංග්‍රහයේ සටහන් වී ඇත.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියළු දෙනාම ඒ වෙත අවධානය යොමු කරන්න.
- පන්තියේ ඉදිරිපත් කිරීමට වාර්තාවක් සකස් කරන්න.

ඇමුණුම 4.1.6.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. මිනිසෙකු තමන් විසින් තමාට ම ඉටුකළ යුතු වගකීම් හඳුනාගෙන සටහන් කරන්න.
කණ්ඩායම් 2. මිනිසෙකු විසින් අනෙකුත් මිනිසුන්ට ඉටුකළ යුතු යුතුකම් සොයා සටහන් කරන්න.
කණ්ඩායම් 3. මිනිසෙකු විසින් පවුලේ සාමාජිකයන්ට ඉටුකළ යුතු යුතුකම් හඳුනාගෙන සටහන් කරන්න.
කණ්ඩායම් 4. මිනිසෙකු විසින් අනෙකුත් ජීවීන්ට ඉටුකළ යුතු යුතුකම් අධ්‍යයනය කොට ලියන්න.
කණ්ඩායම් 5. ඔබ මැවුම්වල වගකීම් ඉටුකළ අවස්ථා 4 ක් සාකච්ඡා කොට සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 4.0 : ඉස්ලාමීය පවුල් ජීවිතයට අදාළ මගපෙන්වීම් ලබා ඒ අනුව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 4.1 : පවුලේ වගකීම් හඳුනාගෙන හැඟීම්බරව හා නිවැරදිව ඉටුකරයි.

ක්‍රියාකාරකම 4.1.7 : "මධ්‍යස්ථ භාවය රකිමු"

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.7.1 ඇතුළත් චිත්‍රය රූප සටහන
- ඇමුණුම 4.1.7.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.7.1 :
- ඇමුණුම් 4.1.7.1 හි ඇතුළත් රූප සටහන O. H. P උපකාරයෙන් දර්ශනය කොට හෝ කළු ලෑල්ලේ ඇඳ විස්තර කරන්න.
- ඒ පිළිබඳව සිසුන්ගෙන් විමසා ඔවුන්ගේ අදහස් හා අත්දැකීම් මතුකිරීමට අවස්ථාව දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - ඉස්ලාමීය ෂරීආව මධ්‍යස්ථභාවයෙන් යුක්ත බව.
> - අධ්‍යාත්මික හා ලෞකික ඇතුළත් ජීවිතයේ සියළුම අංශවල මධ්‍යස්ථභාවය රැකිය යුතු බව
> - මෙම උම්මතය මධ්‍යස්ථභාවයෙන් යුත් සමාජයක් බව.
> - මධ්‍යස්ථ බව රැකීමට අපොහොසත් වූ අය මං වරදාගෙන ඇති බව එපමණක් නොව විනාශ වූ බව.

පියවර 4.1.7.2 :
- සිසුන් කණ්ඩායම් වලට වෙන් කරන්න.
- එකිනෙක කණ්ඩායම් වලට ඇමුණුම් 4.1.7.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- අවශ්‍යවන ෆෙල්ට් පෑන් හාෆ්ෂීට් සපයන්න.
- ගවේෂණ පත්‍රිකාව ක්‍රියාත්මක කිරීම සඳහා සාකච්ඡා කිරීමට යොමු කරන්න.
- එය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 4.1.7.3 :
- කණ්ඩායම්වල නිර්මාණ ඉදිරිපත් කිරීමට ඒ ඒ කණ්ඩායම් වලට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.


- පහත සඳහන් කරුණු සමාලෝචනය කරන්න.

> - මධ්‍යස්ථ ප්‍රතිපත්ති හා චින්තනයෙන් ලොව ජයගත් බව.
> - ඉස්ලාමීය ෂරීආව මධ්‍යස්ථ ජීවන ක්‍රමයක් බව.
> - නබි (සල්) තුමා මධ්‍යස්ථභාවයෙන් යුතු ජීවිතය අගය කළ බව.
> - මධ්‍යස්ථභාවයෙන් මිදී කටයුතු කිරීමට උත්සාහගත් සමහර සහාභිවරුන් නබි (සල්) තුමා නිවැරදි කළ බව.
> - සමූහයා මධ්‍යස්ථ බව නොරැකීම තුළින් තම නබිවරු පවා ඝාතනය කළ බව.
> - මධ්‍යස්ථභව නොරැක, සීමාව දැඩි ව කටයුතු කළ අය විනාශ වූ බව නබි වැකියකින් කියැවෙන බව
> - ෂරීඅතය අවබෝධකොට නොගෙන මධ්‍යස්ථ භාවයෙන් මිදුණු පිරිස් වැරදි මග ගිය බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- ඉස්ලාමීය වගකීම් වල අන්තර්ගත වී ඇති මධ්‍යස්ථභාවය අදාළ අංක සොයා සටහන් කරයි.
- ආගමේ නාමයෙන් මධ්‍යස්ථ භවෙන් මිදී කටයුතු කරන අවස්ථා හඳුනාගෙන පවසයි.
- ඉස්ලාමීය ෂරීඅතය මධ්‍යස්ථභාවය රකින බව දැන පිළිපදියි.
- මධ්‍යස්ථ භාවය රැකීමට අපොහොසත් වන්නන් නිවැරදි මාර්ගයේ යොමු කරයි.

ඇමුණුම 4.1.7.1




Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

“එසේම ඔබලා අප මධ්‍යස්ථ සමාජයක් බවට පත් කළෙමු. ' ඔබලා අනෙකුත් මිනිසුන්ට සාක්ෂිකරුවන් ලෙස පෙනී සිටීම සඳහා ය.

”කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- කණ්ඩායමේ සියළු දෙනා ගවේෂණ පත්‍රිකාව කෙරෙහි මුළු අවධානය යොමු කරන්න.
- එකිනෙක කණ්ඩායම් වාර්තාව ඉදිරිපත් කිරීමට සූදානමින් සිටින්න.

ඇමුණුම 4.1.7.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. ඉස්ලාමයේ ප්‍රධාන වගකීම්වල අන්තර්ගත වී ඇති මධ්‍යස්ථ බවේ ලක්ෂණයන් හඳුනාගෙන සටහන් කරන්න.

කණ්ඩායම් 2. ආගමික කටයුතු වලදී මිනිසුන් මධ්‍යස්ථභාවය රැකීමට අපොහොසත් වන අවස්ථා 5ක් හඳුනාගෙන සටහන් කරන්න.

කණ්ඩායම් 3. ඉස්ලාමීය ෂරීඅතයේ ඇති මධ්‍යස්ථභාවයේ ලක්ෂණ හඳුනා ගන්න.

කණ්ඩායම් 4. මධ්‍යස්ථභාවය රැක මිනිස් සමාජය සුමගට යොමුකළ හැකි මාර්ග 5 ක් සොයා සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 5.0 : ඉපැයුම් හා ආදායම්වල දී හලාල් පිළිපදිමින් හරාමයෙන් වැළකී විශ්වාසවන්තව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 5.1 : ආර්ථික කටයුතු පිළිබඳ ඉස්ලාමීය දේශන නිවැරදිව වටහා ගනියි.

ක්‍රියාකාරකම 5.1. : ඉපයීමේ වැදගත්කම දැන ගනිමු

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.1.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 5.1.1. 2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.1 .1 :
- ඇමුණුම 5.1.1. හි ඇතුළත් සිද්ධිය කියවන්න. අනතුරුව එම සිද්ධිය පිළිබඳ සාකච්ඡා කරන්න.
- රැකියාවන් කිරීමේ අවශ්‍යතාවය හා ඉස්ලාම් එයට දී ඇති වැදගත්කම පිළිබඳව ශිෂ්‍ය අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු තහවුරු වනසේ සාකච්ඡා කරන්න.

> - උපයා ජීවත්වන ලෙස ඉස්ලාම් පවසන බව.
> - උපයන්නන්ව නබි (සල්) තුමා ගරුසරු කළ බව.
> - සෑම කෙනෙකුම තමන්ට සුදුසු රැකියාවක යෙදිය යුතු බව.
> - රැකියාවේදී ඉස්ලාමීය නීති පිළිපැදිය යුතු බව.

පියවර 5.1.1.2 :
- පන්තිය කණ්ඩායම් වලට බෙදන්න.
- ඇමුණුම් 5.1.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- ඩිමයි කඩදාසි හා පෑන් සපයන්න.
- විවාදයේ ලකුණු ප්‍රදානය කරන අයුරු හඳුන්වා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරිත්වයේ ඔවුන්ගේ දායකත්වය තහවුරු කරන්න.

පියවර 5.1.1.3 :
- ඒ ඒ කණ්ඩායම් වලට තමාම සැපයූ මාතෘකාව ඔස්සේ විවාද කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

● පහත කරුණු ඔස්සේ සාකච්ඡාවේ යෙදෙන්න.

- සලාතය අවසන් වූ ලෝකයේ ඇවිද ගොස් සැරිසරා උපයා ජීවත්වන ලෙස කුර්ආනය පවසන බව.
- නබි (සල්) තුමා එළුවන් රැක බලාගැනීම, ව්‍යාපාර කිරීම යනාදී රැකියාවල නියුක්ත වූ බව.
- ඉපැයීමේ කටයුතුවල යෙදෙන්නන් දැක නබි (සල්) තුමා සතුටු වී ඔවුන් ගේ දෑත් සිප ගත් බව.
- ඉස්ලාමීය දේශනාවන්ට අනුකූලව මුස්ලිමෙකු රැකියා කරන විට මෙලොව ජීවිතය සමෘද්ධිමත් වන අතර පරලොව දිවිය ශ්‍රේෂ්ඨ වන බව.
- සිඟමන් ජීවිතය ඉස්ලාම් හෙළාදකින අතර අනුන්ටත් සපයමින් ජීවත්වීම ඉස්ලාම් අගය කරන බව.
- මුස්ලිම් සමාජය අවශ්‍ය වන සියළු මාර්ග වලින් ඉපැයීම් කළ යුතු බව.
- එසේ ඉපැයීම ෆර්ලු කිෆායා වන බව.
- ඉස්ලාමයේ මූලික වගකීම වන සකාතය හා සදකාව ඉටු කළ හැක්කේ ඉපයීමෙන් පමණක් බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- ඉපයීම් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨිකෝණය විස්තර කරයි.
- උපයා ජීවත්විය යුතුය යන හැඟුමින් එම කුසලතා වර්ධනය කරයි.
- සුදුසු රැකියාවක් තෝරා හලාල් වූ ක්‍රමයට ඉපයීම කළ යුතුය යන ආකල්පය ලබා ගනී.
- උපයන්නන් අගය කරමින් ගරු කරමින් සහයෝගය දක්වමින් ජීවත්වෙයි.
- කිසිම රැකියාවක් අල්පකොට නොසළකයි.

ඇමුණුම් 5.1.1.1

විස්තර පත්‍රිකාව

නබි (සල්) තුමා වෙත කෙනෙකු සිඟමන් ඉල්ලා පැමිණියේය. එවිට නබි(සල්)තුමා ඔහුගේ නිවසේ තිබූ පොරෝනයක් හා භාජනයක් ගෙන්වා ඩිනාර් දෙකකට වෙන්දේසි කළේය. ඩිනාර් 1ක් නිවසේ වියදමට දී අනෙක් ඩිනාරයෙන් පොරොවක් මිල දී ගෙන තම අතින්ම මිටක් සවි කර දුන්නේය.

අනතුරුව දින 15කට පසුව තමන් හමු වන ලෙස නබි (සල්) තුමා එම සිඟන්නාට පැවසූහ. එසේ නැවත පැමිණි ඔහු තමාට තෘප්තිමත් ආදායමක් ලැබෙන බව සතුටින් ප්‍රකාශ කළේය. එවිට නබි තුමාණන් සිඟා කා ජීවත්වී අවසාන දිනයේ මුහුණේ කළු ලපත් සමග පැමිණෙනවාට වඩා මෙම රැකියාව ඔබට ශ්‍රේෂ්ඨ වේ යනුවෙන් පැවසූහ.

ඇමුණුම් 5.1.1.2

කණ්ඩායම් ගවේෂණ උපදෙස් : ● තමන්ට ලබාදී ඇති මාතෘකාවට අනුකූලව සෑම කණ්ඩායමක්ම විනාඩි 15ක් සාකච්ඡා කොට විවාදයට සූදානම් වන්න.

කණ්ඩායම් 1. රැකියාවක් කොට ජීවත්වීම ඉස්ලාම් අගය කරයි.
කණ්ඩායම් 2. රැකියාවට වඩා නැමදුම් කොට ජීවත්වීම ඉස්ලාමය අගය කරයි.
කණ්ඩායම් 3. රැකියාවේ යෙදීම ඉබාදතයකි.
කණ්ඩායම් 4. රැකියාව හා ඉබාදත් අතර කිසිදු සබඳතාවක් නොමැත.



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 5.0 : ඉපැයුම් හා ආදායම්වල දී හලාල් පිළිපදිමින් හරාමයෙන් වැළකී විශ්වාසවන්තව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 5.1 : ආර්ථික කටයුතු පිළිබඳ ඉස්ලාමීය ඉගැන්වීම් නිවැරදිව වටහා ගනී.

ක්‍රියාකාරකම 5.1.2 : රැකියාවේ අගය දැන ගනිමු

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.1.2.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 5.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.2.1 :
- ඇමුණුම 5.1.2.1 හි ඇතුළත් තොරතුරු කියවා සිසුන්ගේ ශ්‍රවණයට යොමු කරන්න.
- රැකියාවේ අගය පිළිබඳව සිසුන්ගේ දැනුම එළි දැක්වීමට අවස්ථාව දෙන්න.
- පහත කරුණු සාකච්ඡා කරන්න.

> - උපයා ජීවත්වන ලෙස අල්ලාහ් කුර්ආනයේ දිරිගන්වා ඇති බව.
> - සියලුම නබිවරු තම ජීවන අවශ්‍යතා ඉටු කර ගැන්ම සඳහා රැකියාවක් කර ඇති බව.
> - සහාභාවරුන්ගේ ඉපයීම් මාර්ග අපහට මහ පෙන්වීමක් හා පෙළඹවීමක් වන බව.
> - ඉස්ලාම් අනුමත කළ ඉපැයීම් මාර්ගවල පමණක් යෙදිය යුතු බව.

ඇමුණුම් 5.1.2.2 :
- පන්තිය කණ්ඩායම් වලට බෙදන්න.
- ඇමුණුම් 5.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව, ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට මඟ පෙන්වන්න.
- සොයාගත් කරුණු පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස උපදෙස් දෙන්න.

පියවර 5.1.2.3 :
- කණ්ඩායම් සොයාගත් කරුණු පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට එම කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම් වලටත් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු තහවුරු වන සේ සමාලෝචනය කරන්න.

> - සලාතය (ජුම්ආ) අවසන් වූ විට සැරිසරා අල්ලාහ්ගේ දායදයන් සොයා ලබා ගත යුතු (62:10) බව.
> - තම දැතින් උපයා අනුභව කරන ආහාරය තරම් වෙන කිසිදු ආහාරයක් උසස් නොවන බව. (බුහාරි)
> - සිඟා කා ජීවත්වීම ඉස්ලාම් පහත් කොට සලකන බව.
> - විරැකියාවෙන් පසුවන්නන් උදෙසා තාවකාලික විසඳුම් නොව ස්ථිර විසඳුම් සොයා ගත යුතු බවට නබි (සල්) තුමාගේ ජීවිතය උසස් ආදර්ශ දක්නට ඇති බව.
> - ඉපයීමෙන් තොරව මස්ජිදයේ රැඳී සිටි පුද්ගලයා, උමර් (රළි)-තුමාගේ විවේචනයට ලක් වූ බව.
> - ෂරීඅතය අනුමත කළ ඕනෑම රැකියාවක් අල්ලාහ්ගේ දායාදයන් උකහා දෙන බව.
> - රැකියාවේ තත්ත්වයන් අනුව වෙනස්කම් නොපෑ යුතු බව.
> - කඩිනමින් උපයා දියුණු විය යුතුය යන ආකල්පයෙන් හරාම් වූ මාර්ග වලට අවතීර්ණ නොවිය යුතු බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- ඉපැයීමේ වැදගත්කම හා ශ්‍රේෂ්ඨ බව දැන පවසයි.
- ඉස්ලාම් අනුමත කළ හලාල් වූ රැකියා මාර්ග පමණක් භාවිත කළ යුතු බව පිළි ගනියි.
- ෂරීඅතය අනුමත කළ සියළු රැකියාවන් සමානත්වයෙන් සලකා තමාට
- සමාජයේ රැකියා විරහිතයන්ට රැකියා කිරීමට මග පෙන්වයි.

ඇමුණුම 5.1.2.1

විස්තර පත්‍රිකාව

එක් උදෑසනක උමර් (රළි) තුමා මස්ජිදයට ඇතුළු විය. එවිට මිනිසුන්ගෙන් කොටසක් එහි ප්‍රාර්ථනයේ යෙදී සිටිනු දුටුවේය. ඔවුන් අමතා ඔබෙන් කිසිවෙක් ඉපයීමෙන් තොරව ආදායම් සොයා බැහැර වීමෙන් තොරව නොසිටිය යුතුයි. අල්ලාහ් දෙවියනි ! මට ආහාර සපයනු මැන යනුවෙන් ප්‍රාර්ථනා කිරීම පමණක් නොසෑහේ. මන්ද යත් රන් හෝ රිදී (ඉපයීමෙන් තොරව) අහසෙන් කිසි විටෙකත් කඩා නො හැලෙනු ඇත යනුවෙන් හේ පැවසුවේය.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- ගවේෂණ පත්‍රිකාව ලබා ගෙන ඒ අනුව කටයුතු කරන්න.
- ලබා ගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම්වන්න.

ඇමුණුම් 5.1.2.1

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. ඉපැයීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කරවන අයුරින් විනාඩි 3ක කතාවක් සූදානම් කරන්න.

කණ්ඩායම් 2. ඉපයීමට ඉස්ලාම් ලබා දී ඇති වැදගත්කම දක්වන ඓතිහාසික සිද්ධීන් සොයා ලියන්න.

කණ්ඩායම් 3. "හලාල් වූ රැකියාවක පමණක් නිරත විය යුතුය. කොපමණ විශාල ආදායමක් ලබා දුන්නත් හරම් වූ දැ වලින් ඉවත්විය යුතුය" යන කියමන සාධාරණ බව තහවුරු කිරීමට කරුණු සොයා ලියන්න.

කණ්ඩායම් 4. "තමා උගත් රැකියාවක් තවත් කෙනෙකුට ඉගැන්වීම සදකාවකි" යන කියමන වත්මන් සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ඔබේ හැඟීම සටහන් කරන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 5.0 : ඉපැයුම් හා ආදායම් වල දී හලාල් පිළිපදිමින් හරාමයෙන් වැළකී විශ්වාසවන්තව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 5.2 : ආර්ථික කටයුතු පිළිබඳ නීතිරීති පුළුල්ව වටහා ගනිමින් සමාජ ජීවිතයේ ක්‍රියාවට නගයි.

ක්‍රියාකාරකම 5.2.1 : වෙළෙඳ කටයුතුවල ඉස්ලාමීය ක්‍රම විධි දැන ගනිමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.2.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 5.2.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්
- ඉස්ලාම් පෙළපොත 10 ශ්‍රේණිය (2000 මුද්‍රණය)

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.2.1.1 :
- ඇමුණුම 5.2.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව කියවන්න.
- මෙම සිද්ධිය පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- වෙළෙඳාම පිළිබඳ සිසුන්ගේ අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව සපයන්න.
- පහත කරුණු සාකච්ඡා කරන්න :

> - ඉපයුම් ක්‍රම අතර වෙළෙඳාම ශ්‍රේෂ්ඨ ක්‍රමයක් බව.
> - සාධාරණ වෙළෙන්දන් පරලොව දී නබිවරුන් සමග සිටින බව.
> - වෙළෙඳාම් කටයුතුවල පිළිපැදිය යුතු පිළිවෙත් ඇති බව.
> - වෙළෙඳාමේ දී තහනම් කළ කරුණු ද පවතින බව.
> - පොළිය මිශ්‍ර වූ ගනුදෙනු තහනම් කර ඇති බව.

ඇමුණුම් 5.2.1.2 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 5.2.1.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව හා ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් සපයන්න.
- කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- ඔවුන් සොයාගත් කරුණු ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 5.2.1.3 :
- සිසුන් සොයාගත් කරුණු ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- අමතර කරුණු ඉදිරිපත් කිරීමට කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - යම් භාණ්ඩයක් අදාළ වටිනාකම ගෙවා ලබාගැනීම වෙළෙඳාමක් වන බව හා මෙය ඉස්ලාම් අනුමත කරන බව.
> - ව්‍යාපාරික කටයුතුවල සාධාරණත්වය හා සත්‍යය පිළිපැදීම හේතුකොට ගෙන පරලොව ජීවිතය යහපත් වී උසස් තත්ත්වයන් ලබාගත් නබිවරු, සිද්ධීකීන් හා ප්‍රභූවරුන් සමග සිටීමේ භාග්‍යය ලැබෙන බව.
> - ඉස්ලාමයේ ගැණුම්කරු, විකුණුම්කරු, වෙළෙඳ භාණ්ඩ යනාදියට සමහර කොන්දේසින් පනවා ඇති බව, ඒවා පිළිපැදිය යුතු බව.
> - සමහර භාණ්ඩ විකිණීම තහනම් බව
>   උදාහරණ : නජීස් වූ හා ප්‍රයෝජනයක් නැති භාණ්ඩ
>   සමහර කරුණු වළක්වාගත යුතු බව
>   උදාහරණ : බොරුව, සොරකම, සඟවා තැබීම, බාල කිරීම යනාදිය
> - පොළිය ඉස්ලාම් තදින් හෙලා දකින අතර ඒ හා සම්බන්ධ වූ සියළු දෙනා දේව ශාපයට ලක්වන බව.
> - පොළියෙන් වැළැකී වෙළෙඳාම් කළ යුතු බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- වෙළෙඳාමේ වැදගත්කම හා එහි නීතිරීති දැන කටයුතු කරයි.
- වෙළෙඳ කටයුතුවල සිදුවන වැරදි ක්‍රියාවන් හා නිවැරදි ක්‍රියාවන් හඳුනා ගනියි.
- විකිණීමේ හා මිලදී ගැනීමේ දී සාධාරණ පිළිවෙත් හා සත්‍යය අනුගමනය කළයුතු බව පිළිගනියි.
- ගනුදෙනුවල දී සාධාරණ පිළිවෙත් අනුගමනය කරයි.

ඇමුණුම 5.2.1.1

විස්තර පත්‍රිකාව

දිනක් නබි (සල්) තුමාණෝ මදීනාවේ වෙළෙඳපොළට ගියහ. බොහෝ දෙනෙකු ව්‍යාපාරික කටයුතුවල යෙදෙනු එතුමාගේ අවධානයට ලක්විය. එක් ස්ථානයක ධාන්‍ය තොගයක් විකිණීම සඳහා සූදානම් කොට තිබිණි. එම ධාන්‍ය තොගය තුළට නබි(සල්)තුමා තම අත යොමු කරන ලදී. එවිට එය තෙත්වී ඇති බව වැටහුනි. තෙත්වූ එම ධාන්‍යයෙන් කොටසක් සුරතට ගෙන ඊට හේතුව ව්‍යාපාරිකයාගෙන් විමසූහ.

රාත්‍රියේ වැස්සට තෙමුණු බවත්, තෙත්වූ ධාන්‍ය වැසීම සඳහා වියලුනු ධාන්‍ය මතුපිටින් අතුරනු ලැබූ බවත් ඔහු පැවසුවේය.

එවිට නබි (සල්) තුමා ‘‘කවරකු අපහට වංචා කරන්නේ ද ඔහු අපට අයත් කෙනෙකු නොවේ’’ යනුවෙන් පැවසූහ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ගවේෂණ පත්‍රිකාව ලබා ගන්න. කණ්ඩායමේ සියළු සාමාජිකයන් පූර්ණ අවධානය ඒ කෙරෙහි යොමු කරන්න.
- සාකච්ඡා කර ලබා ගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 5.2.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. පවතින වෙළෙඳ කටයුතුවල සිදුවන යහපත් හා අයහපත් අංග හඳුනා ගන්න.

කණ්ඩායම් 2. 10 ශ්‍රේණියේ ඉස්ලාම් පෙළපොත ආශ්‍රයෙන් (2000 මුද්‍රණය) වෙළෙඳාම පිළිබඳ අර්කුර්ආන් වැකි හා අල්හදීස් රැස් කරන්න.

කණ්ඩායම් 3. වෙළෙඳාම පිළිබඳ ඔබේ අත්දැකීම් සාකච්ඡා කොට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම් 4. වර්තමාන වෙළෙඳ ලෝකයේ සිදුවන වංචා ලැයිස්තුගත කරන්න. පාරිභෝගිකයින් ඉන් බේරා ගැනීම උදෙසා කළ හැකි දෑ යෝජනා කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 5.0 | : | ඉපැයුම් හා ආදායම්වල දී හලාල් පිළිපදිමින් හරාමයෙන් වැළකී විශ්වාසවන්තව කටයුතු කරයි. |
| නිපුණතා මට්ටම 5.2 | : | ආර්ථික කටයුතු පිළිබඳ නීතිරීති පුළුල් ව වටහා ගනිමින් සමාජ ජීවිතයේ ක්‍රියාවට නගයි. |
| ක්‍රියාකාරකම 5.2.2 | : | කෘෂිකර්මය හා ව්‍යාපාරවල අගය හා වැදගත්කම අවබෝධ කර ගනිමු. |
| කාලය | : | විනාඩි 80 |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇමුණුම 5.2.2.1 ඇතුළත් විස්තර පත්‍රිකාව<br>● ඇමුණුම 5.2.2.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව<br>● ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්<br>● තර්ජමතුල් කුර්ආන් - (කුර්ආන් පරිවර්තනය) |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.2.2.1 :

- විස්තර පත්‍රිකාව කියවීමෙන් කෘෂිකර්මාන්තයේ වැදගත්කම පවසන්න.
- කෘෂිකර්මාන්තය හා කර්මාන්ත සම්බන්ධව සිසුන්ගේ අත්දැකීම් පැවසීමට අවස්ථාව දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

- මිනිසා තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කෘෂිකර්මාන්තය හා කර්මාන්ත යනාදියෙහි යෙදිය යුතු බව.
- නබිවරු කෘෂිකර්මාන්තයේ හා කර්මාන්ත යනාදියේ යෙදුණු බව.
- භූමිය මුඩුවීමට නොදී එය නිෂ්පාදනයක් සඳහා භාවිත කළයුතු බව.
- කර්මාන්ත යනාදියෙහි නිරතවීම තුළින් පුද්ගල හා සමාජ සුබ සිද්ධිය සිදුවන බව.
- රැකියාවකට මඟ පෙන්වීම සුන්නත් වන බව.

පියවර 5.2.2.2 :

- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- ඇමුණුම් 5.2.2.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකා, ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් සපයන්න.
- කණ්ඩායම් ගවේෂණයන්ට යොමු කරන්න.
- ඔවුන් සොයාගත් කරුණු ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 5.2.2.3 :

- කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- අමතර තොරතුරු සැපයීමට එම කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු සමාලෝචනය කරන්න.

|  |
|---|
| • මිනිසාගේ ආහාර, ඇඳුම් යනාදී මූලික අවශ්‍යතා සපුරා ගැනීමට රැකියා මගින් මහ පෙන්වා ඇති බව.<br>• ප්‍රථම මිනිසා වූ ආදම් (අලෛ) කෘෂිකර්මාන්තය තම ජීවනෝපාය කර ගත් බව.<br>• කෘෂිකර්මය මගින් භූමිය ප්‍රයෝජනවත් ලෙස මෙහෙයවන අතර ඉන් ඵල ලබන මිනිසුන්, පක්ෂීන්, සතුන් නිසා ආනිශංස ලැබෙන බව.<br>• කර්මාන්ත මගින් ඉපයීමෙන් ලබාගන්නා ආහාරය ශ්‍රේෂ්ඨ වන බව.<br>• නබි දාවූද් (අලෛ) හා සකරියියා (අලෛ) කර්මාන්ත කර ජීවත් වූ බව.<br>• මුස්ලිම් සමාජය තුළ විවිධාකාර අවශ්‍යතා ඇති බව. ඒවා සපුරා ගැනීම සඳහා කර්මාන්තවල නිරත විය යුතු බව.<br>• තමා දන්නා කර්මාන්තය අන් අයට ඉගැන්වීම සුන්නත් වූ ඉබාදතයක් බව.<br>• කර්මාන්ත කරන්නන් දිරිගන්වා උනන්දු කළ යුතු බව. |

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- කෘෂිකර්මාන්තයේ හා කර්මාන්තවල යෙදීමේ අවශ්‍යතා ද ඒවායේ ප්‍රයෝජනයන් ද ඒ සඳහා ඉස්ලාමයේ දිරිගැන්වීම් ද ලියා දක්වයි.
- ජීවිතය පවත්වාගෙන යාමට කෘෂිකර්මය හා කර්මාන්තවල අවශ්‍යතාව පිළිගනියි.
- ඉස්ලාම් පවසන අයුරු රැකියා කොට ජීවත් විය යුතු බව පිළිගනියි.
- රැකියා හා එම රැකියා කරන්නන් අගය කරමින් කටයුතු කරයි.

ඇමුණුම 5.2.2.1

විස්තර පත්‍රිකාව

වරෙක නබි (සල්) තුමා එක් ගම් වැසියෙකු බලා පහත සඳහන් සිද්ධිය පැවසූහ.

ස්වර්ග වැසියන්ගෙන් කෙනෙකු තම දෙවියා වෙත කෘෂිකර්මාන්තය සඳහා අවසර පතයි. එවිට අල්ලාහ් ඔබ කැමැති අයුරින් (සතුටෙන්) දැනට ජීවත්වනවා නේ දැයි අසයි. එයට ඔහු එසේමය. (මා ආසා කළ අයුරින්ම ජීවත්වෙමි) නමුත් මා පොළොව කොටා ධාන්‍ය වගා කිරීමට කැමැත්තෙමි, යනුවෙන් පවසයි. (අල්ලාහ් ද ) ඔහුට අවසර දෙයි. ඒ මිනිසා ස්වර්ගයේ භූමියේ බීජ වපුරයි. නිමේෂයකින් එවා පැළ වී පරිණත වී ඵල දැරීමට සූදානම් වේ. කන්දක් මෙන් වර්ධනය වී පැතිරී පවතී. එවිට අල්ලාහ් ආදම්ගේ දරුවනේ ඇති තරම් ලබා ගන්න. කිසිවක් ඔබ තෘප්තිමත් නොකරයි, යනුවෙන් පවසයි.

(දැනුම් දුන්නේ අබූහුරෙයිරා රළි
මූලාශ්‍රය - බුහාරි)

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- කණ්ඩායමේ සියළු දෙනා ගවේෂණ ක්‍රියාවලියට දායක වන්න.
- සොයාගත් දෑ පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 5.2.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. කෘෂිකර්මාන්තය හා කර්මාන්ත යනාදියේ වැදගත්කම ගෙන හැර දක්වන කුර්ආන් වාක්‍ය දෙකක් ලියන්න.

කණ්ඩායම් 2. කෘෂිකර්මාන්තය හා කර්මාන්තවල වැදගත්කම පවසන හදීස් 4 ක් සොයා ලියන්න.

කණ්ඩායම් 3. කම්කරුවන්ට ඉස්ලාම් ලබාදී ඇති අයිතිවාසිකම් සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 4. කර්මාන්ත හා කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ මුස්ලිම් වරුන්ගේ දායකත්වය පිළිබඳ කෙටි දේශනයක් ලියන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 6.0 : ජීවිතයේ සියළු කටයුතු ෂරීආවේ දර්ශනයට අනුකූල ව ඉටු කරයි.

නිපුණතා මට්ටම 6.1 : අල්කුර්ආනය හා සුන්නාහ් නීති මූලාශ්‍ර වන්නේ කෙසේ දැයි අවබෝධ කොට එය අධ්‍යයනය කිරීම අරඹයි.

ක්‍රියාකාරකම 6.1.1 : අල්කුර්ආනය නීති මූලාශ්‍රයක් බව දැන ගනිමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 6.1.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 6.1.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව (ප්‍රමාණවත් පිටපත් ගණනක්)
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්
- අල්කුර්ආන් පරිවර්තනය

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.1.1.1 :
- ඇමුණුම් 6.1.1.1 අන්තර්ගත වී ඇති විස්තරය ශිෂ්‍යයෙකු ලවා ශබ්ද නඟා කියවීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - අල්කුර්ආන් යනු අල්ලාහ් විසින් නබි (සල්) තුමා වෙත පහළ කළ ධර්මය බව.
> - එය මුළුමනින්ම ආරක්ෂා කොට ගොනු කළ ග්‍රන්ථයක් වන බව.
> - සමස්ත ලෝක ජනතාවට මඟ පෙන්වීම සඳහා එය පහළ වූ බව.
> - එහි වැදගත්කම රාශියක් හා ප්‍රාතිහාර්ය ද අන්තර්ගත වී ඇති බව.

පියවර 6.1.1.2 :
- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- ඇමුණුම් 6.1.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව කණ්ඩායම්වලට සපයන්න.
- සෑම කණ්ඩායමකට සාකච්ඡා කිරීමට අවස්ථාව දෙන්න.
- එය නිරීක්ෂණය කොට මඟ පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 6.1.1.3 :
- කණ්ඩායම්වල සොයා ගැනීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඉදිරිපත් කළ කරුණුවලට අමතර වශයෙන් නිර්මාණාත්මක කරුණු ඉදිරිපත් කිරීමට එම කණ්ඩායමට හා අන් කණ්ඩායම් වලට අවස්ථාව දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනය කරන්න.

> - මිනිස් ජීවිතයට නීතිරීති ඉතාමත් අවශ්‍ය බව.
> - නීති සාධාරණ හා අපක්ෂපාතී විය යුතු බව.
> - අල්කුර්ආනය විශ්වය හා එහි ඇති සියළු ජීවීන් මැවූ අල්ලාහ් විසින් දායාද කළ නීති ග්‍රන්ථයක් වන බව.
> - අල්කුර්ආනය කිසිදු අඩු කිරීමකට හෝ වැඩි කිරීමකට භාජනය නොවූ ග්‍රන්ථයක් බව
> - මේ අනුව මෙය සියලු කාලවලට හා සියළු ජනතාවට සුදුසු ග්‍රන්ථයක් වන බව.
> - මිනිසුන් වර්ණය අනුව හෝ ජාතිය අනුව හෝ වෙන් කර නැති බව.
> - අවසාන වශයෙන් පහළ වූ දේව ධර්මය අල්කුර්ආනය වන බැවින් එය අංග සම්පූර්ණ නීති මූලාශ්‍රයක් බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- අල්කුර්ආනයට අදාළ නිර්වචනය දැන පවසයි.
- අල්කුර්ආනය නීති මූලාශ්‍රයක් වන බවට සාධක ඉදිරිපත් කරයි.
- අල්කුර්ආනය විශ්වාසවන්ත ග්‍රන්ථයක් බවට කරුණු ඉදිරිපත් කරයි.
- අල්කුර්ආනය දිනපතා පාරායනය කරමින් එහි අර්ථය හා විස්තරය අවබෝධ කර ගැනීමට කාලය වෙන් කරයි.
- තම නිවසේ හා මස්ජිදයේ අල්කුර්ආනය අධ්‍යයනය කිරීම සඳහා පොදු වැඩ සටහන් සංවිධානය කරයි.

ඇමුණුම 6.1.1.1

විස්තර පත්‍රිකාව

අල්කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමේ වගකීම භාරගත් සෙයිද් බින් සාබිත් (රළි) තුමා සහාබිවරුන් වෙත තිබෙන පුරාතන සටහන් රැගෙන එන මෙන් ඉල්ලීය. එය ගොනු කිරීමේ දී කොන්දේසි 2 ක් සපුරන වාක්‍ය පමණක් කුර්ආන් වැකි වශයෙන් සකසනු ලැබීය.

1. නබි (සල්) තුමා ඉදිරියේ නිවැරදි කරන ලද පුරාතන සටහන් දෙකක්
2. එය සෙයිද් බින් සාබිත් (රළි) තුමා සතුව තිබිය යුතුය.

හුසෙයිමා ඉබ්නු අන්සාරි (රහ්) තුමා සූරතුන් තව්බාහි අවසාන ආයත් දෙක ලිඛිතව ගෙන එන ලදී. එය සෙයිද් (රළි) තුමානට ද කටපාඩම් වී තිබිණි. එනමුත් පළමු කොන්දේසිය සපුරා නොමැති බැවින් මෙය කුර්ආන් වැකියක් ලෙස සලකන්නේ ද ?

සෙයිද් (රළි) තුමාට මෙය පිළිගැනීමටත් නොහැකි ප්‍රතික්ෂේප කිරීමටත් නොහැකි ගැටළු සහගත තත්ත්වයක් මතුවිය. මේ අවස්ථාවේ හුසෙයිමා ! ඔබගේ එක් සාක්ෂියක් සාක්ෂි දෙකකට සමානය යනුවෙන් නබි(සල්)තුමා ගේ ප්‍රශංසා වැකිය ගැටළුවට විසඳුමක් විය. මෙම වැකිය අල්කුර්ආන් වැකියක් ලෙස කුර්ආනයට අන්තර්ගත කරන ලදී.

නබි(සල්) තුමාගේ වැකිය සත්‍ය බව දුටු නබි මිත්‍රයන් විශ්මයට පත් විය.



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
- වාර්තාව සකසා පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම : 6.1.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. අල්කුර්ආනයේ අනන්‍යතාවට අනුකූල නිර්වචනයක් සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 2. අල්කුර්ආනය ප්‍රධාන නීති මූලාශ්‍රයක් ලෙස සැලකීමට සාධාරණ හේතු 3 ක් සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 3. ගනුදෙනුවලදී පිළිපැදිය යුතු නීතිරීති පවසා එයට පාදක වන අල්කුර්ආන් වාක්‍ය සොයා ලියන්න.

කණ්ඩායම් 4. "අල්කුර්ආනයේ නීතිරීති අපක්ෂපාතී වේ". මෙම කියමන සාධාරණ බව ඔප්පු කිරීමට අවශ්‍ය කරුණු ලියා දක්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 6.0 | : | ජීවිතයේ සියළු කටයුතු ෂරීආවේ දෘෂ්ටි දර්ශනයට අනුකූල ව ඉටු කරයි. |
| නිපුණතා මට්ටම 6.1 | : | අල්කුර්ආනය හා සුන්නාව නීති මූලාශ්‍ර වන්නේ කෙසේ දැයි අවබෝධ කොට එය අධ්‍යයනය කිරීම අරඹයි. |
| ක්‍රියාකාරකම 6.1.2 | : | සුන්නා අපගේ දෙවන නීති මූලාශ්‍රය බව දැන ගනිමු. |
| කාලය | : | විනාඩි 40 |
| ගුණාත්මක යෙදවුම් | : | • ඇමුණුම 6.1.2.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව<br>• ඇමුණුම 6.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව රියාලුස් සාලිහීන්<br>• හදීස් ඉතිහාසය හා වැදගත්කම (ආචාර්ය එම්. ඒ. එම්. ෂුක්රි)<br>• ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.1.2.1 :

- ඇමුණුම 6.1.2.1 හි ඇතුළත් ඓතිහාසික සිද්ධිය පන්තියට ඉදිරිපත් කිරීමේ අවස්ථාව ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන ශිෂ්‍යයන්ට ලබා දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - නබි (සල්) තුමාගේ වචන ක්‍රියා හා අනුමත කිරීම් සුන්නා වන බව.
> - අල්කුර්ආනයට පසුව දෙවන මූලාශ්‍ර වන්නේ සුන්නා බව.
> - කුර්ආනයට විස්තර කිරීමක් ලෙස සුන්නා පවතින බව.
> - අල්කුර්ආනය මෙන් සුන්නාව ද විශ්වාසවන්ත අයුරින් ආරක්ෂා වී ඇති බව.

පියවර 6.1.2.2 :

- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම් 6.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව කණ්ඩායම්වලට සපයන්න.
- අවශ්‍ය මූලාශ්‍ර පොත් සපයන්න.
- අවශ්‍යවන ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් සපයන්න.
- ඔවුන් ගවේෂණ ක්‍රියාවල යොදවා මඟ පෙන්වන්න.
- වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස උපදෙස් දෙන්න.

පියවර 6.1.2.3 :

- කණ්ඩායම් වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ අදහස්වල අඩුපාඩු සකස් කර ගැනීම සඳහා එම කණ්ඩායම් වලට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු සමාලෝචනය කරන්න.

> - හදීස්, සුන්නා යන පදවලට එකම අර්ථයක් ඇති බව.
> - හදීස් කුර්ආනයට විස්තරයක් වශයෙන් පවතින බව.
> - හදීස්, කියවා නොපෙන්වූ වහි (වහී හෙයිරු මත්ලූ:) වර්ගයේ අඩංගු බව.
> - හදීස් තාබිඊන්වරුන්ගේ කාලයේ ගොනු කළ බව.
> - හදීස් විශ්වාස කළ හැකි අයුරින් ගොනු කළ බව.
> - විවිධ හේතු නිසා ගොතන ලද හදීස් බිහිවූ බැවින්, හදීස් වර්ග කිරීමට සිදුවූ බව.
> - හදීස් හි ස්නාද්, මත්න් යනුවෙන් කොටස් දෙකක් ඇති බව.
> - සමහර සහාබාවරු අධික වශයෙන් හදීස් වාර්තා කළ බව.
> - හදීස්වල වැදගත්කම අවබෝධ නොවීම නිසා ඉස්ලාමීය විරෝධීන් හදීස් පිළිබඳ සැක මතුකර ඇති බව.
> - හදීසය හා සම්බන්ධ විවිධ කලාවන් බිහි වූ බව.
> - සමාජ අවශ්‍යතාවයට අනුකූලව විවිධාකාර හදීස් ග්‍රන්ථ බිහි වූ බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- හදීස් යනු කුමක්දැයි හඳුන්වන නිර්වචනය දැන පවසයි.
- හදීස් කව්ලි, ෆිඅලි, තක්රීර් යනාදිය අවබෝධ කොට ගෙන වර්ග කරයි.
- හදීස් නොමැතිව කුර්ආනය අවබෝධකර ගත නොහැකි බව හේතු සාධක සහිතව ඉදිරිපත් කරයි.
- හදීස් මූලාශ්‍රවලට අනුකූලව ක්‍රියා කරයි.
- මාතෘකා 5 ක් අන්තර්ගත හදීස් ගොනුවක් සකස් කරයි.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියළු දෙනා ඒ කෙරෙහි අවධානය යොමු කරන්න.
- සාකච්ඡා කොට වාර්තාව සකස් කර පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 6.1.2.1

විස්තර පත්‍රිකාව

හදීස්වල විශ්වසනීයත්වය

අල්කුර්ආනය මෙන්ම හදීස් ද රැකගත යුතුය යන අදහස තාබිඊන්වරුන්ගේ යුගයේ ඒකමතිකව පිළිගෙන තිබුණි. එනමුත් මෙය අල්කුර්ආනය මෙන් පහසු කාර්යයක් නොවන අතර සතිදෙක තුනකින් අවසන් කළ හැකි කාර්යයක් ද නොවීය. එබැවින් තම සියළු සැප හා සතුට අත්හැරීමට සූදානම් වූ පරිත්‍යාගශීලී හැඟීම් හා හැකියාවන්ගෙන් පෝෂිත බුද්ධිමත් භාවයෙන් යුත් යහ කැමැත්තක් ඇති කෙනෙක් මෙම කාර්ය කිරීමට කැපවීමෙන් ඉදිරිපත් වුණි. පහත සිද්ධියට හොඳින් සවන් දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

හදීස් එක්රැස් කිරීමේ කාර්යයට කැපවූ තබඋත්තාබිර්වරයෙක් තම ගමනට ඩිනාර් 300 ළඟ තබාගෙන මුහුදු ගමනක යෙදුණේය. එවිට ඔහු සමඟ තරුණයෙක් ළඟින් ආශ්‍රය කළේය. දිනක් තමන් ළඟ තිබූ ඩිනාර් 300 ක් කවුදෝ සොරකම් කළ බව මුහුදේ අප සමග ගමන් කරමින් සිටි පිරිස අතර ප්‍රචාරය වන අයුරින් හදිසියේ ප්‍රකාශ කළේය. මෙම සොරකම කළ පුද්ගලයා අල්ලාගැනීම සඳහා මගීන් පරීක්ෂාවට ලක් කරන ලදී. නමුත් ඔහු පැවසූ අයුරු කිසිවක් ළඟ ඩිනාර් 300 ක් දක්නට නොලැබුණි.

එම තරුණයා පුදුමයට පත්විය. මා ළඟින් ආශ්‍රය කළ එම ෂෙයිත් ළඟ තිබූ ඩිනාර් 300 ක් මුදලට කුමක් සිදුවුනාදැයි ඔහුට සිතාගත නොහැකි විය. එබැවින් ඔහු ළඟටම ගොස් විමසුවේය. ෂෙයික් පැවසූ පිළිතුර සියළු දෙනා මවිතයට පත් කළේය.

එම ෂෙයික් තරුණයා අමතා, ඔබේ ඩිනාර් 300 මුදල කවුරුන් හෝ සොරා ගෙන ඇති බව ඔබ දැනුම් දුන්විට, එය මගේ මුදල් පැහැර ගැනීම සඳහා ඔබ යෙදූ උපායශීලී මාර්ගයක් බව මම වටහා ගතිමි. එම මොහොතේම මාගේ මුදල් මුහුදට විසි කළෙමි. මන්දයත් එම මුදල් මා වෙත තිබී සොයාගත් විට, ඔබේ මුදල් සොරකම් කළ දෝෂ දර්ශනයට හා සැකයට ගොදුරු වීමට ලක්වෙමි. නබි (සල්) තුමාගේ හදීස් එක්රැස් කිරීමේ කර්තව්‍යයට මා ගොඩනගාගත් විශ්වාසනීයත්වය එමගින් බොඳවී යාමට හැකිය. එම නිසා මාගේ මුදල් වුවත් එය මුහුදට විසි කළෙමි යනුවෙන් පැවසීය.

මෙවන් විශ්මයජනක ක්‍රියාව කරමින් ඉතිහාසයට තම නම එක්කළ එම තබඋත්තාබිර් කවුරුන්දැයි ඔබ දන්නේ ද? ඔහු සහීහුල් බුහාරි නැමැති ග්‍රන්ථය අපට ලබාදුන් ඉමාම් බුහාරි (රහ්) තුමා වන්නේ ය.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබාගෙන ඒ අනුව කටයුතු කරන්න.
- වාර්තාව සකසා පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 6.1.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1.
- හදීසයට අදාළ නිවැරදි නිර්වචනය සොයා ලියන්න.
- හදීස්, කුර්ආනයට විස්තරයක් වන්නේ කෙසේදැයි සොයා ලියන්න.

කණ්ඩායම් 2.
- හදීස් වර්ග කොට දක්වන සටහනක් සකස් කරන්න.
- මුතවාතිර්, ආහාද් යන පද දෙකේ විස්තර සොයා ලියන්න.

කණ්ඩායම් 3.
- ගොතන ලද හදීස් බිහිවීමට හේතු සොයා සටහන් කරන්න.
- නබි(සල්) තුමාගේ යුගයේ හෝ සහහාවරුන්ගේ යුගයේ හෝ කුර්ආන් මෙන් හදීස් එක්රැස් නොකළේ මන්දැයි සොයා ලියන්න.

කණ්ඩායම් 4.
- හදීසය හා සම්බන්ධ කලාවන් කවරේදැයි සොයා ලියන්න.
- ප්‍රසිද්ධ හදීස් ග්‍රන්ථවල නම් සොයා ලියන්න.
- මුස්නද් අහ්මද් හා සහීහුල් බුහාරි හදීස් ග්‍රන්ථ අතර ඇති ප්‍රධාන වෙනස්කම් කුමක්දැයි සොයා ලියන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 6.0 : ජීවිතයේ සියළු කටයුතු ෂරීආවේ දර්ශනයට අනුකූල ව ඉටු කරයි.

නිපුණතා මට්ටම 6.2 : සහායක මූලාශ්‍ර හඳුනාගෙන, ඒවා සමාජයට ප්‍රයෝජනවත් වන්නේ කෙසේ දැයි ගෙන හැර දක්වයි.

ක්‍රියාකාරකම 6.2.1 : ඉජ්තිහාද්, යුගයේ අවශ්‍යතාවයක් බව දැන ගනිමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 6.2.1.1 හි ඇතුළත් ප්‍රශ්නාවලිය
- ඇමුණුම 6.2.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- අල්කුර්ආන් පරිවර්තනය
- ඉජ්තිහාද් සම්බන්ධ මූලාශ්‍ර පොත්පත්
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.2.1.1 :

- ඇමුණුම් 6.2.1.1 හි ඇතුළත් ප්‍රශ්නාවලිය සිසුන්ට ඉදිරිපත් කර ඉජ්තිහාදයේ අවශ්‍යතාවය අවබෝධකර ගැනීමට මඟ පෙන්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - ඉජ්තිහාද් යනු යම් ගැටළුවකට අදාළ ආගමික විනිශ්චය ලබාගැනීම සඳහා විද්වතුන් ගන්නා උත්සාහය බව.
> - මෙලෙස ඉජ්තිහාද් කරන්නන් මුජ්තහිද් ලෙස හඳුන්වනු ලබන බව.
> - ඉජ්තිහාද් කිරීම සෑම යුගයකටම අවශ්‍ය බව.
> - නවීන ගැටළුවලට ආගමික විසඳුම් සෙවීමට ඉජ්තිහාද් කිරීම ෆර්ල් කිෆායා බව.

පියවර 6.2.1.2 :

- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම් 6.2.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව එකිනෙක කණ්ඩායම්වලට සපයන්න.
- අවශ්‍ය වන පෑන් හා කඩදාසි සියළු කණ්ඩායම්වලට සපයන්න.
- ස්වාධීනව සාකච්ඡාවේ යෙදීම සඳහා සියළු කණ්ඩායම් වලට අවකාශය ලබා දෙන්න.
- එය නිරීක්ෂණය කොට මඟ පෙන්වන්න.

පියවර 6.2.1.3 :

- කණ්ඩායම්වල තීරණය පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථා ලබා දෙන්න.
- අඩුපාඩු සකසා ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු සමාලෝචනය කරන්න.

> - ඉජ්තිහාද් යනු කුර්ආන් හදීස් පදනම් කොටගෙන නවීන ගැටළුවලට ඉස්ලාමීය විසඳුම් ලබා ගැනීම සඳහා මුජ්තහිද් කෙනෙකු තමන්ට හැකි උත්සාහයක යෙදීම බව.
> - නබි (සල්) තුමාගේ කාලයේ ඇති නොවූ බොහෝ නවීන ගැටලු පසු කාලයේ බිහිවන බව.
> - මෙම ගැටලුවට සෘජු විසඳුම් කුර්ආනයේ හෝ හදීසයේ නොමැති බව.
> - එබැවින් එවැනි ගැටළුවලට විසඳුම් සෙවීම මුජ්තහිද්වරුන්ගේ වගකීම බව.
> - මුජ්තහිද්වරුන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු බව.
>   අරාබි භාෂා දැනුම
>   කුර්ආනීය දැනුම
>   හදීස් පිළිබඳ දැනුම
>   උසූලුල් ෆික්හ් පිළිබඳ දැනුම
>   අනිකුත් නීති මූලාශ්‍ර පිළිබඳ දැනුම
>   ෂරීඅතයේ අරමුණ පිළිබඳ දැනුම
> - ස්ථිර නිගමන සහිත ගැටළුවලට ඉජ්තිහාද් නොකළ යුතු බව.
> - යුගයේ අවශ්‍යතාවනට අනුව ඉජ්තිහාද් තීරණ වෙනස්වන බව.
> - එකිනෙක ක්ෂේත්‍රවලට අදාළ විද්වතුන් තම ක්ෂේත්‍රයේ ඉජ්තිහාද් කළ හැකි බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- ඉජ්තිහාද් යනු කුමක්දැයි දැන ඒ පිළිබඳ නිවැරදි විස්තර ප්‍රකාශ කරයි.
- ඉජ්තිහාද් කළ යුතු ගැටළු නිවැරදිව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ඉජ්තිහාද් නොමැතිව නවීන ඉස්ලාමීය ගැටළුවලට විසඳුම් ලබා ගත නොහැකි බව පිළිගනියි.
- නවීන ගැටළුවලට නිවැරදි විනිශ්චය කුමක්ද යන්න දැන පිළිපදයි.
- ඉජ්තිහාද් පදනම් කොට මතු වන ප්‍රතිවිරුද්ධ අදහස් වලදී එකිනෙක ගැටෙන කරුණුවලින් ඉවත්ව කටයුතු කරයි.

ඇමුණුම 6.2.1.1

1. ලොව කලින් කලට වෙනස්වීම්වලට ලක්වන බව පිළිගන්නේ ද?
2. මේ අයුරින් පුදුමාකාර දේවල් බිහිවීම නිවැරදි වන්නේ ද?
3. ඒවා අප ජීවිතයේ අංගයක් බවට පත්වනවා නේ ද?
4. එක් මුස්ලිම් වරයෙකු ෂරීඅත් තීරණය පදනම් කොට ගෙන ක්‍රියා කළ යුතු බවට ඔබ එකඟ වන්නේ ද?
5. එසේ නම් නවීන ගැටලුවලට ෂරීආවේ විසඳුම් ලබාගන්නේ කෙසේ ද?
6. කුර්ආන් හදීසයේ විසඳුම් පවසා නැති කාලීන ගැටලු යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා ඒ අනුව කටයුතු කරන්න.
- සාකච්ඡාකර වාර්තාවක් සකස් කොට එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 6.2.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. ● ඉජ්තිහාද් කිරීම නබි (සල්) තුමා අනුමත කළ බවට සාධකයක් සොයා ලියන්න.

කණ්ඩායම් 2. ● නබි(සල්)තුමාගේ යුගයේ දක්නට නොතිබූ බැවින් පසුකාලීනව ගවේෂණාත්මකව විසඳුම් සෙවිය යුතුව තිබූ නවීන ගැටළු 5 ක් ලියන්න.

කණ්ඩායම් 3. ● "ලේ දන්දිය හැකිය" යන්නට ඉජ්තිහාද් මගින් කෙසේ තීරණ ගනු ලැබුවේ දැ යි සොයා සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 5.0 : ඉපැයුම් හා ආදායම ලැබීමේ දී හරාම් හලාල් පිළිපැද විශ්වාසවන්තව

නිපුණතාව 6.0 : ජීවිතයේ සියළු කටයුතු ෂරීආවේ දර්ශනයට අනුකූලව ඉටු කරයි.

නිපුණතා මට්ටම 6.2 : සහායක මූලාශ්‍ර හැඳුනාගෙන, ඒවා සමාජයට ප්‍රයෝජනවත් වන්නේ කෙසේ දැයි ගෙන හැර දක්වයි.

ක්‍රියාකාරකම 6.2.2 : ඉජ්මා සහ කියාස් කෙසේ ප්‍රයෝජනවත් වේ දැයි දැන ගනිමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 6.2.2.1 හි ඇතුළත් ඓතිහාසික සිද්ධිය
- ඇමුණුම 6.2.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- අල්කුර්ආන් පරිවර්තනය
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.2.2.1 :
- ඇමුණුම් 6.2.2.1 හි ඇතුළත් ඓතිහාසික සිද්ධිය කියවා රඟ දක්වන මෙන් සිසුන් දෙදෙනෙකුට පවසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - ඉජ්මා සහ කියාස් අල්කුර්ආනයට සහ සුන්නාවට ආධාරක නීති මූලාශ්‍ර බව.
> - ඉජ්මා යනු මුජ්තහිද්වරු ඒකමතිකව පැවසූ විසඳුම් වන බව.
> - කියාස් යනු දැනටම නිවැරදිව වූ විසඳුම් වන බව.
> - කියාස් යනු දැනටම නිවැරදි වූ විසඳුමක් තවත් ගැටළුවකට සසඳා බැලීම බව.
> - ඉජ්මා සහ කියාස් ඉවත් කළ නොහැකි නීති මූලාශ්‍ර දෙකක් බව.

පියවර 6.2.2.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- එකිනෙක කණ්ඩායම්වලට ඇමුණුම ඇතුළත් ගවේෂණ පත්‍රිකාව පිටපත් කර සපයන්න.
- ඔවුන්ගේ කණ්ඩායමේ ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට මඟ පෙන්වන්න.

පියවර 6.2.2.3 :
- තමන්ගේ වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීම සඳහා කණ්ඩායම් වලට අවස්ථාව ලබා දෙන්න.
- දුර්වලතා සකසා ගැනීම සඳහා එම කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ නිර්මාණ පිළිබඳ නිර්මාණාත්මක කරුණු අනෙක් කණ්ඩායම් වලින් විමසන්න.

- පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනය කරන්න.

> - ඉජ්මා යනු නබි තුමාට පසු නිශ්චිත කාලයේ ජීවත් වූ මුජ්තහිද්වරු එක්රැස්වී ෂරීඅත් සම්බන්ධ ගැටළුවකට ලබාදුන් ඒකමතික තීරණ වන බව.
> - මෙලෙස ඒකමතිකව ගත් තීරණවලට මුස්ලිම්වරු අවනත විය යුතු බව.
> - ඉජ්මා "සරීහ් " හා "සුකූති " යනුවෙන් වර්ග 2 ක් වන බව.
> - සහාබාවරුන් බොහෝ අවස්ථාවල ඉජ්මා කළ බව.
> - කියාස් නම් පදයේ අර්ථය එකක් තවත් දෙයකින් මැනීම වන බව.
> - කියාස් හි රුකුන් 4 ක් සඳහන් වන බව.
>   1. අසල්     2. ෆර්උ
>   3. හුකුම්     4. ඉල්ලත්
> - කියාසය ප්‍රතික්ෂේප කරන්නන්ද සිටින බව.
> - මොවුන් පෙන්වන මූලාශ්‍ර බලපත් නොවන බව.
> - නබි (සල්) තුමා ද කියාසය පදනම් කොට ගෙන තීරණ ප්‍රකාශ කළ බව.
> - ඉජ්මා කියාස් මෙන්ම වෙනත් සහායක මූලාශ්‍ර ද ඇති බව.
> - ඉස්තිස්හාබ්, ඉස්තිහ්සාන්, මස්ලහා මුර්සලා, සද්දු සරාඉ යනාදිය උදාහරණ වන බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ඉජ්මා සහ කියාස්වල වර්ගය සොයා නම් කරයි.
- වඩාත් නිවැරදි ඉජ්මාව සහ වඩාත් නිවැරදි කියාසය කුමක්දැයි හඳුනාගෙන පවසයි.
- කුර්ආන් හා හදීස් හි සෘජුව විසඳා නොමැති අවස්ථාවල ඉජ්මා සහ කියාස් විසඳුම නිවැරදි බව පිළිගනියි.
- සෘජු විසඳුම් නොමැති අවස්ථාවල කියාසයේ විසඳුම නිවැරදි බව පිළිගනියි.
- සෘජු විසඳුම් නොමැති අවස්ථාවල කියාසය සහායක මූලාශ්‍ර කොට ගෙන ක්‍රියා කරයි.
- තම පෞද්ගලික අදහස අන් අය හා සාකච්ඡාවට භාජනය කොට ඒකමතිකව විසඳුම් ගෙන ක්‍රියා කරයි.

ඇමුණුම 6.2.2.1

විස්තර පත්‍රිකාව

ඉබ්නු අබ්බාස් (රළි) තුමාගේ ඉජ්තිහාද්

හවාරිජ්වරුන්ගෙන් කෙනෙකු : තීරණ ගැනීමේ අයිතිය අල්ලාහ් හැර වෙන කිසිවෙකුටත් නොමැත. මෙය අල්කුර්ආනයේ වැකියකි. නමුත් අලි (රළි) හා ඔහුගේ අනුගාමිකයන් නිශ්චය කිරීමේ අයිතිය මිනිසුන්ට පවරා දුන්නේය.

ඉබ්නු අබ්බාස් (රළි) තුමාගේ පිළිතුර

සැමියාගේ පාර්ශවයෙන් කෙනෙකු හා බිරිඳගේ පාර්ශවයේ කෙනෙකු තීරණ ගැනීමේ සම භාරකරුවන් වශයෙන් පත්කර ගන්නා ලෙස අල්ලාහ් පවසයි. මෙම පදනම මත අලි (රළි) තුමා සමථකරුවන් පත් කිරීම වරදක් නොවේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් : ● ගවේෂණ පත්‍රිකාව ලබාගෙන ඒ අනුව කටයුතු කරන්න.
● වාර්තාවක් සකසා එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 6.2.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් ගෙන 1. තමන් අතර ඇතිවූ නවීන ගැටලුවලට නබි(සල්)තුමාගේ අනුගාමිකයන් ඒකමතිකව තීරණ ක්‍රියා කළ අවස්ථා 2 ක් ලියන්න.

කණ්ඩායම් 2. ඉජ්මා නීති මූලාශ්‍රයක් ලෙස අනුමත කරන, අල්කුර්ආන් වාක්‍ය හා අල්හදීස් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම් 3. කියාසය මූලාශ්‍රයක් ලෙස ගත හැකිය යන්න අනුමත කරන කුර්ආන් වාක්‍ය හා හදීස් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම් 4. සපයා ඇති කුර්ආන් වැකියේ තීන්දුව කියාස් වශයෙන් ගෙන පහත සඳහන් ගැටලුවලට විසඳුම් සපයන්න.

i. දෙමාපියන්ට පහර දිය හැකි ද?

(ඉස්රා : 23)

ii. සිකුරාදා ජුම්ආ සලාතයට සහභාගි නොවී අමතර පන්තිවලට යා හැකි ද?

(අල්ජුම්ආ: 09 )

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : ජීවිතයට අවශ්‍යවන ආදර්ශමත් පුද්ගලයන් හඳුනාගෙන අනුගමනය කරයි.

නිපුණතා මට්ටම 7.1 : නබි(සල්)තුමාගේ ජීවිතය විස්තරාත්මකව වටහා ගෙන තම ජීවිතයේ පරමාදර්ශ ලෙස පිළිගෙන කටයුතු කරයි.

ක්‍රියාකාරකම 7.1.1 : "ජාහිලියියා" යුගයේ ලක්ෂණ දැන ගනිමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.1.1 හි ඇතුළත් ඓතිහාසික විස්තරය
- ඇමුණුම 7.1.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.1 .1 :
- ඇමුණුම 7.1.1.1 හි ඇතුළත් ඓතිහාසික විස්තර කොටස කියවා හෝ කියවීමට සලස්වා සිසුන්ගේ අවධානය ලබා ගන්න.
- රැකියාවක් කිරීමේ අවශ්‍යතාවය, ඉස්ලාම් එයට දී ඇති වැදගත්කම පිළිබඳ ශිෂ්‍ය අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡා කරන්න.

> - නබි(සල්) තුමා ඉපදුනු කාලය ජාහිලියියා යුගය වශයෙන් හඳුන්වන බව.
> - ජාහිලියියත් යනුවෙන් නොදැනුවත්කම, මෝඩකම හැඳින්වෙන බව.
> - නබි (සල්) තුමාගේ කාලයේ පැවති ඉතා විශාල ජාහිලියියතය දෙවියන් පිළිබඳ හා සාම්ප්‍රදායයන් පිළිබඳව බව.
> - එකල ජනයා අරාබි භාෂාව ඉතා වැදගත් කොට සැළකූ බව.

පියවර 7.1.1.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- කණ්ඩායම්වලට ඇමුණුම 7.1.1.2 ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- අවශ්‍යවන කඩදාසි හා ලිවීමේ උපකරණ සපයන්න.
- සිසුන් සාකච්ඡාව සඳහා යොමුකර ඔවුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට මඟ පෙන්වන්න.

පියවර 7.1.1.3 :
- තමන් සාකච්ඡා මගින් ලබාගත් කරුණු ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමට ම අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ කරුණුවල අඩුපාඩු සකස් කර ගැනීම සඳහා එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු අවධාරණය කරමින් සමාලෝචනය කරන්න.

> - ඉස්ලාම් හඳුන්වා දෙන ලද වකවානුවේ අරාබි රට අනෙකුත් රටවල අවධානයෙන් ඈත්ව තිබූ බව.
> - සදාචාරාත්මක ගුණාංගයන්ගෙන් ඌන බටහිර ජීවන ක්‍රමය ඔවුන් තුළ දක්නට ලැබූ බව.
> - බොහෝ ගෝත්‍රික කාන්තාවන් සම්පූර්ණයෙන් ම පිරිමින්ගේ වහලුන් බවට පත් වූ සමාජයක් ලෙස දක්නට තිබූ බව.
> - ඔවුන්ගේ ජීවන ක්‍රමය මගින් ඔවුන් තුළ සමහර හොඳ ගුණාංගයක් වර්ධනය කළ බව.
> - පිළිම වන්දනය සීමාව ඉක්මවා ගොස් ඒකත්වය වෙනුවෙන් නිර්මාණය කළ කැබාව පවා අවලක්ෂණ කළ බව.
> - වහල් වෙළදාම හා අමානුෂික ක්‍රියාවන් අසීමිතව සිදු වූ බව.
> - ඉස්ලාමීය දේශනා ඔවුන්ගේ ආත්මාර්ථකාමී චින්තනයට අභියෝග වශයෙන් පැවැති බව.
> - නබි (සල්) තුමාගේ ප්‍රචාරයේ වේගයක් එතුමා පෙන්වූ ආදරය, කරුණාව, මානුෂික හැඟීම් යනාදිය උසස් හැඟීම් ඇති ඉහළ ගෝත්‍රිකයන් ආකර්ෂණය කළ බව.
> - එසේම පහත් යයි සම්මත ගෝත්‍රිකයන් ද ආකර්ෂණය වූ බව.
> - තම පදවියට හා සමාජ තත්ත්වයට විනාශයක් ළඟාවන බව සිතූ නායකයන් ඉස්ලාමිය ප්‍රචාරයට එරෙහිව නැගී සිටි බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- ඉස්ලාම් බිහිවීමට ප්‍රථම අරාබියාවේ පැවැති ආචාර ධර්ම තත්ත්වයන් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ජාහිලියියා යුගයේ මිනිසුන් තුළ තිබූ ගුණාංග අතර පැවති යහ ගුණාංගයක් තෝරා වෙන්කොට දක්වයි.
- මිනිසුන් නොදැනුවත්කම හා අනාචාරාත්මක ක්‍රියාවන්හි ගිලී සිටීමට හේතුව වැරදි දේව විශ්වාස හා බොළඳ චාරිත්‍රයන් බව දැන පවසයි.
- තම ජීවිතයේ නබි(සල්) තුමාගේ යහ ගුණ අනුගමනය කරයි.
- යහගුණයන්ට මූලිකත්වය දෙමින් ජනතාවර අතර ප්‍රතිසංශෝධන ඇති කරයි.

ඇමුණුම් 7.1.1.1.

විස්තර පත්‍රිකාව

අබූදර් (රළි) තුමා එක් වතාවක බිලාල් (රළි) බලා කළු කාන්තාවගේ පුත්‍රයා යනුවෙන් පැවසීය. මෙය ඇසූ නබි (සල්) තුමා" ඔබ තුළ තවමත් ජාහිලියියා ගුණාංග තිබේ යනුවෙන් තදින් පැවසීය. මෙය ඇසූ අබූදර් (රළි) තුමා කණගාටුවෙන් යුතුව බිම දිගාවී තම හිස පාගන මෙන් බිලාල් (රළි) තුමාගෙන් ඉල්ලීය.

ජාහිලියියා යුගයේ ජීවත් වූ මිනිසුන් ඉස්ලාමීය දේශනයන් මගින් එහි අඳුරේ සිට ඉස්ලාම් නැමැති ආලෝකයට මඟ පෙන්වූයේ මෙලෙසය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ගවේෂණ පත්‍රිකාව ලබාගෙන ඒ අනුව කටයුතු කරන්න.
- සාකච්ඡා මගින් ලබාගත් තොරතුරු ලේඛනගත කොට පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 7.1.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. නබි (සල්) තුමා ඉස්ලාමය දේශනා කිරීමට පෙර යුගය, ජාහිලියියා කාලය ලෙස හැඳින්වීමට සාධාරණ වූ හේතු සොයා ලියන්න.

කණ්ඩායම් 2. ජාහිලියා යුගයේ මිනිසුන් තුළ දක්නට ලැබූ යහපත් හා අයහපත් ගුණාංග වෙන්කොට දක්වන්න.

කණ්ඩායම් 3. ජාහිලියාවලින් ජනතාව මුදවාගැනීම සඳහා නබි(සල්)තුමා දියත් කළ ප්‍රචාර උපායන් සොයා ලියන්න.

කණ්ඩායම් 4. නබි (සල්) තුමා ඉස්ලාමය දේශනා කරන විට බොහෝ කුරෛයිෂි කාෆිර්වරු ඊට එරෙහිවීමට හේතුවූ කරුණු සොයා ලියන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : ජීවිතයට අවශ්‍යවන ආදර්ශවත් පුද්ගලයන් හඳුනාගෙන අනුගමනය කරයි.

නිපුණතා මට්ටම 7.1 : නබි (සල්)තුමාගේ ජීවිතය විස්තරාත්මකව වටහා ගෙන තම ජීවිතය පරමාදර්ශ ලෙස පිළිගෙන කටයුතු කරයි.

ක්‍රියාකාරකම 7.1.2 මක්කා ජීවිතයේ නබි (සල්) තුමාගේ ද:වා අනුගමන ක්‍රමය අනුගමනය කරමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.2.1 හි ඇතුළත් අල්කුර්ආන් වැකිය.
- ඇමුණුම 7.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.2.1 :
- ඇමුණුම 7.1.2.1 හි ඇතුළත් අල්කුර්ආන් වැකිය අර්ථය සමඟ ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන ශිෂ්‍යයෙකු ලවා පන්තියට ඇසෙන සේ කියවන්න.

> - නබි (සල්) තුමා හිරා ගුහාවෙහි ධ්‍යානයෙහි නිරතව සිටි කාලයේ ප්‍රථම වහී පහළ වූ බව.
> - ඉන් අනතුරුව දේව පණිවිඩ ප්‍රචාරය කිරීමට අල්ලාහ්ගෙන් අණ ලැබුණු බව.
> - ප්‍රචාරක කාලය තුළ නබි(සල්) තුමාට මක්කාවේ දැඩි විරෝධතාවන්ට මුහුණ දීමට සිදුවූ බව.
> - මක්කා ජීවිතයේ නබි(සල්)තුමා උසස් වූ ඉවසීමෙන් යුක්ත අනුගත ක්‍රමයක් පිළිපැදි බව.

ඇමුණුම් 7.1.2.2 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම් 7.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව කණ්ඩායම්වලට බෙදා හරින්න.
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් සපයන්න.
- සිසුන් කණ්ඩායම් වශයෙන් ක්‍රියාකිරීමට සලස්වා මඟ පෙන්වන්න.

පියවර 7.1.2.3 :
- තමන් සාකච්ඡා කර ලබාගත් අදහස් පන්තියේ ඉදිරිපත් කිරීමට එකිනෙක කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- දුර්වලතා සකසා ගැනීමට එම කණ්ඩායමට ම අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ද ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු සිසුන්ගේ සිත්වල ධාරණය වන අයුරින් සමාලෝචනය කරන්න.

> - කුරෙයිෂි කාෆිර්වරුන්ගේ දැඩි විරෝධතා නිසා නබි(සල්)තුමාණන් ටික කලක් රහසිගත ප්‍රචාරයේ යෙදුණු බව.
> - පසුව දැඩි විරෝධතාවල මුහුණ දෙමින් ප්‍රසිද්ධ ප්‍රචාරයේ යෙදුණු බව.
> - මෙනිසා නබි(සල්)තුමා හා සහාබාවරු කුරෙයිෂි වරුන්ගේ තාඩන පීඩනයන්ට ලක් වූ බව.
> - නබි(සල්)තුමාගේ ප්‍රචාරය වැළැක්වීම සඳහා සියළු ආකාර උපායන් යෙදූ බව.
> - අබූතාලිබ් නිම්නයේ මුස්ලිම්වරුන් වෙන්කොට තැබූ බව.
> - යාසිර් (රළි) තුමාගේ පවුලෙන් පළිගත් බව.
> - බිලාල් (රළි) තුමා වද හිංසා වලට ලක් කළ බව.
> - දැවාවට සුදුසු වන තැනක් සොයා නබි (සල්) තුමා තායිෆ් ප්‍රදේශයට ගමන් කළ බව.
> - නබිතුමා අභ්‍යවකාශ ගමනේ යෙදුණු බව
> - තම අනුගාමිකයන්ගේ ආරක්ෂාව පතා හිජ්රත් යෑමට ඔවුන්ට අනුමැතිය දුන් බව.
> - අකබා ගිවිසුමත් සමග මදීනාවට හිජ්රත් යාමට සූදානම් වූ බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- නබි(සල්)තුමා මක්කා යුගයේ පිළිපැදි දැවා අනුගත ක්‍රමයක් පවසයි.
- කුරෙයිෂිවරු නබි (සල්) තුමා හා සහාබාවරුන්ට හතුරුකම් පෑ හේතු හඳුනාගෙන පවසයි.
- මක්කා යුගයේ නබි (සල්) තුමා අනුගමනය කළ දැවා ක්‍රමයක් එවැනි සියළු අවස්ථාවන්ට ගැළපෙන බව ප්‍රකාශ කරයි.
- විරෝධතා මධ්‍යයේ වුවත් ඉස්ලාමය අනුගමනය කරයි.
- තමාට විරුද්ධ වන්නන් මධ්‍යයේ නබි (සල්) තුමාණන් අනුගමනය කළ ක්‍රමය අනුව ඉස්ලාමය දේශනා කරයි.

ඇමුණුම 7.1.2.1

විස්තර පත්‍රිකාව

أَعُوذُ بِاللهِ مِنَ الشَّيْطَانِ الرَّجِيم

بِسْمِ اللهِ الرَّحْمنِ الرَّحِيم

يَاأَيُّهَا الْمُدَّثِّرْ قُمْ فَأَنْذِرْ وَرَبَّكَ فَكَبِّرْ

وَثِيَابَكَ فَطَهِّرْ وَالرُّجْزَ فَاهْجُرْ

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

පොරවාගෙන සිටින්නාණෙනි. ඔබ නැගී සිටින්න. (මිනිසුන්ට) භක්තිය ඇති කොට අවවාද කරනු මැන. තව ද ඔබගේ නාථයාණන් ඉවසීමට පාත්‍ර කරනු මැන. එසේම ඔබගේ වස්ත්‍ර (ඇඳුම්) පිවිතුරු කරගනු මැනවි. අපවිත්‍රතාවලින් ඉවත්වනු මැන.

(සූරා මුද්දස්සිර් : 1 - 5)

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ගවේෂණ පත්‍රිකාව ලබා ගෙන ඒ අනුව කටයුතු කරන්න.
- සාකච්ඡා මගින් ලබාගන්නා තොරතුරු වාර්තා කර එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

(ඇමුණුම 7.1.2.2)

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම 1. නබි (සල්) තුමා මක්කාවේදී අනුගමනය කළ දැවා ක්‍රමය හඳුනාගෙන සටහන් කරන්න.

කණ්ඩායම 2. නබි (සල්) තුමා හා සහාබවරුන්ට කුරෙයිෂි කාෆිර්වරුන් විරෝධය පෑ හේතු සාකච්ඡා කොට සටහන් කරන්න.

කණ්ඩායම 3. කුරෙයිෂිවරුන් සහාබවාරුන්ට වද හිංසා කළ සිද්ධියක් සොයා මූලාශ්‍ර සමග වාර්තා කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : ජීවිතයට අවශ්‍යවන ආදර්ශමත් පුද්ගලයන් හඳුනාගෙන අනුගමනය කරයි.

නිපුණතා මට්ටම 7.1 : නබි (සල්) තුමාගේ ජීවිතය විස්තරාත්මකව වටහා ගෙන තම ජීවිතය පරමාදර්ශ ලෙස පිළිගෙන කටයුතු කරයි.

ක්‍රියාකාරකම 7.1.3 : නබි (සල්) තුමාගේ හිජ්රත් මගින් ලබාගත හැකි පාඩම් ආදර්ශයට ගෙන ක්‍රියා කරමු.

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.3.1 හි ඇතුළත් සුභපැතුම් කාව්‍යය
- ඇමුණුම 7.1.3.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.3.1 :
- ඇමුණුම් 7.1.3.1 හි ඇතුළත් කාව්‍යය ගායනා කොට හෝ වාදනය කර එය අසා වින්දනය ලැබීමට සලස්වන්න.
- එය කවදා කවරකු විසින් ගායනා කරන ලද්දේ දැයි සිසුන්ගෙන් අසා පිළිතුරු පැවසීමට සලස්වන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - මක්කාවේ අත්දුටු අත්දැකීම් නිසා හිජ්රත් යාමට සිදුවූ බව.
> - කුරෙයිෂිවරු මදීනාවෙහි ද මුස්ලිම්වරුන්ට සැනසීමෙන් ජීවත්වීමට ඉඩ නොදුන් බව.
> - කුරෙයිෂිවරු යුදෙව්වන් හා එක්වී මුස්ලිම්වරුන් සතුරුකම් කළ බව.
> - මදීනාව මූලික කොටගත් ඉස්ලාමීය රජතුමා අනෙකුත් රටවලට ප්‍රචාරක හසුන් යැවූ බව.

පියවර 7.1.3 .2 :
- සිසුන් කණ්ඩායම් 5 කට බෙදන්න.
- එකිනෙක කණ්ඩායම්වලට ඇමුණුම් 7.1.3.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර මඟ පෙන්වන්න.

පියවර 7.1.3.3 :
- තමා සාකච්ඡා කොට ලබාගත් අදහස් පන්තියේ ඉදිරිපත් කිරීමට එකිනෙක කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු අවධාරණය කරමින් සමාලෝචනය කරන්න.

> - මක්කාවේ ඉස්ලාමයට එරෙහි විරෝධතාවන් වර්ධනය වූ විට මදීනාවට හිජ්රත් යන ලෙස අල්ලාහ්ගෙන් අණ ලැබූ බව.
> - නබි(සල්)තුමා යාමට ප්‍රථම තම අනුගාමිකයන් මදීනාවට යැවූ බව.
> - නබි(සල්)තුමා සහ අබූබක්කර් (රළි) තුමා අවසාන වශයෙන් හිජ්රත් ගිය බව.
> - මදීනාවේ මුහාජිරීන් වරුන් සමග අන්සාරිවරුන් එකතු කළ බව.
> - මස්ජිදුන් නබවිය නිර්මාණය කළ බව.
> - ඉස්ලාමය පිළිගැන්වීම සඳහා මදීනාවේ සිට දූත පිරිස් පිටරටවලට යැවූ බව.
> - මදීනාවේ පිබිදීම දැක කුරෙයිෂිවරු හා යුදෙව්වන් එකතු වී කුමන්ත්‍රණ කළ බව.
> - සියළු අභියෝග ජයගෙන මදීනාව ඉස්ලාමීය අධිරාජ්‍යයේ අග නගරය ලෙසත්, ආදර්ශවත් නගරයක් ලෙසත් නිර්මාණය වූ බව.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- හිජ්රතයට බලපෑ හේතු සොයා ප්‍රකාශ කරයි.
- කුරෙයිෂිවරුන් මුස්ලිම්වරුන්ට සටනට පෙළඹවූයේ කෙසේ දැයි හඳුනාගෙන පවසයි.
- නබී (සල්) තුමා ඇතිකරගත් ගිවිසුම් මූලාශ්‍ර වශයෙන් ගෙන, විවිධ සමාජ සමඟ බැඳියාවෙන් කටයුතු කිරීමට ගිවිසුම් මගින් හැකිවේ ය යන ප්‍රකාශය නිවැරදි බව පිළිගනියි.
- නබි (සල්) තුමන් භාවිත කළ ප්‍රචාරක උපායන්ගෙන් කාලයට හා අවස්ථාවට උචිත දැ තෝරා ක්‍රියාත්මක කරයි.

ඇමුණුම 7.1.3.1

විස්තර පත්‍රිකාව

طَلَعَ الْبَدْرُ عَلَيْنَا    مِنْ ثَنِيَّاتِ الْوَدَاعِ
وَجَبَ الشُّكْرُ عَلَيْنَا    مَا دَعَا لِلّٰهِ دَاعٍ
اَيُّهَا الْمَبْعُوثُ فِينَا    جِئْتَ بِالاَمْرِ الْمُطَاعِ

අර්ථය : සනියියතුල් වදා: නමැති ස්ථානයේ සිට අප වෙත පුරහඳ පැවේ ය.
කැඳවුම්කරු අල්ලාහ් වෙත කැඳවූවාට ස්තුති කිරීමට
අප වෙත එවනු ලැබුවාණෙනි.
අවනත වීමට සුදුසු අණ රැගෙන ආවෙහිය.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් : 
- ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියළු දෙනා එහි අවධානය යොමු කරන්න.
- සාකච්ඡා මගින් ලබාගන්නා තොරතුරු වාර්තා කොට පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම් 7.1.3.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. නබි (සල්) තුමා මදීනාවට හිජ්රත් යාමට හේතු සාකච්ඡාකර වාර්තා කරන්න.

කණ්ඩායම් 2. කුරෙයිෂිවරුන්, සටන් කිරීම සඳහා මුස්ලිම්වරුන් කෙසේ පෙළැඹූවාදැයි සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 3. නබි(සල්) තුමා කුරෙයිෂිවරුන් සමඟ හා යුදෙව්වන් සමඟ ගිවිසුම ඇතිකර ගැනීමට හේතු සොයා වාර්තා කරන්න.

කණ්ඩායම් 4. නබි (සල්) තුමා අරාබියෙන් පිට දැඋවා සේවය ඉටුකිරීම සඳහා කුමනාකාර ක්‍රියාමාර්ග ගනු ලැබුවේ දැයි සොයා වාර්තා කරන්න.

කණ්ඩායම් 5. නබි (සල්) තුමාගේ මක්කා ප්‍රචාරක ක්‍රමය, මදීනා ප්‍රචාරක ක්‍රමයෙන් කෙසේ වෙනස් වන්නේ දැයි සොයා වාර්තා කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : ජීවිතයට අවශ්‍යවන ආදර්ශවත් පුද්ගලයන් හඳුනාගෙන අනුගමනය කරයි.

නිපුණතා මට්ටම 7.2 : (නබි (සල් ) තුමාගේ බිරිඳ හා පවුලේ සාමාජිකයන්ගේ ජීවිතය වටහා ගෙන එමගින් ලබාගත හැකි පාඩම් පිළිපදිමින් ජීවත් වෙයි.

ක්‍රියාකාරකම 7.2.1 : උම්මහාතුල් මුඋමිනීන්වරු ආදර්ශවත් කර ගනිමු

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.1.1 හි ඇතුළත් ප්‍රශ්නාවලිය
- ඇමුණුම 7.2.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කොළ හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.1.1 :
- ඇමුණුම 7.2.1.1 හි ඇතුළත් ප්‍රශ්න ලබාදී පිළිතුරු සපයන ලෙස පවසන්න.
- නිවැරදි පිළිතුරු සපයන සිසුන් ප්‍රශංසා කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න.

> - උම්මහාතුල් මුඋමිනීන් යනුවෙන් හඳුන්වන්නේ මුහම්මද් (සල්) තුමාගේ බිරිඳන් බව.
> - උම්මහාතුල් මුඋමිනීන්වරු එකොළොස් දෙනෙකු වන බව.
> - උම්මහාතුල් මුඋමිනීන් යන්නෙහි අර්ථය විශ්වාසවන්තයින්ගේ මව්වරු වන බව.
> - උම්මහාතුල් මුඋමිනීන්වරු නබි(සල්)තුමාගේ ප්‍රචාරක කටයුතුවලට ඉමහත් උපකාර කළ බව.

පියවර 7.2.1.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම් 7.2.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව සියළු කණ්ඩායම් වලට සපයන්න.
- අවශ්‍ය ප්‍රමාණයට ලියන කඩදාසි හා ෆෙල්ට් පෑන් සපයන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 7.2.1.3 :
- තමන් සාකච්ඡා කර සකස් කළ වාර්තාව ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකට අවස්ථාව ලබා දෙන්න.
- අදහස් ඉදිරිපත් කිරීම සඳහා එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු අවධාරණය කරමින් සාකච්ඡාවේ යෙදෙන්න.

> - නබි (සල්) තුමා එකවර බිරිඳන් නව දෙනෙකු සිටි බව.
> - එයට පහත කරුණු හේතු වූ බව.
>   අල්ලාහ්ගේ විශේෂ අනුමැතිය.
>   වැන්දඹුවන්ට ජීවිතයක් ලබාදීම.
> - නබි (සල්) තුමාගේ ප්‍රථම විවාහයේදී එතුමාගේ වයස 25 වූ බව, ප්‍රථම බිරිඳ වන කදීජා (රළි) තුමියට වයස 40 බව.
> - කදීජා තුමියගේ මරණය දක්වා වෙනත් කිසිඳු විවාහයක් නොකර ගත් බව.
>   ඔවුන්ගේ අයිතිවාසිකම් ද රකිමින් කටයුතු කළ බව.
> - නබි(සල්)තුමාගේ ඉතාමත් වයසින් අඩු බිරිඳ වන්නේ ආයිෂා තුමිය බව.
> - සූරතුල් අහ්සාබ් හි අල්ලාහ් උම්මහාතුල් මුඋමිනින්වරුන් පිළිබඳව පවසා ඇති බව.
> - කාන්තාවන් අතර ඉස්ලාමීය පාඩම් දේශනා කිරීම සඳහා උම්මහාතුල් මුඋමිනීන්වරුන් පිළිබඳව පවසා ඇති බව.
> - කාන්තාවන් අතර ඉස්ලාමීය පාඩම් දේශනා කිරීම සඳහා උම්මහාතුල් මුඋමිනින්වරු උපකාර කළ බව.
> - හදීස් දැනුම් දීමේදී තාබීඊන්වරුන්ට මොවුන් ගුරුවරියන් වශයෙන් සිටි බව.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- උම්මහාතුල් මුඋමිනීන්වරුන්ගේ නම් සොයා සටහන් කරයි.
- නබි (සල්) තුමාගේ දඋවා සේවයේ කදීජා (රළි) තුමිය කළ උපකාර හා සේවාවන් හඳුනාගෙන පවසයි.
- නබි (සල්) තුමා බහු විවාහ කර ගැනීමට බලපෑ හේතු වල සාධාරණ බව දකියි.
- උම්මහාතුල් මුඋමිනීන්වරුන්ට ගරුකර ඔවුන්ගේ ආදර්ශ පිළිපදියි.
- උම්මහාතුල් මුඋමිනීන්වරුන් සම්බන්ධයෙන් පතුරු වන අනිසි චෝදනා නිසි හේතු දක්වා ප්‍රතික්ෂේප කරයි.

ප්‍රශ්නාවලිය

ඇමුණුම් 7.2.1.1

1. මව යනු කවරෙක් ද?
2. දරුවන් බිහිකිරීම නිසා ඇය මව බවට පත්වේ. මේ හැර වෙනත් ක්‍රමයකින් මවක් විය හැකි ද?
3. ඉස්ලාමයේ එලෙස මව්වරු සිටී. ඔවුන් කවුරුන් ද?
4. ඔවුන්ට මව්වරුන් වශයෙන් පවසන්නේ ඇයි ?

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- සෑම කණ්ඩායමක්ම ගවේෂණ පත්‍රිකාව ලබාගෙන එහි මුළු අවධානය යොමු කරන්න.
- සාකච්ඡා මගින් ලබාගත් තොරතුරු ලේඛන ගත කොට එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 7.2.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. උම්මහාතුල්මුඋමිනීන් වරුන්ගේ නම් හොඳින් හඳුනාගෙන ලේඛනගත කරන්න.

කණ්ඩායම් 2. නබි (සල්) තුමාගේ දැවා සේවයට කදීජා (රළි) කළ උපකාර සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 3. නබි (සල්) තුමා බහු විවාහ කර ගැනීමට හේතු වූ කරුණු සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 4. ආයිෂා (රළි) තුමියට ඊිආවරු අපවාද නගයි. අල්ලාහ් ආයිෂා (රළි) තුමිය පිවිතුරු කොට පහළ කළ අල්කුර්ආන් වැකිය සොයා එහි අර්ථය සටහන් කරන්න.

අල්කුර්ආන් (24: 4 - 12)

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : ජීවිතයට අවශ්‍යවන ආදර්ශවත් පුද්ගලයන් හඳුනාගෙන අනුගමනය කරයි.

නිපුණතා මට්ටම 7.2 : නබි (සල්) තුමාගේ බිරිඳන්, පවුලේ සාමාජිකයන්ගේ ජීවිතය වටහාගෙන එමගින් ලබාගත හැකි පාඩම් පිළිපදිමින් ජීවත් වෙයි.

ක්‍රියාකාරකම 7.2.2 : අහ්ලුල් බෛත්වරුන් නිවැරදිව හඳුනාගෙන ඔවුන්ට ගරු කරමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.2.1 හි ඇතුළත් කවිය
- ඇමුණුම 7.2.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කොළ, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.2.1 :
- ඇමුණුම 7.2.2.1 හි ඇතුළත් කවිය බිත්තියේ එල්ලන්න.
- පන්තියේ සියළු සිසුන්ට සාමූහිකව ගායනයට අවස්ථාව ලබා දෙන්න.

- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡා කරන්න.

> - අහ්ලුල්බෛත් යනු නබි (සල්) තුමාගේ දුව ෆාතිමා (රළි), ඇයගේ සැමියා දරුවන් ඇතුළු ඔවුන්ගේ පරම්පරාවෙන් පැවත එන්නන් වන බව.
> - නබි (සල්) තුමා මොවුන් උසස් කොට පවසා ඇති බව.
> - ඉස්ලාමය වෙනුවෙන් මොවුන් බොහෝ පරිත්‍යාග කළ බව.
> - මොවුන් මෙන් ම අනෙකුත් සහාභාවරුන් විවිධාකාර පරිත්‍යාග කළ බව.

ඇමුණුම් 7.2.2.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- එකිනෙක කණ්ඩායම්වලට ඇමුණුම් 7.2.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව පිටපත් කොට සපයන්න.
- අවශ්‍යවන ලිවීම් උපකරණ සපයන්න.
- ඔවුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කොට තහවුරු කරන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස උපදෙස් දෙන්න.

පියවර 7.2.2.3 :
- එකිනෙක කණ්ඩායම් සාකච්ඡා කොට ලබාගත් නිමැවුම පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අදහස් දැක්වීමට එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු තහවුරු වන සේ සාකච්ඡා කරන්න.

> - නබි (සල්) තුමා තම දුව ෆාතිමා (රළි) වෙත අසීමිතව ආදරය සෙනෙහස දැක්වූ බව.
> - ඇයගේ සැමියා හා දරුවන් කෙරෙහිද එලෙසම ආදරය හෙලූ බව.
> - අහ්ලුල් බෛත්වරුන් වෙත ආදරය හා ගෞරවය දැක්වීම නබි (සල්) තුමා කෙරෙහි ආදර ගෞරව දැක්වීමට සමාන වන බව.
> - සලාතයේ පාරායනය කරන සලවාතුල් ඉබ්‍රාහීමියියා මගින් මෙය පවසන බව.
> - අහ්ලුල් බෛත්වරු හා එම පරපුරේ පැවත එන්නන් වැරදි නොකරන්නන් ලෙස ඉස්ලාම් නොපැවසූ බව.
> - ඔවුනතින් සිදුවන වැරදි නිවැරදි කිරීම හෝ වැළැක්වීම නුසුදුසු ලෙස ද ඉස්ලාම් නොපැවසු බව.
> - අහ්ලුල් බෛත්වරුන්ට උසස් කොට සලකා අනෙකුත් සහාභාවරුන්ගේ ඉමහත් සේවාවන් හා පරිත්‍යාග පහත් කොට බැලීම ප්‍රබල වැරැද්දක් බව.
> - සමහර කොටස් අහ්ලුල් බෛත්වරුන්ට ගෞරව දැක්වීමේ දී සීමාව ඉක්මවා ගොස් ෂිර්කය දක්වා මං වරදවාගෙන ඇති බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- අහ්ලුල් බෛත්වරු කවුරුන්දැයි දැන පවසයි.
- අහ්ලුල් බෛත්වරුන්ට ගෞරව කළ යුතු බවට සාධක අධ්‍යයනය කොට වාර්තා කරයි.
- අහ්ලුල් බෛත්වරුන් මෙන් අනෙකුත් සහාභාවරුන්ටත් ගරු කළ යුතුය. යන ප්‍රකාශය නිවැරදි බව පිළිගනියි.
- අහ්ලුල් බෛත්වරුන්ගේ පරිත්‍යාග සොයා වාර්තා කරයි.
- අහ්ලුල් බෛත්වරුන් පිළිබඳ මතුවී ඇති ද්විත්ව අදහස් මත මධ්‍යස්ථභාවය කර ගනියි.

තලෙයි ප්පාත්ති හා

කදීජd දූන් එලය වේ - හසන් හුසෙයින්ගේ මව්තුමිය වේ

දුර්ලභ මැණිකක් වේ - මහරුජින ෆාතිමා වේ

සෙයිනබ් රුකෙයියා තාහිර්, කාසීම්

ඉබ්රාහීම් තයියිබු උම්මු කුල්සුම් ෆාතිමාගේ සහෝදර සහෝදරියක් වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ගවේෂණ පත්‍රිකාව ලබා ගෙන ඒ අනුව කටයුතු කරන්න.
- වාර්තාව සකස් කර එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම : 7.2.2.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම 1. මුල් හිජ්රි සියවස් තුන තුළ බිහිවී සමුගත් අහ්ලුල් බෛත්වරුන්ට අයත් විද්වතුන් හා පරිත්‍යාග ශීලීන් දස දෙනෙකුගේ නම් සොයා ලියන්න.

කණ්ඩායම 2. අහ්ලුල් බෛත්වරුන්ට ගරු කළ යුතු බවට අල්කුර්ආන් වාක්‍ය හා අල්හදීස් වාක්‍ය සොයා සටහන් කරන්න.

කණ්ඩායම 3. අනෙකුත් සහාභාවරුන් ප්‍රශංසා කොට පවසන ලද අල්කුර්ආන් වාක්‍ය හා අල්හදීස් වාක්‍ය සොයා සටහන් කරන්න.

කණ්ඩායම 4. කර්බලා සිද්ධිය පිළිබඳ සොයා එය කෙටියෙන් ලියන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 8.0 : දෛනික කටයුතු පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය දැන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 8.1 : ඉස්ලාම් සියළු අවස්ථාවන්ටත් සෑම කාලයටත් ගැළපෙන බව වටහා ගෙන සමකාලීන ජීවන ක්‍රමය හැඩගස්වා ගනියි.

ක්‍රියාකාරකම 8.1 : ලෞකික ජීවිතය පිළිබඳ ඉස්ලාමීය අදහස් දැන ක්‍රියා කරමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 8.1.1.1 විස්තර පත්‍රිකාව
- ඇමුණුම 8.1.1.2 ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.1 .1 :
- ඇමුණුම් 8.1.1.1 හි ඇතුළත් අදහස් කලු ලෑල්ලේ සටහන් කරන්න.
- එය කියවීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- ඒ සම්බන්ධව සිසුන්ගේ හැඟීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - ලෞකික ජීවිතය පිළිබඳ විවිධ අදහස් දක්නට ඇති බව.
> - පරලොව වෙනුවෙන් වෙහෙසන අතරම මෙලොව ජීවිතය සාරවත් කොට මිනිස් දිවිය සරු කර ලීමට සෑම මුස්ලිම්වරයෙක් ම ක්‍රියාකළ යුතු බවට ඉස්ලාම් පවසන බව.
> - මෙලොව ජීවිතය සඳහා තමා හා තම සමූහයා වෙනුවෙන් කරනු ලබන යහපත් නිර්මාණශීලී සියළු කටයුතු ඉබාදත් ලෙස සලකන බව.
> - මෙලොව හා පරලොව ජීවිත දෙකේදී සම තත්ත්වයන් රැක ගැනීම ඉස්ලාමීය අදහස බව.

පියවර 8.1.1.2 :
- සිසුන් කණ්ඩායම් 3 කට බෙදන්න.
- එකිනෙක කණ්ඩායම්වලට 8.1.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- වර්ණ පෑන් හා කඩදාසි කණ්ඩායම්වලට සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමේ යෙදෙන්නේ දැයි නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 8.1.1.3 :
- තමන් සාකච්ඡා කර රැස්කළ කරුණු පන්තියේ ඉදිරිපත් කිරීම සඳහා කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ කරුණුවල දුර්වලතා සකසා ගැනීමට එම කණ්ඩායමටම අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල අදහස් නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු මතුවන වන අයුරින් සමාලෝචනය කරන්න.

> - ලෞකික ජීවිතය පිළිබඳ විවිධ අදහස් පවතින බව.
> - ලොව සශ්‍රීක කිරීමේ කටයුතුවල නිරතවීමට ඉස්ලාම් මිනිසාට මහපෙන්වන බව.
> - කෙනෙකු ගොඩනැගිල්ලක් සකස් කර හෝ බීජයක් සිටුවා එමගින් රහ්මාන්ගේ මැවීම් ප්‍රයෝජනය ලබන තාක් කල් ඔහුට යහපත් ආනිශංස හිමි වෙමින් පවතින බව හදීසයේ සඳහන් බව.
> - ලෞකික දිවිය පූර්ණ ලෙස නැමදුම් කටයුතුවල යෙදීමට උත්සාහ කළ සහාභාවරුන් තිදෙනාට නබි (සල්) තුමා මහ පෙන්වූ බව.
> - ලෞකික දිවියෙන් සම්පූර්ණයෙන් ඉවත්වීමත් අධ්‍යාත්මක දිවියට සීමාව ඉක්මවා මූලිකත්වය දීමත් ඉස්ලාම් අනුමත නොකරන ක්‍රියා බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ලෞකික දිවිය පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණ දැන ගනී.
- ලෞකික දිවිය පිළිබඳ ඉස්ලාමීය අදහස් දැන ඉදිරිපත් කරයි.
- ලෞකික දිවිය පිළිබඳව පවසන අල්කුර්ආන් වැකි හදීස් සොයා සටහන් කරයි.
- ලෞකික ජීවිතය කෙසේ භාවිත කළ යුතුදැයි දැන ක්‍රියාත්මක වෙයි.

ඇමුණුම 8.1.1.1

විස්තර පත්‍රිකාව

ලෞකික ජීවිතය පිළිබඳ පහත සඳහන් කරුණු කළුලැල්ලේ සටහන් කරන්න.

- ලෞකික ජීවිතය අපට ලැබී ඇති එකම අවස්ථාවකි. එබැවින් එය හොඳින් භුක්ති විඳිමින් ජීවත් විය යුතුයි.
- පරලොව වෙනුවෙන් ජීවත්වෙන අතරම ලෞකික දිවිය යහපත් වී මිනිස් ජීවිත සරු කිරීමට සෑම මුස්ලිමෙක් ම ක්‍රියා කළ යුතුය.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියළු දෙනා එහි මුළු අවධානය යොමු කරන්න.
- වාර්තාව සකස් කර එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 8.1.1.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. ලෞකික ජීවිතය මිනිසා පිළිබඳ සඳහන් වන අදහස් තුනක් සොයා ලියන්න.

කණ්ඩායම් 2. ලෞකික දිවිය සම්බන්ධ හදීස් ගවේෂණය කොට සටහන් කරන්න.

කණ්ඩායම් 3. ලෞකික ජීවිතය කෙසේ භාවිත කළ යුතු දැයි දැන සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 8.0 : දෛනික කටයුතු පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය දැන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 8.1 : ඉස්ලාම් සියළු අවස්ථාවන්ටත් සෑම කාලයටත් ගැළපෙන බව වටහා ගනිමින් සමකාලීන ජීවන ක්‍රමය හැඩගස්වා ගනියි.

ක්‍රියාකාරකම 8.1.2 : ඉස්ලාමීය සීමාවන් තුළ විනෝදාංශ පවත්වා ගනිමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 8.1.2.1 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.2.1 :
- සිසුන්ගේ විනෝදාංශ පිළිබඳ විමසන්න.
- ඔබේ විනෝදාංශ පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- යහපත් විනෝදාංශවලට ඉස්ලාම් පොළඹවන බව පවසන්න.

- පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡා කරන්න.

> - ඉස්ලාම් විනෝදාංශ අනුමත කරන බව.
> - ඉස්ලාම් විනෝදාංශවලට සීමා පනවා ඇති බව.
> - නබි (සල්) තුමා හා සහාබාවරුන්ගේ ජීවිතවල විනෝදාංශ දක්නට තිබූ බව.
> - විනෝදාංශ මගින් යහ ප්‍රයෝජන ලැබෙන බව.

පියවර 8.1.2.2 :
- සිසුන් කණ්ඩායම් තුනකට බෙදන්න.
- කණ්ඩායම්වලට ඇමුණුම් 8.1.2.1 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- ෆෙල්ට් පෑන් හා ඩිමයි කඩදාසි සෑම කණ්ඩායමටම සපයන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරීත්වයේ යෙදෙන්නේදැයි නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 8.1.2.3 :
- කණ්ඩායම් ගවේෂණ පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රථමයෙන් ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු මතුවන සේ සමාලෝචනය කරන්න.

> - මුස්ලිමෙකු තම ජීවිතය සැලසුම් සහිතව පවත්වාගත යුතු බව.
> - මිනිසා කා බී සිනාමුසුව, සතුටෙන් හා විවේක ගනිමින් ජීවත්වීමට ඉස්ලාම් මඟ පෙන්වන බව.
> - විඩාපත්වන සිතට විටින් විට විවේකය දීම අවශ්‍ය බව.
> - නබි (සල්) තුමා දුක් දොම්නස කණගාටුව, නොහැකියාව, අලස බව යනාදියෙන් ආරක්ෂාව පතා ප්‍රාර්ථනා කළ බව. ඔවුන්ගේ අයිතිවාසිකම් ද රකිමින් කටයුතු කළ බව
> - ප්‍රයෝජනවත් දැනුමක් ලබා දෙන උසස් ග්‍රන්ථ, සඟරා, පුවත්පත් කියවීම, ප්‍රයෝජනවත් බීජ හා පැළ සිටුවීම, ප්‍රයෝජනවත් ක්‍රීඩාවල යෙදීම ආදියට ඉස්ලාම් පොළඹවන බව.
> - මිනිසුන්ට අමතක වූ දායාද දෙකක් ඇත. ඒවා නම් නිරෝගී බව හා විවේකය යනුවෙන් හදීසයේ සඳහන් වන බව.
> - නබි (සල්) තුමා දිවීමේ තරග හා මල්ලව පොර යනාදියේ යෙදුන බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :
- විනෝදාංශ පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය දැන පවසයි.
- ඉස්ලාම් අනුමත කළ විනෝදාංශ හඳුනාගෙන ලැයිස්තුගත කරයි.
- ප්‍රයෝජනවත් විනෝදාංශවල යෙදෙයි.
- විනෝදාංශ පිළිබඳව ලැබී ඇති හදීස් රැස්කොට සටහන් කරයි.
- සමාජයට වැඩදායී විනෝදාංශයක් හඳුනාගෙන ඒවා ක්‍රියාවට නගමින් අන් අයත් ඒ සඳහා පොළඹවයි.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ගවේෂණ ක්‍රියාකාරකම් සූදානම් කොට එය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 8.1.2.1

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. නබි (සල්) තුමාගේ ජීවිතයේ දක්නට ලැබුණු විනෝදාංශ දෙකක් සටහන් කරන්න.

කණ්ඩායම් 2. යහපත් විනෝදාංශයක් ක්‍රියාවට නැගීම නිසා ලබා ගත හැකි ප්‍රයෝජන සාකච්ඡා කොට සටහන් කරන්න.

කණ්ඩායම් 3. වැරදි විනෝදාංශයක් මගින් පුද්ගලයාටත් සමූහයාටත් සිදුවන බලපෑම් සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 4. 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන මුස්ලිම් ශිෂ්‍යයෙකුට පිළිපැදීමට සුදුසු වන ප්‍රයෝජනවත් විනෝදාංශ 5 ක් හඳුනාගෙන සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 8.0 : දෛනික කටයුතු පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය දැන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 8.1 : ඉස්ලාම් සියළු අවස්ථාවන්ටත් සෑම කාලයටත් ගැලපෙන බව වටහා ගනිමින් සමකාලීන ජීවන ක්‍රමය හැඩ ගස්වා ගනියි.

ක්‍රියාකාරකම 8.1.3 : උගතුන් සහ ආලිම්වරුන් කෙරෙහි ගරු බුහුමන් දක්වමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 8.1.3.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 8.1.3.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්
- තර්ජමතුල් කුර්ආන්
- ඉස්ලාම් පෙළපොත (10 ශ්‍රේණිය 2000 මුද්‍රණය)

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.3.1 :
- ඇමුණුම් 8.1.3.1 හි ඇතුළත් ඓතිහාසික සිද්ධිය පන්තියේ ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන ශිෂ්‍යයෙකුට කියවීමට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 8.1.3.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව ඔබ නැවත වතාවක් සිසුන් ඉදිරියේ ශබ්ද නගා කියවන්න.
- ඒ සම්බන්ධව සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - ඉස්ලාම් උගතුන්ටත් නබිවරුන්ගේ පරපුරේ අයටත් සලකන බව.
> - අල්ලාහ්ගේ ගැත්තන්ගෙන් ඔහුට අවනතව ක්‍රියාකරන්නේ උගතුන්ය යනුවෙන් කුර්ආනය පවසන බව.
> - උගතුන් හා ආලිම්වරුන්ට ගරු නොකරන්නන් පූර්ණ මුස්ලිම් භක්තිකයෙකු නොවන්නේය යනුවෙන් හදීසයේ සඳහන් බව
> - දෙමාපියන්ට වඩා උගතුන් හා ආලිම්වරුන්ට ගරු කළ යුත්තේ දෙමාපියන් මෙලොව ගින්නෙන් දරුවන් රකින අතර උගතුන් පරලොව ගින්නෙන් ආරක්ෂා කරන නිසා බව.

පියවර 8.1.3 .2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 8.1.3.1 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- අවශ්‍ය වන ආධාරක ග්‍රන්ථ සපයන්න.
- ඔවුන් ක්‍රියාවේ යොදවා නිරීක්ෂණය කරන්න.

පියවර 8.1.3.3 :
- තමන් සාකච්ඡා කොට ලබාගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට එකිනෙක කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ අදහස්වල දුර්වලතා සකසා ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු මතුවන වන අයුරින් සමාලෝචනය කරන්න.

> - අධ්‍යාපනයට වැදගත්කමක් දක්වන ඉස්ලාමය එය දරා සිටින උගතුන්ටත් ගෞරව දක්වන බව.
> - අල්කුර්ආනය නූගතුන්ට වඩා උගතුන් උසස් කොට සලකන බව.
> - අල්ලාහ් පිළිබඳව අධික වශයෙන් දැනගත් උගතුන්, ඔහුට ඉතාමත් ගැතිව කටයුතු කරන අතරම ඔහුට සමීපව සිටින බව.
> - පැහැදිලි විස්තරයක් උගතුන්ගෙන් ලබාගන්නා ලෙසත් සැකයක් වෙතොත් එමගින් දුරුකර ගන්නා ලෙසත් කුර්ආනය මග පෙන්වන බව.
> - හදීසයේ, නැමදුම් කරන්නන්ටත් වඩා උගතුන් උසස් ලෙස දක්වන බව.
> - දැනුම පතුරුවන උගතුන්ට සාගරයේ හා ගොඩබිමේ සිටින සියලු ජීවීන් ප්‍රාර්ථනා කරන බව.
> - ඉස්ලාමීය සමාජයේ කවදත් උගතුන් ගෞරවයට ලක් වූ බව.
> - තමාට දැනුම සැපයූ පුද්ගලයාට තමා සේවකයෙක් වන බව.
> - ඉමාම්වරුන්ගෙන් හදීස් ඉගෙනීමට ආ සිසුන්, ඔවුන් ඉදිරියේ ශබ්ද නගා කතා කිරීමෙන් වැළකී ඔවුන් හා තර්ක නොකර ඔවුන් ඉදිරියේ ගෞරව බහුමානයෙන් යුතුව කටයුතු කළ බව.
> - දැනුම ලබා දෙන ආලිම්වරුන්ගේ ආවතේව කටයුතු කිරීමෙන් කලීෆාවරු පවා ආඩම්බර වූ බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- දැනුම පතුරුවන උගතුන්, නූගතුන්ට වඩා අල්ලාහ් ඉදිරියේ උසස් වන බව දැන ගනියි.
- නූගතුන්, නූගත් නැමදුම්කරුවන් පසෙකලා තමාට මහ පෙන්වීම් ලබා ගැනීමට සුදුසු උගතුන් වෙන්කොට හඳුනා ගනියි.
- උගතුන්ට ගරු කළ යුතුය යන්න සඳහන් අල්කුර්ආන් සුන්නා මූලාශ්‍ර අවබෝධ කොට ක්‍රියා කරයි.
- උගතුන්ට ගෞරව දැක්විය යුතු ක්‍රම දැන ජීවිතයේ පිළිපදියි.
- උගතුන්ට ගරු කරමින් කටයුතු කිරීමට අන් අය පොළඹවයි.

ඇමුණුම 8.1.3.1

විස්තර පත්‍රිකාව

## ගුරුවරයාගේ පාවහන් රජකුමරා

කලීෆා හාරූන් රෂීද්, තම දරුවන් දෙදෙනා වන අමීන්, මාමූන් යන දෙදෙනාම අධ්‍යාපනය ලැබීම සඳහා උගතෙකු වෙත යැවීය. දිනක් එම උගතා කලීෆා හමුවීමට මාලිගාවට පැමිණියේය.

මෙය දුටු රජ කුමරුන් දෙදෙනා එම උගතාගේ සෙරෙප්පු එකිනෙක රැගෙන ඔහුගේ පසුපස ගමන් කළහ.

මෙවිට කලීෆා හාරූන් රෂීද් ඉදිරියට පැමිණියේය. රජ කුමරුන් දෙදෙනාට සෙරෙප්පු රැගෙන එමට අනුමැතිය දීම නිසා කලීෆා තමාට දොස් පවරයිදෝ යනුවෙන් එම උගතා තමන් තුළ සිතා දුක් විය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නමුත් සිදුවූයේ වෙනත් දෙයකි. කලීෆා මෙම සිද්ධිය දැක කම්පා නොවීය. ඒ වෙනුවට සිනා මුසු මුහුණින් යුතුව මෙසේ පැවසීය. "මාගේ ජීවිතයේ ඉතාමත් සතුටුදායක දර්ශනය අද දකින්නෙමි" යනුවෙන් තම ගුරුවරයාගේ සෙරෙප්පු රැගෙන සිටින රජ කුමරුන් දෙදෙනා පෙන්විය.

ඔබ අතර සිටින විශ්වාසවන්තයන්ටත් අධ්‍යාපනික දැනුම ඇත්තන්ටත් අල්ලාහ් පදවිය උසස් කරයි.( 58:11) යන අල්කුර්ආන් වැකිය මෙම සිද්ධිය තහවුරු කරනවා නොවේ ද ?

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියළු දෙනා එහි මුළු අවධානය යොමු කරන්න.
- සාකච්ඡා කොට ලබාගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 8.1.3.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. තර්ජමතුල් කුර්ආනයේ ලේඛනයේ උපකාරයෙන් උගතුන් පිළිබඳව ඇති වාක්‍ය රැස්කර සටහන් කරන්න.

කණ්ඩායම් 2. ඉස්ලාම් පෙළපොත (10 ශ්‍රේණිය, ප්‍රථම මුද්‍රණය 2000) උදව් කොට ගෙන උගතුන්ගේ වැදගත්කම පිළිබඳව ඇති හදීස් රැස්කොට සටහන් කරන්න.

කණ්ඩායම් 3. සමාජමය වශයෙන් ආලිම්වරුන්ට ගෞරව දක්වන ක්‍රියාත්මක අවස්ථා දෙකක් සටහන් කරන්න.

කණ්ඩායම් 4. ඔබේ ජීවිතයේ උගතුන්ට ගෞරව දැක්වූ අවස්ථා දෙකක් පවසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 8.0 : දෛනික කටයුතු පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය දැන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 8.1 : ඉස්ලාම් සියළු අවස්ථාවන්ටත් සෑම කාලයටත් ගැලපෙන බව වටහා ගනිමින් සමකාලීන ජීවන ක්‍රමය හැඩගස්වා ගනියි.

ක්‍රියාකාරකම 8.1.4 : මානව ශිෂ්ටාචාරයට මූලික වශයෙන් මුස්ලිම්වරුන් දැක්වූ දායකත්වය අගය කරමු.

කාලය : විනාඩි 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 8.1.4.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 8.1.4.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්
- ඉස්ලාම් පෙළපොත (11 ශ්‍රේණිය ප්‍රථම මුද්‍රණය 2000)
- තර්ජමතුන් කුර්ආන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.4.1 :
- ඇමුණුම් 8.1.4.1 හි ඇතුළත් ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
- නිවැරදි පිළිතුරු සැපයීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- ඒ සම්බන්ධව සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - අල්කුර්ආන් හා සුන්නා ගවේෂණයට පොළඹවන බව.
> - මෙම පෙළඹවීම් නිසා විවිධ ක්ෂේත්‍ර ඔස්සේ දැනුම ගවේෂණය කිරීමට මුස්ලිම්වරුන් ඉදිරිපත් වූ බව.
> - වෛද්‍ය, ජීව විද්‍යා, ගණිත, භූගෝල විද්‍යාව, රසායන විද්‍යා හා ශාස්ත්‍රීය ක්ෂේත්‍රයන්හි මුස්ලිම්වරුන් සැලකිය යුතු දායකත්වයක් දැක්වූ බව.
> - ඉබ්නු සීනා, අල් රාසි, ඉබ්නු නෆීස් ඉබ්නු හයිතමෙ යනාදීන් දැනුම ගවේෂණයේ යෙදුණු මුස්ලිම් යුග පුරුෂයන් වන බව.

පියවර 8.1.4 .2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 8.1.4.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව එකිනෙක කණ්ඩායම්වලට සපයන්න.
- අවශ්‍ය ගවේෂණයේ මූලාශ්‍ර ග්‍රන්ථ සපයන්න.
- ඔවුන් ගවේෂණයෙහි යොදවා නිරීක්ෂණය කරන්න.

පියවර 8.1.4.3 :
- ලබාගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ කරුණුවල දුර්වලතා සම්පූර්ණ කිරීමට එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු මතුවන වන අයුරින් සමාලෝචනය කරන්න.

> - ග්‍රහ, තාරකා, සතුන්, කඳු, පක්ෂීන් යනාදිය පිළිබඳව ගවේෂණය කරන මෙන් අල්කුර්ආනය පවසන බව.
> - මධ්‍යතන යුගයේ යුරෝපය අඳුරේ පැවති යුගයේ දී මුස්ලිම්වරු දැනුම ගවේෂණයේ ඉදිරියෙන් සිටි බව.
> - විනාශ මුඛයේ පැවති ග්‍රීක, රෝම සහ ප්‍රංශ ඥාන උල්පත් ආරක්ෂා කොට වැරදි ඉවත්කොට, අළුත් දැ එකතුකොට නූතන යුරෝපයට ලබා දුන් ගෞරවය මුස්ලිම්වරුන්ට හිමිවන බව.
> - වෛද්‍ය ක්ෂේත්‍රයේ ඉබ්නු සීනා, ඉබ්නු නෆීස්, අර්රාෆි, ඉබ්නු රෂීද් යන අය මූලික වශයෙන් වැජඹුනු බව.
> - අභ්‍යවකාශ ක්ෂේත්‍රයේ ක්වාරිස්මි සනත් ඉබ්නු අලි, ඉබ්නු අල් හර්හාන්, ඉබ්රාහීම් අල් බසාරි යන අය මූලික වූ බව.
> - ගණිත ක්ෂේත්‍රයේ අලිකින්ති, අල්කුවාරිස්මි, අල්බිරානි, ඉබ්නුල් හයිතම් යන අය මූලිකත්වය ගත් බව.
> - භූ විද්‍යා ක්ෂේත්‍රයේ අල් ඉද්රීසි අල් යඃකුබ්, ඉබ්නු ෂහ්රයාර් අල් මත්දිසි යන අය ඉදිරියෙන් සිටි බව.
> - මීට අමතරව ජීව විද්‍යා, කලා කුසලතා මෙන්ම නීතිය හා සම්බන්ධ උසූලුල් ෆික්හ් හදීස් කලාවට සම්බන්ධ උසූලුල් හදීස් ඉල්මුල් ජරහ් වත්තඃදිල්, අල්කුර්ආන් යනාදියෙන් මුස්ලිම්වරුන් වැඩි දායකත්වයක් දැක් වූ බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායකම

- මානව ශිෂ්ටාචාරයට දැනුම ක්ෂේත්‍රයෙන් මුස්ලිම්වරුන් පුළුල් දායකත්වයක් ලබාදුන් බව දැන ප්‍රකාශ කරයි.
- මුස්ලිම්වරුන් දැනුම් ක්ෂේත්‍රයට දැක්වූ දායකත්වය දැන අගය කරයි.
- දැනුම් ක්ෂේත්‍රයට ඉස්ලාම් පොළඹවන බව අල්කුර්ආන් මූලාශ්‍ර කොට නිරූපණය කරයි.
- මුස්ලිම් විද්‍යාඥයන් හා ඔවුන්ගේ සොයා ගැනීම් ලේඛනගත කරයි.

ඇමුණුම 8.1.4.1

ප්‍රශ්නාවලිය

- විලියම් හාවි ට පෙර රුධිර සංසරණය සොයාගත් මුස්ලිම් විද්‍යාඥයා කවුද?
- ලුවීයි පාස්චර් ට පෙර ක්ෂුද්‍ර ජීවීන්ගේ බලපෑම් සොයාගත් මුස්ලිම් විද්‍යාඥයා කවු ද?
- විකිරණ විද්‍යාවේ පියා යනුවෙන් අමතන මුස්ලිම් විද්‍යාඥයා කවුද ?
- රසායන විද්‍යාවේ පියා යනුවෙන් අමතන මුස්ලිම් විද්‍යාඥයා කවුද ?
- වෛද්‍ය ක්ෂේත්‍රයේ බයිබලය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද ?

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- ඔබේ කණ්ඩායමට අදාළ ගවේෂණ පත්‍රිකාව වෙත අවධානය යොමු කරන්න.
- සාකච්ඡා කොට රැස් කර ගත් තොරතුරු වාර්තා කොට පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 8.1.4.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. තර්ජමතුල් කුර්ආනයේ උපකාරයෙන් "ජුස්උ අම්ම" හි සටහන් වී ඇති දැනුම ගවේෂණයට පොළඹවන කුර්ආන් වැකි 5 ක් තෝරා සටහන් කරන්න.

කණ්ඩායම් 2. වෛද්‍ය ක්ෂේත්‍රයේ මූලික වූ මුස්ලිම් විද්‍යාඥයාගේ නම් ලේඛනගත කරන්න.

කණ්ඩායම් 3. භූ විද්‍යා ක්ෂේත්‍රයේ දායකත්වය දැක්වූ මුස්ලිම් විද්‍යාඥයන්ගේ නම් ලේඛනගත කරන්න.

කණ්ඩායම් 4. මුස්ලිම් විද්‍යාඥයන් විසින් රචිත ග්‍රන්ථවල නම් ලේඛනගත කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 8.0 : දෛනික කටයුතු පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨිය දැන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 8.1 ගනිමින් : ඉස්ලාම් සියළු අවස්ථාවන්ටත් හා සෑම කාලයටත් ගැලපෙන බව වටහා සමකාලීන ජීවන ක්‍රමය හැඩගස්වා ගනියි.

ක්‍රියාකාරකම 8.1.5 : ප්‍රාතිහාර්යටත් දේව මාර්ගෝපදේශය වන අල්කුර්ආනය පිළිපදිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 8.1.5.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 8.1.5.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- අල්කුර්ආන් පරිවර්තනය (අවශ්‍ය වන පිටපත්)
- උපකාරක ග්‍රන්ථ
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.5.1 :
- ඇමුණුම් 8.1.5.1 හි ඇතුළත් ඓතිහාසික සිද්ධිය ශිෂ්‍යයෙකු ලවා කියවීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.

> - අල්කුර්ආනය අල්ලාහ්ගෙන් පහළ වූ විශ්මයජනක ග්‍රන්ථයක් බව.
> - අල්කුර්ආනය තම ආශ්චර්යමත් බව ඉදිරිපත්කර එයට අභියෝග කරන බව.
> - අල්කුර්ආනයේ අභියෝගයන්ට මුහුණ දුන් අය පරාජය වූ බව.
> - අල්කුර්ආනයේ විශ්මයජනක බව.
>   එය, දැනුම ක්ෂේත්‍රය
>   භාෂා ක්ෂේත්‍රය
>   නීති ක්ෂේත්‍රය යටතේ වර්ග කළ හැකි බව.

පියවර 8.1.5.2 :
- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- ඇමුණුම 8.1.5.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව කණ්ඩායම්වලට සපයන්න.
- අවශ්‍ය ප්‍රමාණයෙන් පාට පෑන් හා ඩිමයි කඩදාසි සපයන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කරන්න.

පියවර 8.1.5.3 :
- තමන් ලබාගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ අදහස්වල දුර්වලතා සකසා ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු මතුවන වන අයුරින් සමාලෝචනය කරන්න.

> - අල්කුර්ආනයේ විශ්මයජනක බවට හේතු වන්නේ එය අල්ලාහ්ගෙන් පහළවීම බව.
> - ඔබට හැකිනම් මෙවැන්නක් ගෙන එන්නැයි අල්කුර්ආනය අභියෝග කරන බව.
> - අල්කුර්ආනයේ භාෂා විලාශයෙන් නිර්මාණ බිහිකිරීමට උත්සාහ ගත් ඒ යුගයේ කවීන්ද තම නොහැකියාව පිළිබඳ ලැජ්ජාවී හිස පහත් කොටගත් බව.
> - අල්කුර්ආන් පරායනය ඇසීමට පවා විරුද්ධ වූ පුද්ගලයන් කුර්ආනයේ වර්ගීකරණයට ලක් වූ බව.
> - අල්කුර්ආනයට විරුද්ධ පුද්ගලයන්ට එය ඇසීමෙන් පසුව තමන්ට නොදැනීම ප්‍රශංසනාත්මක ව කතා කළ බව.
> - නූතන ලෝකයේ විවිධ විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳව අල්කුර්ආනය පෙරයීම් කොට ඇති බව.
> - අපක්ෂපාතීත්වයෙන් යුත් අල්කුර්ආනයේ නීති ක්‍රමයන් සෑම කාලයටම උචිත වීමත් එහි ප්‍රාතිහාර්යයක් වන බව.
> - අල්කුර්ආනය කාලයා විසින් උසස් කරනු ලැබීම ද එහි තවත් ප්‍රාතිහාර්යක් වන බව.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- අල්කුර්ආනය විශ්මයජනක මාර්ගෝපදේශයක් යන්නට හේතු දැන පවසයි.
- අල්කුර්ආන් පෙන්වන ප්‍රාතිහාර්යයන් හඳුනාගෙන පවසයි.
- විශ්මිත ග්‍රන්ථයක් වන අල්කුර්ආනය මාර්ගෝපදේශයක් ලෙස ලැබීම පිළිබඳව ඉමහත් සතුටට පත්වෙයි.
- අල්කුර්ආන් පවසන දැනුමේ සත්‍යතාවන් ලේඛනගත කර පෙන්වයි.
- අල්කුර්ආනයේ මහිමය අන් අයටත් පවසයි.

ඇමුණුම 8.1.5.1

විස්තර පත්‍රිකාව

ඉතිහාසයෙන් එක් සටහනක්

අබ්බාසීය යුගයේ ජීවත් වූ සුප්‍රසිද්ධ අරාබි ව්‍යාකරණ හා සාහිත්‍යධාරියෙකු ලෙස අබ්දුල්ලාහ් ඉබ්නු මුහප්පා හැඳින්විය හැකිය. අල්කුර්ආනයේ අභියෝගයට පිළිතුරු දීමට අපේක්ෂා කළ පිරිසක් කුර්ආනය මෙන් ග්‍රන්ථයන් සැකසීමේ වගකීම මෙම අබ්දුල්ලා ඉබ්නු මුහප්පාට භාර කළේය. ඒ සඳහා දීර්ඝ කාලයක් ගත කිරීමට සිදුවන බව පැවසූ බැවින් ඔහුට අවශ්‍ය උපකාරයන් හා ඔහුගේ ඉල්ලීම් සියල්ල ඉටුකර දීමට ඔවුන් ඉදිරිපත් වූහ.

අබ්දුල්ලා බින් මුහප්පාට ලබාදුන් කාලය ද නිමා විය. වගකීම් භාරදුන් පිරිස ඔහු හමුවීමට පැමිණියේය. ඔහු දීර්ඝ කල්පනාවක නිමග්නව සිටියේය. ඔහුගේ කාමරයේ ලියා ඉරා දමන ලද ලේඛන කොටස් ඒ මේ අත විසිරී තිබෙනු දක්නට හැකිවිය. සතුටෙන් පැමිණි එම පිරිසගේ මුහුණු අබ්දුල්ලා බින් මුහප්පාගේ පිළිතුරෙන් හැකිළී ගියේය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

මා මෙතෙක් කල් උත්සාහ කළත් ඔබ පැවරූ වගකීම ඉටුකළ නොහැකිව සිටින්නෙමි.
මෙය ඔහුගේ පිළිතුර විය.

(මව්ලානා වහීදුද්දීන් විසින් රචිත ග්‍රන්ථයන් උපුටා ගන්නා ලදී.)

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියළු දෙනා ඒ මත අවධානය යොමු කරන්න.
- සාකච්ඡා කොට ලබාගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 8.1.5.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. යාසීන් සූරාවේ 37 - 40 දක්වා වාක්‍ය කියවා එහි අන්තර්ගත ව ඇති විද්‍යාත්මක තොරතුරු සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 2. අන්බියා සූරාවේ30 වැනි වාක්‍යයේ පරිවර්තනය සටහන් කොට එයට පහළින් විශ්වයේ බිහිවීම පිළිබඳ නවීන විද්‍යාව පවසන කරුණු ලියන්න.

කණ්ඩායම් 3. අන්නූර් සූරාවේ 43 වන වැකිය සටහන් කර වර්ෂාපතනය ලැබෙන ආකාරය පිළිබඳ විද්‍යාත්මක විස්තරය සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 8.0 : දෛනික කටයුතු පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය දැන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 8.1 : ඉස්ලාම් සියළු අවස්ථාවන්ටත් සෑම කාලයටත් ගැලපෙන බව යන්න වටහා ගෙන සමකාලීන ජීවන ක්‍රමය හැඩගස්වා ගනී.

ක්‍රියාකාරකම 8.1.6 : ඉස්ලාමීය සීමාවන් තුළ විනෝදාංශ පවත්වා ගනිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 8.1.6.1 හි ඇතුළත් තොරතුරු පත්‍රිකාව
- ඇමුණුම 8.1.6.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- රියාලුස්සාලිහීන් පරිවර්තනය
- තර්ජතුල් කුර්ආන්
- ආධාරක ග්‍රන්ථ - සිත පිළිබඳ ඉමාම් ගස්සාලි රචිත ග්‍රන්ථ
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.6.1 :
- ඇමුණුම් 8.1.6.1 හි ඇතුළත් අල්කුර්ආන් වාක්‍යයන් අලංකාර ලෙස පාරායනය කළ හැකි සිසුවෙක් ලවා කියවීමට සලස්වන්න.
- වෙනත් ශිෂ්‍යයෙකුට එහි අර්ථය කියවීමට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් කරුණු මතු වනසේ සාකච්ඡා කරන්න.

| |
|---|
| • සිත ආරෝග්‍යවත් කොට ජීවත්වීම ඉස්ලාම් අගය කරන බව.<br>• කලාකද්ර් පිළිබඳ විශ්වාසය මගින් සිත ආරෝග්‍යමත් වන බව.<br>• සිත ආරෝග්‍යවත් වන බව<br>• සිතේ ආරෝග්‍යවත් භාවය යනු<br>පහත් සිතුවිලි වලින් ද<br>අනවශ්‍ය බිය හා ශෝකයෙන් ද<br>ලබාගත නොහැකි අනවශ්‍ය ආශාවන්ගෙන් ද<br>ඊර්ෂ්‍යාවෙන් හා ආඩම්බරකමින් ද<br>සිත නිදහස්ව පවත්වා ගැනීම බව.<br>• පරලොව විමුක්තිය සඳහා සිතේ ආරෝග්‍යවත් වීම අත්‍යවශ්‍ය බව |

පියවර 8.1.6.2 :
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම් 8.1.6.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා කණ්ඩායම් වලට සපයන්න.
- අවශ්‍ය මූලාශ්‍ර ග්‍රන්ථ සපයන්න.
- ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් ආදිය අවශ්‍ය ප්‍රමාණයෙන් සපයන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට මග පෙන්වන්න.

පියවර 8.1.6.3 :
- තමන් සාකච්ඡා කොට ලබාගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න.
- ඉදිරිපත් කළ අදහස්වල දුර්වලතා සකසා ගැනීමට එම කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත කරුණු ඔස්සේ සාකච්ඡාවේ යෙදෙන්න.

> - සිතට අවශ්‍යවන පෝෂණය ලබාදුන් විට සිත ආරෝග්‍යවත් වන බව.
> - අල්කුර්ආනය සිතට පහළ කළ බැවින් එය සිතට ආරෝග්‍යය ලබා දෙන බව
> - ස්ථිර ඊමානය සිත ආරෝග්‍යමත් කරන බව
> - අල්කුර්ආනය පාරායනය කිරීමෙන් හා අල්ලාහ්ව දික්ර් කිරීම මගින් සිත සන්සුන් වන බව
> - අනවශ්‍ය ආශාවන් හා අනවශ්‍ය ශෝකයන් සිතේ ආරෝග්‍යවත් භාවයට හානි පමුණුවන බව
> - අල්ලාහ්ගේ කැමැත්තට සියල්ල සිදුවන බැවින් ආශා කිරීම් හා ශෝකවීම්වල ප්‍රයෝජනයක් නොමැති බව
> - ස්වර්ගයේ උසස් දිවියක් අල්ලාහ් දෙනු ලබන බැවින් විනාශ වී යන මෙලොව යහතින් ගත කළ යුතු බව
> - තමාට අත්විඳීමට සිදුවන සියළු ආකාර පරීක්ෂණවල දී ඒවා දරා ගැනීම, ආරෝග්‍ය සිත් ඇත්තන් ඉවසිලිවන්තයන් වන බව
> - ඉවසිලිවන්තයන් සැමවිටම බලවත් හා ආරෝග්‍යවත් සිත් ඇත්තන් වන බව. මන්දයත් ඔවුන් සමග අල්ලාහ් සිටින බව

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- සිත ආරෝග්‍යවත් වන්නේ කෙසේදැයි දැන පවසයි.
- චිත්ත ආරෝග්‍යවත් භාවයට වින කරන කරුණු හඳුනාගෙන පවසයි.
- ශරීරය මෙන් සිතත් ආරෝග්‍යමත් බව පවත්වාගත යුතු බැවින් ඒ සඳහා උනන්දුවෙන් කටයුතු කරයි.
- සිතේ ආරෝග්‍යවත් ව ලබාදෙන කටයුතුවල නියැලෙයි.
- අන් අය හා සම්බන්ධ වීමේ දී උසමබර මානසිකත්වයක් පෙන්වයි.

තොරතුරු පත්‍රිකාව

ඇමුණුම 8.1.6.1

مَا أَصَابَ مِنْ مُصِيبَةٍ فِي الْأَرْضِ وَلَا فِي أَنْفُسِكُمْ
إِلَّا فِي كِتَابٍ مِنْ قَبْلِ أَنْ نَبْرَأَهَا إِنَّ ذَلِكَ عَلَى اللهِ يَسِيرٌ
لِكَيْلَا تَأْسَوْا عَلَى مَا فَاتَكُمْ وَلَا تَفْرَحُوا بِمَا آتَاكُمْ
وَاللهُ لَا يُحِبُّ كُلَّ مُخْتَالٍ فَخُورٍ .

භූමියෙහිත් ඔබ තුළත් හටගන්නා කවරාකාර දුක්පීඩා වුවත් ඒ සියල්ල ඉටුවීමට පෙර අප සටහන් කර තැබූ දෑ මිස තවෙකක් නොවේ. මෙසේ කිරීම අල්ලාහ්ට ඉතා පහසු වන්නේ ය.

ඔබට නොලැබූ දෙයින් කම්පා නොවීමටත් ලැබූ දෙයින් අහංකාර නොවීමටත් මෙසේ සටහන් කර ඇත්තෙමු.

මමත්වයෙන් හා ආඩම්බරයෙන් යුත් කිසිවෙකු අල්ලාහ් ප්‍රිය නොකරන්නේ ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :
- ගවේෂණ පත්‍රිකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
- සකස් කළ වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 8.1.6.2

ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් 1. මනසට සතුටක් ආරෝග්‍යවත් භාවයත් ලබාදෙන කරුණු සාකච්ඡා කොට සටහන් කරන්න.

කණ්ඩායම් 2. මනසේ ආරෝග්‍යවත් භාවය කෙලෙසන කරුණු සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 3. ආරෝග්‍යවත් සිතක් නොමැත්තෙක් කෙසේ සිටින්නේ දැයි සාකච්ඡාකර සටහන් කරන්න.

කණ්ඩායම් 4. මනසට ආරෝග්‍යවත් භාවය ලබා දීමට සුදුසු ක්‍රියාවන් සොයා සටහන් කරන්න.

කණ්ඩායම් 5. විභාගයෙන් අසමත්වීම හේතුවෙන් චිත්ත පීඩාවට පත් කෙනෙකුගේ මානසික ආරෝග්‍යභාවයට ඉදිරිපත් කළ හැකි යෝජනා හඳුනාගෙන සටහන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

# තක්සේරුව හා ඇගයීම්

## III කොටස

# තක්සේරු හා ඇගයීම් විස්තර

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩ සටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම් හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සියලු ම සිසුනට අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාව වත් ලබා ගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ලඟා කරගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරු කිරීමේ යෙදී සිටින ගුරුවරුනට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (FEED BACK) හා ඉදිරිපෝෂණය (FEED FORWARD) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම්ග ැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයක් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයක් ලබා දීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ  පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව - ශිෂ්‍ය කේන්ද්‍රිය (STUDENT - CENTRED) නිපුණතා පාදක (COMPETENCY - BASED) ක්‍රියාකාරකම් දිශාභිමුඛ (ACTIVITY - ORIENTED) කරගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම් ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ (TRANSFORMATION ROLE) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්නතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාව ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි - පියවරේ දී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරුකරණයටත් ක්‍රියාකාරකම්වල තුන් වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම් පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණයක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශී වී තිබෙන දැනුම, ආකල්ප හා කුසලතා මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුනට අත දේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්ති කාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ගොඩ නැගීම තහවුරු කිරීමටත් ඇගයීම යටතේ එසේ ගොඩ නගා ගත් චර්යා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.

තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල වැඩිදියුණු කිරීමෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. මෙසේ ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා මුලින්ම කළ යුත්තේ ක්‍රියාකාරකම් සන්නතියට ඇතුළත් ක්‍රියාකාරකම්, කාණ්ඩ කිහිපයකට වෙන්කර ගැනීමයි. සිසු ඉගෙනුම විකසිත කළ හැකි ප්‍රභේද කිහිපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කර ගනිමින් දෙවනුව හඳුනා ගත යුතුයි. තෝරාගත් ප්‍රභේද පදනම් කරගෙන ගුරුවරයාට හා සිසුන්ට උපදෙස් ඇතුළත් වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කෙරෙන උපකරණ සකසා ගැනීම ඊළඟ පියවර වන අතර සෑම ක්‍රියාකාරකම් කාණ්ඩයක් ආරම්භයේ දී ම මෙම උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යයකි. මේ අනුව ඉගෙනුම හා ඉගැන්වීම් දීර්ඝ කිරීම සඳහා ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් මතු දැක්වේ:

- සංකල්ප සිතියම්
- බිත්ති පුවත්පත්
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
- ශිෂ්‍යය කාර්ය සාධන ගොනු
- සිසු නිර්මාණ ප්‍රදර්ශන
- විවාද
- සාකච්ඡා මණ්ඩල
- සම්මන්ත්‍රණ
- ක්ෂණික කථා
- භූමිකා රංගන
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම
- ක්ෂේත්‍ර පොත්/ස්වභාව අධ්‍යයන දින පොත්/හොඳ වැඩ පොත්
- ප්‍රයෝගික පරීක්ෂණ

පාඨමාර්ගයේ තුන්වන කොටස යෝජිත ඉගෙනුම හා ඉගැන්වීම් දීර්ඝ කිරීමේ අවස්ථා හා ඒ සඳහා තෝරා ගෙන ඇති උපකරණ හඳුන්වා දීමට සැලසුම්කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් තක්සේරුව හා ඇගයීම දෙයාකාරයෙකින් සිදු කිරීමෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුළුල් වන අතර ආශාවෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමේ නියැලීමට සිසුනට හැකි වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ

උපකාරණ අංක 1

1. පාසල් වාරය : පළමු වන වාරය

2. අන්තර්ගත නිපුණතා මට්ටම : 2.1.2

3. අන්තර්ගත විෂය සන්ධාරය : වුලුඋ
තයම්මුම්
ජබීරත්

4. උපකරණයේ ස්වභාවය : රූප සටහන් ගොනුවක්

5. උපකරණයේ අරමුණු : වුලුඋ, තයම්මුම්, ජබීරත් සම්බන්ධ දැනුම ලබාගනියි.
මෙම ක්‍රියා ආදර්ශනය කිරීමේ හැකියාව ලබාගනියි.
අන් අයට ආදර්ශනය කිරීම සඳහා වෙනත් ක්‍රම ඇති බව වටහා ගනී.

6. උපකරණය ක්‍රියාත්මක කිරීමට උපදෙස් :

ගුරුවරුන් සඳහා : ක්‍රියාකාරකම ක්‍රියාත්මක කරන ආකාරය පන්තියට කෙටියෙන් විස්තර කරන්න.

සිසුන් කණ්ඩායම් තුනකට බෙදන්න.
එක් එක් කණ්ඩායම ඔවුන්ට දෙන ලද මාතෘකාවට අදාළ රූප සටහන් ගොනුව සැකසීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දෙන්න.
අවශ්‍ය උපකරණ කණ්ඩායම් විසින් සොයා ගැනීමට යොමු කරන්න.
ක්‍රියාකාරකම සඳහා කාලය තීරණය කරගන්න.
අවශ්‍ය ප්‍රතිපෝෂණ දෙන්න.
නිර්ණායක අනුව ලකුණු ප්‍රදානය කරන්න.

සිසුන් සඳහා

උපදෙස් අනුව ක්‍රියා කරන්න.
පෙළ පොත්වල හා වෙනත් පොත්වල දක්නට ලැබෙන රූප සටහන් හෝ ඡායා පිටපත් සොයා ගන්න.
පහසු අවස්ථාවකදී රූස්ව ක්‍රියාවල යෙදෙන්න.
අවසන් දිනයට පෙර රූප සටහන් ගොනුව ඉදිරිපත් කරන්න.

කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම්

කණ්ඩායම් 1 — වුලුඋ කරන්නේ කෙසේ ද? යන්න මුල් ක්‍රියාවේ සිට අවසාන ක්‍රියාව දක්වා පියවර වශයෙන් රූප සටහන්වල ඇඳ දක්වන්න.

කණ්ඩායම් 2 — තයම්මුම් කරන ආකාරය ආරම්භයේ සිට අවසානය දක්වා රූප සටහන් මගින් දක්වන්න.

කණ්ඩායම් 3 — තුවාල වූ අයෙකු තම දකුණතෙහි ජබීරත් දමයි. ඔහු වුලුඋ කරන්නේ කෙසේ ද යන්න පියවරෙන් පියවර රූප සටහන්වල ඇඳ දක්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ලකුණු දීමේ නිර්ණායක

| නිර්ණායක / කණ්ඩායම් අංක | ඉගෙනීමේ අරමුණු හා නිර්මාණය අතර ගැලපීම | සැකැස්මේ අදාළ බව | අරමුණු හා නිර්මාණ අතර සම්බන්ධතාව | අලංකාරය හා පිළිවෙල | මුළු ලකුණු |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |

ලකුණු පටිපාටිය

ඉතා හොඳයි 04

හොඳයි 03

සාමාන්‍යයි 02

සංවර්ධනය විය යුතුයි 01

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් දීර්ඝ කිරීම සඳහා උපකරණ

උපකරණ අංක 2

1. පාසල් වාරය : දෙවන වාරය

2. අන්තර්ගත නිපුණතා මට්ටම : 4.1.4 4.1.5

3. අන්තර්ගත විෂය සන්ධාරය : දෙමාපියන්ට ගරු කරමු. (හුකුකුල් ඉබාද්)

4. උපකරණයේ ස්වභාවය : බිත්ති පුවත්පත

5. උපකරණයේ අරමුණ : දෙමාපියන් අසල්වැසියන් නෑදෑයින් ආදීන්ට ඉටු කළ යුතු වගකීම් දැන ගනී.

එම වගකීම් ඉටු කිරීමේ ආකල්පය ලබයි.
උදව් උපකාර කරන ක්‍රම හඳුනා ගනී.
දෙමාපියන් අසල් වැසියන් නෑදෑයින් ආදීන්ට උදව් උපකාර කරයි.

6. උපකරණ ක්‍රියාත්මක කිරීමේ උපදෙස් ගුරුවරුන් සඳහා : ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ආකාරය කෙටියෙන් පහදා දෙන්න.
සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.

සෑම කණ්ඩායමකටම ඒ ඒ කණ්ඩායමට දෙන ලද මාතෘකාව අනුව උපදෙස් ලබා දෙන්න.
අවශ්‍ය උපකරණ හා තොරතුරු රැස්කර ගැනීමට යොමු කරන්න.
ක්‍රියාකාරකම සඳහා කාලය තීරණය කරගන්න.
අවශ්‍ය විට ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
නියමිත නිර්ණායක අනුව ලකුණු ලබාදෙන්න.

සිසුන් සඳහා : උපදෙස් අනුව ක්‍රියා කරන්න.
පෙළපොත්වලින් හෝ වෙනත් පොත් පත්වලින් තොරතුරු ලබා ගන්න.
නැතහොත් ඔබේ අත්දැකීම පදනම් කොට ලියන්න.
ක්‍රියාකාකරකම සඳහා සැලැස්මක් සකස් කරගන්න.
නියමිත වේලාවේදී ක්‍රියාකාරකම අවසන් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම්

කණ්ඩායම් 1 ඔබ සැම දෙනාම ඔබේ මවට කළ උදව් උපකාර දෙක බැගින් ලියන්න. ඔබ එසේ ක්‍රියා කිරීමට හේතු සඳහන් කරන්න.

කණ්ඩායම් 2 ඔබ සැම දෙනාම ඔබේ පියාට කළ උදව් දෙක බැහින් ලියන්න. ඔබ එසේ උපකාර කළේ ඇයි?

කණ්ඩායම් 3 ඔබ සැම දෙනාම ඔබේ අසල්වැසියන්ට කළ උපකාර දෙක බැගින් ලියන්න. ඔබ එසේ ක්‍රියා කිරීමට හේතුව ලියන්න.

කණ්ඩායම් 4 ඔබ සැම දෙනාම ඔබේ නෑදෑයින්ට කළ උදව්වක් බැගින් ලියන්න. ඔබ එසේ කිරීමට හේතුව කුමක්ද?

| නිර්ණායක / කණ්ඩායම් අංක | මාතෘකාව අදාළත්වය | ක්‍රමවේදවල අදාළත්වය | සංවිධානය හා ඉදිරිපත් කිරීම | අලංකාරය ක්‍රමවත් බව සැකැස්ම | අරමුණු ඉටුවීම | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |

ලකුණු පටිපාටිය

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| සාමාන්‍යයි | 02 |
| සංවර්ධනය විය යුතුයි. | 01 |

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

උපකරණ අංක 3

| | | | |
|---|---|---|---|
| 1. | පාසල් වාරය | : | තුන් වන වාරය |
| 2. | අන්තර් නිපුණතා මට්ටම | : | 6.2.1 හාර 6.2.2 |
| 3. | අන්තර් විෂය සන්ධාරය | : | ඉජ්තිහාද්<br>ඉජ්මා හා කියාස් |
| 4. | උපකරණයේ ස්වභාවය | : | අත් පත්‍රිකාව |
| 5. | උපකරණ අරමුණු | : | ඉජ්තිහාද් මඟින් නීති සම්පාදනය කෙරෙන බව දැන ලියා දක්වයි.<br><br>ඉජ්තිහාද් මගින් ලැබූ ද්විතීය මූලාශ්‍ර හඳුනාගෙන නම් කරයි.<br>ඉස්ලාමීය නීතිරීති කාලීනව විස්තීරණය වේ යන ආකල්ප ලැබ කටයුතු කරයි.<br>ඉජ්තිහාද් මගින් ලැබූ නීති ගොනු කරයි. |
| 6. | උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් : | | |
| | ගුරුවරයා සඳහා | : | ක්‍රියාකාරකම ක්‍රියාත්මක වන ආකාරය කෙටියෙන් පහදා දෙන්න.<br>සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.<br>සෑම කණ්ඩායමක්ම ඒ ඒ කණ්ඩායමට දෙන ලද මාතෘකාවට අනුව මඟ පෙන්වන්න.<br>අවශ්‍ය උපකරණ හා තොරතුරු ලබා ගැනීමට යොමු කරන්න.<br>ක්‍රියාකාරකම සඳහා අවශ්‍යවන කාලය සාකච්ඡා කර තීරණය කර ගන්න.<br>අවශ්‍ය අවස්ථාවල ප්‍රතිපෝෂණය ලබා දෙන්න.<br>අදාළ නිර්ණායක අනුව ලකුණු ලබා දෙන්න. |
| | සිසුන් සඳහා | : | ගුරුවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කරන්න.<br>පෙළපොත්වලින් හෝ වෙනත් පොත්පත්වලින් තොරතුරු ලබා ගන්න.<br>ක්‍රියාකාරකම් සඳහා සැලැස්මක් සකස් කර ගන්න.<br>නියමිත වේලාවට ක්‍රියාකාරකම අවසන් කරන්න. |

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම

කණ්ඩායම 1 ඉස්ලාමයේ ඉජ්තිහාද් සම්පාදනයට අවසර ඇත. මෙයට අදාළ අල්කුර්ආනීය හා සුන්නාහි සාක්ෂි ගොනු කර ලියන්න.

කණ්ඩායම 2 ඉස්ලාමයේ ඉජ්තිහාද් බිහි වූ පසුබිම (හේතුව හා වර්ධනය) ගෙන හැර දක්වන්න.

කණ්ඩායම 3 ඉජ්මා නීති මූලාශ්‍රයක් ලෙස පිහිටන අවස්ථා හා ක්‍රම ලියන්න.

කණ්ඩායම 4 කියාස් නීති මූලාශ්‍රයක් වන ආකාරය උදාහරණ සහිතව දක්වන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය | මාතෘකාවට අදාළ බව | ක්‍රමෝපායන්ගේ අදාළත්වය | සංවිධානය හා ඉදිරිපත් කිරීම | අලංකාරය පිළිවෙල හා සැකැස්ම | අර්ථ ගැන්වීම |
|---|---|---|---|---|---|
| | | | | | |

ලකුණු දීමේ පටිපාටිය

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| සාමාන්‍යයි | 02 |
| සංවර්ධනය විය යුතුය | 01 |

Copyright © 2007 National Institute of Education - Sri Lanka. All rights reserved.